දිවියට සවිය

ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම උදෙසා ගෘහස්ථ සුළු කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම

ජීවනෝපාය මාර්ගෝපදේශ සංග්‍රහය

Volume 01 | **කෘෂි හා පශු නිෂ්පාදන**

දිවියට සවිය

ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම උදෙසා ගෘහස්ථ සුළු කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම

ජීවනෝපාය මාර්ගෝපදේශ සංග්‍රහය

ප්‍රකාශනය

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය

ජීවනෝපාය මාර්ගෝපදේශ සංග්‍රහය

දිවියට සවිය - කුමක් සදහාද ?

අයවැය ලේඛනය මගින් වෙන්වන ප්‍රතිපාදන ඵලදායිව උපයෝගී කර ගනිමින් ජනතාවගේ ජීවනෝපාය ශක්තිමත්මත් කිරිම අරමුණු කරගෙන ග්‍රාමීය මට්ටමින් ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මැදිහත් වන පාර්ශවකරුවන්ට සහාය වීමට මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත.

දිවියට සවිය මාර්ගෝපදේශ සංග්‍රහය - කවුරුන් වෙනුවෙන්ද?

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් ඇතුළු දේශපාලන නියෝජිතයින්
- දිස්ත්‍රික් ලේකම්වරුන් ඇතුළු අදාල රාජ්‍ය නිලධාරීන්
- ප්‍රාදේශීය ජීවනෝපාය සම්බණ්ධීකරණ අනු කමිටු සාමාජිකයින්
- ග්‍රාමීය කමිටු සාමාජිකයින්

ග්‍රාමීය ආර්ථිකය නැංවීමේ රජයේ දැක්ම

ජීවනෝපාය සංවර්ධනය තුළින් පවුලේ ආදායම ඉහළ නැංවීම, දරිද්‍රතාවය තුරන් කිරිම, සේවා නියුක්තිය වැඩිකිරිම මගින් විරැකියාව අඩුකිරිම, අපනයන ආදායම් ඉහළ නැංවීම, තුළින් රටේ සමස්ත ආදායම් තත්ත්වය ඉහළ නැංවීම.

ග්‍රාමීය ආර්ථිකය නැංවීමේ රජයේ වැඩපිළිවෙල.

එහිදි ජීවනෝපාය වැඩසටහන් වලට ප්‍රතිපාදන සැලසීම කෙරෙහි විශේෂ අවධානය යොමුකර එම වැඩසටහන් ක්‍රියාත්මක කරන අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සියල්ලේ සාමුහික සම්බනධීකරණයෙන් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වේ.

අයවැයෙන් සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් සංවර්ධන කටයුතු සඳහා මහජන නියෝජිතයන් වෙත වෙන්කර දීමට අවධානය යොමු වී ඇති බවත්, එමගින් යටිතල පහසුකම් ව්‍යාපෘති වලට අමතරව ප්‍රාදේශිය වශයෙන් ඉදිරිපත් වන ජීවනෝපාය ව්‍යාපෘති යෝජනා ශක්තිමත් කිරිමට අවස්ථාව ලබාදීම.

ජීවනෝපාය ව්‍යාපෘති තෝරා ගැනීම

සංවර්ධන කාර්යයේදි ග්‍රාමීය දේශපාලන නායකත්වය සතු ශක්තීන් ද යොදා ගනිමින් කෘෂිකර්ම, අපනයන බෝග, විසිතුරු මල් හා පැළැටි වගා ව්‍යාපෘති, පශු සම්පත්, ධීවර හා ජලජීවී, දේශීය හා විදේශීය සංචාරක ව්‍යාපාරය, පාරම්පරික කර්මාන්ත ඇතුළත් සුළු කර්මාන්ත හා ආර්ථික වශයෙන් ඵලදායි විවිධ සේවාවන් වලට සම්බන්ධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන විසින් පවුලේ ආදායම් තත්ත්වය හා ජීවන තත්ත්වය වැඩිකළ හැකි ආර්ථික වශයෙන් ඵලදායි ශක්‍යතාවයෙන් යුතු ව්‍යාපෘති හඳුනාගත යුතුය.

විශේෂයෙන්ම අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. දැනට ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහනට වඩා ඉදිරියට ගිය නිෂ්පාදනය ඉහළ නංවා වෙළඳපොල ශක්තිමත් කිරීම තුළින් ආර්ථික වර්ධනයට දායක විය හැකි ව්‍යාපෘති වලට ප්‍රමුඛතාවය ලබාදීම.

ව්‍යාපෘති වාර්තා සකස් කිරීම

ජීවනෝපාය සංවර්ධනයට දායක වන අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ හා අනුබද්ධ ආයතන තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාළ ස්ථිර ආදායම් මාර්ගයක් ලබාගත හැකි සාම්ප්‍රදායික මෙන්ම නව ව්‍යාපෘති හඳුනාගෙන ඒ ඒ ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.

ව්‍යාපෘති වාර්තා සැකසීමේ දී ඒ සඳහා සුදුසු ප්‍රදේශ, අමුද්‍රව්‍ය, උපකරණ, මූල්‍ය පහසුකම්, අලෙවි පහසුකම්, ගුණාත්මකභාවය, අවශ්‍ය තාක්ෂණික සහයෝගය, මගපෙන්වීම හා ක්‍රියාත්මක ක්‍රමවේදය ඇතුළත්ව ව්‍යාපෘති වාර්තා සකස් කිරීම හා එම ව්‍යාපෘති වාර්තා හැකි ඉක්මනින් තරුණ කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත යොමු කිරීමට කටයුතු කිරීම. ව්‍යාපෘති යෝජනා සැකසීමට රජයෙන් ලබාදෙන දායකත්වය දිරිගැන්වීමක් ලෙසත්, ඉතිරිය සමෘද්ධි බැංකු ඇතුළුව සහන ණය මුදලකින් ආවරණය කරගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති යෝජනා සැකසීම.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් නොමැති ව්‍යාපෘති යෝජනාවක් ඉදිපත් වුවහොත් අදාල දිස්ත්‍රික්කයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂ වෙත යොමු කර ව්‍යාපෘතිය සඳහා වැයවෙන මූලික ආයෝජනය, අපේක්ෂිත ලාභය වැනි මූලික කරුණු පිළිබඳ අවබෝධය හා නිවැරදි තොරතුරු ලබා ගැනීම කළ හැකිය.

ව්‍යාපෘති වාර්තා ලබා ගැනීමේ දි සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ද සහයෝගය ලබාගැනීම.

ව්‍යාපෘති වල නිෂ්පාදන සඳහා සුදුසු වෙළඳපොළ සම්බන්ධ කිරීම

සුපිරි වෙළඳ සංකීර්ණය ජාලය තුළ ව්‍යවසායකයන්ට ඉඩ ලබා ගැනීමට සාකච්ඡා කිරීමට කටයුතු කිරීම.

මාර්ගගත ක්‍රමයට විකුණුම් ප්‍රවර්ධනයට ප්‍රමුඛතාව ලබාදීම.

තරඟකාරී වෙළඳපොලට ගැලපෙන අයුරින් නිෂ්පාදනවල ගුණාත්මක භාවය ඉහළ නංවාගැනීමට කාර්මික තාක්ෂණ ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පසු අස්වනු තාක්ෂණ ආයතනය වැනි ආයතන වල සේවාව ලබා දීම.

අපනයන වෙළඳපොලට යොමු කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ලබාදීම.

ව්‍යාපෘති සම්බන්ධීකරණය

ජීවනෝපාය සංවර්ධනය සඳහා දායක වන අමාත්‍යාංශ ගණනාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සිටින නිලධාරින් කාර්යක්ෂමව මෙම කාර්යය සඳහා යොදවා ගැනීමටත්, යම් අමාත්‍යාංශයක ව්‍යාපෘති හඳුනාගැනිම හා සම්බන්ධිකරණය සදහා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරියකු නොමැති විට එය කර්මාන්ත නිලධාරි මගින් ඉටුකර ගැනිම හා අදාල රේඛීය අමාත්‍යාංශය හා සම්බන්ධිකරණයෙන් සිදුකර ගැනිම.

ජීවනෝපාය සංවර්ධන ක්‍රියාවලියේදී මතුවෙන ගැටළු විසදා ගැනීම

මූලික ගැටළු ග්‍රාමීය කමිටු මගින් විසඳුම් ලබාදීම.

ග්‍රාමීය කමිටු මගින් විසදුම් සොයා ගැනීමට අපහසු ගැටළු ප්‍රාදේශීය ජීවනෝපාය අනුකමිටු වෙත යොමු කිරීම. එබැවින් ජීවනෝපාය අනුකමිටු සඳහා, ව්‍යාපෘති වලට අදාල ක්ෂේත්‍ර නිලධාරින් සම්බන්ධ කරගැනීම.

ප්‍රාදේශීය ජීවනෝපාය අනුකමිටු වෙත යොමු කර විසඳුම් ලබා ගැනීමට නොහැකි ගැටළු දිස්ත්‍රික් ජීවනෝපාය අනුකමිටුව වෙත යොමු කිරීම.

ප්‍රතිපත්තිමය මැදිහත් වීමක් අවශ්‍ය වන ගැටළු හෝ යෝජනා ජාතික සම්බන්ධීකරණ ජීවනෝපාය අනු කමිටුව වෙත කඩිනමින් යොමු කිරීම.

සමස්ථ වැඩසටහනේ අධීකෂණය සහ පසුවිපරම

ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම, අදාල අමාත්‍යාංශ වල ක්ෂේත්‍ර නිලධාරින් මගින් සිදු කිරිමටත්, ඒවායේ පසුවිපරම අධීක්ෂණ කටයුතු සංවර්ධන සම්බන්ධීකරණ අධීක්ෂණ අමාත්‍යාංශය මගින් සිදුකිරීම.

‘සෞභාග්‍යයේ දැක්ම’

ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්

සෑම පුරවැසියෙකුට ම නිශ්චිත ආර්ථික
ස්ථාවරත්වයක්, දියුණුවීමේ සමාන අවස්ථා සහ
ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අයිතිය
ස්ථාවර කිරීම සඳහා
අපගේ ජනතා කේන්ද්‍රීය ආර්ථික සංකල්පය මත
අප නිබඳවම පෙනී සිටින්නෙමු.
ඒ සඳහා වන කඩිනම් ජීවන වැඩසටහනට
අමතරව අපේ අරමුණ
ධනපතීන්ට වඩා
පොදු ජනතාව නඟා සිටුවීමය.
අප ඒ සඳහා සූදානම් ය.

“දිවියට සවිය” ජීවනෝපාය මාර්ගෝපදේශ සංග්‍රහය

ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීම උදෙසා ප්‍රවර්ධනය කළ හැකි ව්‍යාපාර අදහස් ඒකරාශී කරමින් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සකස් වී ඇත. වෙළුම් ගණනාවක් ඔස්සේ නැවුම් ව්‍යාපාර අදහස් ජනගත කිරීම සඳහා ප්‍රකාශයට පත් වීමට නියමිත ග්‍රන්ථ පෙළක පළමුවැන්න මෙයයි. කාණ්ඩ තුනක් යටතේ පළමු වෙළුම ඔබ අතට පත් වෙන මෙම ග්‍රන්ථයන් පරිශීලනය කළ යුතු වන්නේ මනා අවබෝධයක් සහිතවය.

විවිධ ව්‍යාපාර අදහස් සහ එම අදහස් ව්‍යාපාර අවස්ථා බවට පත් කර ගැනීමේදී යොමු කළ යුතු මූලික කරුණු සංක්ෂිප්තව මෙමගින් දක්වා ඇත. එමගින් අදාල නිෂ්පාදනය සඳහා පවතින වෙළඳපොල, අමුද්‍රව්‍යය, මූලික ආයෝජනය, වියදම් සහ දළ ලාභය පිලිබඳව කරුණු ඇතුලත් වේ. මෙම කරුණු දක්වා ඇති නිෂ්පාදන නිපදවීමට තාක්ෂණික දැනුම ලබා දෙන ආයතන, දැනට එම ව්‍යාපාර ක්ෂේත්‍රවල නිෂ්පාදකයින්ගෙන් ලබා ගත් තොරතුරු ආදිය සැලකිල්ලට ගෙන ගණනය කිරීම සිදු කර ඇත. තවද යම් තත්ත්වයන් පිළිබඳව උපකල්පන කිහිපයක පිහිටා වටිනාකම් නිර්ණය කර තිබේ. බොහෝ ස්ථානවලදී පොදු අගයන් යොදා ගෙන තිබෙන අතර නිෂ්පාදනය කරන ස්ථානය, නිෂ්පාදන ධාරිතාව ව්‍යවසායකයාගේ දැනුම සහ කැපවීම වැනි කරුණු අනුව සාර්ථකභාවය රැඳී පවතී. එමෙන්ම කලානුරූපව මෙම අගයන් සංශෝධනය විය යුතුය.

මෙම ග්‍රන්ථ මාලාව ග්‍රාමීය ව්‍යාපාරයක් හෝ ව්‍යාපාර සමූහයක් ආරම්භ කිරීමේදී එවායේ මූලික වියදම ගැන අවබෝධයක් ලබා ගැනීමට ඉවහල් වනු ඇත. මෙහි අඩංගු යම් කරුණක් පිළිබඳව යම් පැහදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පුරා විහිදුණු තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන නිළධාරීන් වෙතින් විමසීමට හැකිය.

මෙම ග්‍රන්ථ මාලාව සකස් කිරීමේදී නන් අයුරින් සහාය වූ මගපෙන්වීම් සිදු කළ සියලුම දෙනාට කෘතවේදීත්වය පිරි නමමු.

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

දුරකථන- 011-266 9240, 011-266 9234, 011-266 9236

වෙබ් අඩවිය- www.sed.gov.lk

විද්‍යුත් ලිපිනය- sed.gov.lk@gmail.com

මුහුණුපොත් පිටුව- www.facebook.com/SEDbureau

මාර්ගස්ථ පුහුණු කිරීම- sed.chords.org.lk

පෙළගැස්ම

		පිටු
01.	වැනිලා වගාව	13
02.	කිරිගව පාලනය	16
03.	පිච්ච මල් වගාව	19
04.	නයි මිරිස් වගාව	22
05.	එළු පාලනය	25
06.	මිරිදිය මත්ස්‍ය වගාව (තිලාපියා)	28
07.	වාණිජ බුලත් වගාව	31
08.	ඇපල් පේර වගාව	34
09.	මස් සඳහා ඌරන් ඇති කිරීම	36
10.	ස්ට්‍රෝබෙරි වගා ව්‍යාපෘතිය	39
11.	බීජ බෝංචි නිශ්පාදනය	42
12.	ඇම්බුන් කෙසෙල් වගාව	45
13.	වියලි කහ නිෂ්පාදනය	48
14.	කාබනික දියර පොහොර නිෂ්පාදනය	51
15.	බද්ධ පලතුරු පැළ නිෂ්පාදනය	54
16.	මුං ආශ්‍රිත නිෂ්පාදන	56
17.	තේ පැළ තවාන් පාලනය	59
18.	විසිතුරු මත්ස්‍ය වගාව	62
19.	කාබනික පොහොර නිෂ්පාදනය	64
20.	හරිතාගාර තුළ තක්කාලි වගාව	66
21.	ඇන්තූරියම් පැල වගාව	68
22.	බ්‍රොකොලි වගා කිරීමේ ව්‍යාපෘතිය	70
23.	දේශීය වැල් වගාව (රාජ අල වගාව)	72
24.	මඤ්ඤොක්කා වගාව	74
25.	ජලජ පැලෑටි	77
26.	හරිතාගාර තුළ ජැපනීස් කියුකම්බර් වගාව	79
27.	චයිනීස් එළවළු වගාව	82
28.	බෝගන්විලා වගාව	85
29.	බඩ ඉරිඟු වගාව	88
30.	උක් වගාව	91
31.	කුරක්කන් වගාව	93
32.	වැල් දොඩම් වගාව	96
33.	කෝමාරිකා වගාව	98
34.	සුරතල් මසුන් සඳහා අවශ්‍ය ජීවී නොවන ආහාර නිෂ්පාදනය	101
35.	අන්නාසි වගාව	103
36.	මුං වගාව හා මුං බීජ නිෂ්පාදනය	106
37.	ඇස්ට්‍රමේරියා කැපූ මල් වගාව	109
38.	තුඹ කරවිල වගාව	111
39.	ගම්මිරිස් වගාව	114
40.	අර්තාපල් වගාව	117
41.	සහාය සපයන ආයතන	121

වැනිලා වගාව

1. හැඳින්වීම

කුළුබඩු ලොවේ රජ කුමරිය ලෙස නම් ලද වැනිලා, ඕකිඩ් කුලයට අයත් වේ. ස්වාභාවික වැනිලින් ලබාගැනීමේ ප්‍රභවය වන වැනිලා ආර්ථික වශයෙන් වැදගත් බෝගයකි. වැනිලා නිස්සාරණයේ බොහෝ සංයෝග තිබුණ ද වැනිලා වල ලාක්ෂණික රසය හා සුවඳ ලබාදෙන්නේ වැනිලින් මගිනි. එය රස කැවිලි කර්මාන්තය, සුවඳ විලවුන් හා ඖෂධ කර්මාන්තයේ දී රසකාරකයක් ලෙස භාවිතා කරයි. මහනුවර, නුවරඑළිය, මාතලේ සහ කෑගල්ල දිස්ත්‍රික්කයන් හි ප්‍රධාන වශයෙන් වගා කෙරේ. මෙය පළිබෝධ සහ රෝග අවම මට්ටමක පවතින බෝගයකි. වැනිලා කර්මාන්තයෙන් ඉහළ ආදායමක් ලබා ගැනීමට නම් යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් අනුගමනය කළ යුතුය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- රෝපණ ද්‍රව්‍ය ලෙස අඩි 3ක් පමණ දිග වැනිලා වැල් කැබලි
- ආධාරක (ගිනිසීරියා)
- පොල් ලෙලි
- නයිට්‍රජන් බහුල කොළ පොහොර හෝ කොම්පෝස්ට් පොහොර

3. වෙළඳපොල

ලෝකයේ මිල අධිකම බෝගයක් වන වැනිලා වල වාර්ෂික නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 5000ක් පමණ වේ. නමුත් වර්තමාන වාර්ෂික දේශීය වැනිලා අපනයනය මෙට්‍රික්ටොන් 2ක් පමණි. මේ අනුව විදේශිය වෙළඳපොල සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. දේශීය වෙළෙඳපොලේ අමු වැනිලා කිලෝ 1ක් රු. 5,000.00 - රු. 8,000.00ත් අතර මිලකට අලෙවි වේ. කෘත්‍රිම වැනිලා වලට ඇති ඉල්ලුම දිනෙන් දින අඩුවෙන නිසා ස්වාභාවික වැනිලා වලට ඇති ඉල්ලුම ඉහළ යනු ඇත.

4. ආයෝජනය

පර්චස් 40ක භූමි ප්‍රමාණයක වැනිලා වැල් කැබලි 170ක වගාවක් සඳහා ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල.

(මෙහිදී ව්‍යවසායකයා යොදා ගන්නා භූමිය හා බිම් සැකසීමට යොදා ගන්නා ක්‍රමවේදය අනුව වැය වන වියදම වෙනස් විය හැකිය.) මෙම මුදල ආයෝජනයෙන් අඛණ්ඩව වසර 15ක පමණ කාලයක් අස්වැන්න ලබා ගත හැකිය.

ස්ථාවර ප්‍රාග්ධන වියදම	- රු. 33,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය	- රු. 144,000.00
මුළු එකතුව	- **රු. 177,000.00**

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර පර්චස් 40ක වගා බිම්කඩ සඳහා වන ඉඩමේ වටිනාකම අන්තර්ගත කර නැත.

අංකය	විස්තරය	වටිනාකම (රු.)
01	වැනිලා වැල් කැබලි හා ආධාරක සඳහා වියදම (පැළ 170ක්)	12,000.00
02	කාණු දැමීම හා වලවල් කැපීම (ශ්‍රමය සඳහා)	5,000.00
04	ආධාරක හා පැළ සිටුවීම (ශ්‍රමය සඳහා)	6,000.00
05	පොහොර යෙදීමට (ශ්‍රමය සඳහා)	3,000.00
06	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ (උදළු, මුල්ලු, මල්බාල්දිය ඇතුළුව)	7,000.00
	එකතුව	33,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

අංකය	විස්තරය	වසර 3ක් සඳහා වියදම (රු.)
01	ශ්‍රමය	90,000.00
02	පොල්ලෙලි හා කාබනික පොහොර	37,500.00
03	ගෙන එමේ කුළී	7,500.00
04	වෙනත්	9,000.00
	එකතුව	144,000.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම වගාව ආරම්භ කර පළමු අස්වැන්න ලබා ගැනීමට වසර 03ක කාලයක් ගත වන අතර ඉන් පසු වාර්ෂිකව අස්වැන්න ලැබේ.

වසර 3 අවසන් වන විට මෙම වගාවේ පැල 10ක් හානි වන බව උපකල්පනය කර ඇත.

ආරම්භ කර වසර 03 කින් පළමු අස්වැන්න ලෙස එක් වැනිලා වැලකින් අවම වශයෙන් කිලෝ 01ක අස්වැන්නක් ලැබේ යැයි සලකා ඇත. නමුත් නඩත්තු කටයුතු සිදුකරන ආකාරය අනුව උපරිමය කිලෝ 4ක් වුවද ලබාගත හැකිය.

මෙම වගාව නඩත්තු කිරීම සඳහා වාර්ෂිකව දින 50ක පමණ කාලයක් ප්‍රමාණවත් වේ.

මූලික ස්ථාවර කාරක ප්‍රාග්ධන පිරිවැය වසර 3කින් ආවරණය කරගනු ලැබේ.
ඒ අනුව තෙවන වසරේ සිට ශුද්ධ ලාභය,

වසරක විකුණුම් ආදායම	= වැල් 160 x කි.ග්‍රෑ. 01 x රු. 5,000.00
	= රු. 800,000.00
වාර්ෂික මුළු පිරිවැය	= සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමු ද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත් වියදම්

වාර්ෂික සෘජු පිරිවැය = රු. 12,500.00 + රු. 30,000.00 + රු. 5,500.00
= රු. 48,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දරනු ලබන අනෙකුත් වියදම් වේ. (ජලය, ප්‍රවාහනය, අලෙවි වියදම් හා ක්ෂය වියදම් ආදී) එය වර්ෂයක් සඳහා රු. 5,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

වාර්ෂික ශුද්ධ ලාභය	= වාර්ෂික විකුණුම් ආදායම - වාර්ෂික මුළු පිරිවැය
	= රු. 800,000.00 - (රු. 48,000.00 + රු. 5,000.00)
	= රු. 747,000.00
මාසික ශුද්ධ ලාභය	= වාර්ෂික ශුද්ධ ලාභය මාස 12
	= රු. 62,000.00

ව්‍යාපාරිකයා විසින්ම වගා කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට ශ්‍රම වැටුප ලෙස රු. 30,000.00ක මුදලක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 62,000.00ක මුදලක් උපයා ගත හැකිය.

වෙනත්

පළමු වසර 3 දී මෙම වගාවෙන් ආදායම් ඉපැයීමට නොහැකි නිසා වැනිලා වගාවත් සමඟ යටි වගාවක් ලෙස නයි මිරිස්, ඉඟුරු, කහ වැනි අතිරේක භෝගයක් වගා කිරීම මගින් සාර්ථක අස්වැන්නක් ලබා ගනිමින් පළමු වසරේ සිටම ආදායම් උත්පාදනය කර ගත හැකිය.

කිරිගව පාලනය

1. හැඳින්වීම

සතුන් ඇති කිරීම මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට දක්නට ලැබුණි. අතීතයේ සියලුම කෘෂිකාර්මික කටයුතු සඳහා කුඹුරු සෑම, මඩකිරීම, සී සෑම, කොළ මැඩවීම හා ප්‍රවාහන යන සියලුම කාර්යයන් සඳහා පිරිමි ගවයන් යොදා ගත් අතර, කිරි දෙනුන් තම නිවෙස්වල් කිරි පරිභෝජන අවශ්‍යතාවය ඉටු කර ගැනීම සඳහා පමණක් යොදා ගන්නා ලදි. එහෙත් මෑත අතීතයේ දී කෘෂිකර්මාන්තය යාන්ත්‍රික වීමත් සමග මෙම ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම පාහේ වෙනස් මගක් ගන්නා ලදී. වර්තමානයේ සතුන් ඇති කිරීම වාණිජ මුහුණුවරක් ගත් අතර එය කිරිගව පාලනය ලෙස හඳුන්වයි. ග්‍රාමීය පරිසරය තුළ සිටි බටු හරක් වෙනුවට ඉතා උසස් තත්ත්වයේ ප්‍රීෂියන්, ජර්සි, සහිවාල් ආදී කිරිදෙනුන් සඳහා ඉතා පහසුකම් සහිත ගව ගාල් ඉදිකර, සයිලේජ් කෘතිම ආහාර වර්ග හා CO3, CO4 වැනි උසස් වර්ගයේ තෘණ වර්ගයන් වගා කර එම ආහාර වර්ග ලබා දී ඉතාමත් ලාභදායි ව්‍යාපාරයක් ලෙස කිරිගව පාලනය සිදුකරයි. අක්කර භාගයක් පමණ ඉඩමක් තුල තෘණ වගාව ද සමග මෙම ව්‍යාපාරය සිදුකළ හැකි අතර, පර්චස් 20 කට වැඩි ඉඩ ප්‍රමාණයක සයිලේජ්, පිටතින් තණකොළ මිලට ගෙන ලබා දීම තුළින් ද සිදුකළ හැකි ඉතා හොඳ ව්‍යාපාරික අවස්ථාවකි.

2 .අවශ්‍ය අමුද්‍රව්‍ය

CO3, CO4 තෘණ වර්ග, සයිලේජ්, කැල්සියම්, කැට කෑම, පණුපෙති, මැක්කන් හා කිණිතුල්ලන් සඳහා අවශ්‍ය ඖෂධ.
මෙම අමුද්‍රව්‍ය අතර තෘණ හා සයිලේජ් ව්‍යවසායකයාටම සකස් කර ගත හැකිය.

3. වෙළඳපොළ

වෙළඳපොළ තුළ කිසිදු ගැටළුවකින් තොරව අලෙවි කර ගත හැකි නිෂ්පාදනයක් ලෙස එළකිරි හා මී කිරි දැක්විය හැකිය. අමු කිරි පරිභෝජනය කරන පාරිභෝගිකයන් උදෙසා එළකිරි නිවෙස්වලට ගෙන ගොස් ලබා දිය හැකි අතර, හෙළ බොජුන් හා එළකිරි අලෙවිසැල් සඳහා ලබා දීමට හැකියාවක් ඇත. එමෙන්ම කිරි ආශ්‍රිත නිෂ්පාදනයන් වන කිරි මුදවීම, කිරි ටොපි නිෂ්පාදනය, යෝගට් නිෂ්පාදනය, පානීය යෝගට්, කල් කිරි ආදි නිෂ්පාදනයන් සිදු කරන කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කරන ව්‍යාපාරික ආයතන ද විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාව පුරා විසිරී ඇත. එමෙන්ම Rich Life , Milko , Nestle වැනි ව්‍යාපාරික ආයතන ඉතාමත් තරගකාරී ලෙස අමු කිරි නිෂ්පාදනය කරනු ලබයි. මෙවැනි ආයතන ග්‍රාමීය මට්ටම දක්වා ව්‍යාප්ත කර ඇති කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන හරහා මිල දී ගන්නා බැවින් කිරි අලෙවි කිරීමේ දී විශාල පිරිවැයක්ද දැරීමට සිදු නොවේ. මෙතෙක් ශ්‍රී ලංකාව තුළ ඇති එළකිරි අවශ්‍යතාවය සම්පූර්ණ වී නොමැති බැවින් ඉහල වෙළඳපොලක් පවතින ව්‍යාපාරයක් ලෙස දැක්විය හැකිය.

4. ආයෝජනය

දිනකට කිරි ලීටර් 12ක් ලබා ගත හැකි දෙමුහුන් වර්ගයේ කිරි දෙනුන් තිදෙනෙකුගෙන් යුත් ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 582,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 35,232.00
	මුළු එකතුව	- **රු. 617,232.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

තණකොළ වගා කිරීමට හා ගවගාල ඉදි කිරීමට අක්කර භාගයක් පමණ ඉඩම් ප්‍රමාණයක් අවශ්‍ය වුවත් ඉඩමෙහි වටිනාකම ස්ථාවර ප්‍රාග්ධන පිරිවැයට ඇතුලත් කර නොමැත. ගාවගාල ඉදි කිරීම අවශ්‍ය බැවින් ඒ සඳහා අවශ්‍ය මුදල ඇතුලත්ව ගණනය කිරීම් සිදුකර ඇත.

අනු අංකය	විස්තරය	ඒකක ගණන	වටිනාකම (රුපියල්)
01	කිරි දෙනුන්	03	450,000.00
02	ගවගාල ඉදි කිරීම	01	90,000.00
03	ජල සම්පාදනය	01	8,000.00
04	වතුර මෝටරය	01	18,000.00
05	අනෙකුත් උපකරණ (උදැල්ල, සවල්, විල්බැරෝ, ඉදල්,කිරි ලබා ගන්නා භාජන)	-	16,000.00
	එකතුව		**582,000.00**

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

කිරි දෙනුන් 03 දෙනෙකු නඩත්තු කිරීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය ගණනය කර ඇත.

අනු අංකය	විස්තරය	මාසයක වියදම (රු.)
01	අමු ද්‍රව්‍ය (කැට කෑම ,කැල්සියම් ,පණුපෙති, මැක්කන් හා කිණිතුල්ලන් සඳහා අවශ්‍ය ඖෂධ)	12,232.00
02	ශ්‍රම වියදම	22,500.00
03	වෙනත්	500.00
	එකතුව	**35,232.00**

5 . ශුද්ධ ලාභය

දිනකට කිරි ලීටර් 12 ක් ලබා ගත හැකි දෙමුහුන් වර්ගයේ කිරි දෙනුන් 03 දෙනෙකුගෙන් දිනකට කිරි ලීටර් 36ක් ලබා ගැනීමටත් එක් කිරි ලීටරයක අලෙවි මිල රු. 75.00ක් ලෙසත්, ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව,

මාසික විකුණුම් ආදායම (දින 30 × දිනක නිෂ්පාදන කිරි ලීටර් 36 × රු. 75.00) = රු. 81,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත් වියදම්

දිනක සෘජු පිරිවැය = රු. 12,232.00 + රු. 22,500.00 + රු. 500.00

= රු. 35,232.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සදහා දරණ වියදම් වේ. (ජලය/විදුලිය/ප්‍රවාහන/අලෙවි/ක්ෂය කිරීම්/දෙනුන් රක්ෂණය කිරීමේ ගාස්තු ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 18,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු. 81,000.00 - (රු. 35,232.00 + රු. 18,000.00)
	= රු. 81,000.00 - රු. 53,232.00
	= රු. 27,768.00

ව්‍යාපාරිකයා විසින්ම මෙම ව්‍යාපාර කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට රු. 22,500.00ක ශ්‍රම වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 27,768.00 ක මුදලක් උපයා ගත හැකිය.

පිච්ච මල් වගාව

1. හැඳින්වීම

මල් වගාව අතීතයේ සිදු වුයේ නිවෙස්වල ගෙමිදුල අලංකරණය කිරීම හා බුද්ධ වන්දනාව යන කාර්යයන් සඳහා පමණි. බෞද්ධ සිද්ධස්ථාන ආශ්‍රිතව අතීතයේ මල් ලෙස අලෙවි කරනු ලැබුවේ නෙළුම්, මානෙල්, ඕලු ආදියයි. මෑත කාලයේ දී බෞද්ධාගමිකව ඇතිවී ඇති ප්‍රබෝධයත් සමග විශාල මට්ටමින් මුදල් වැය කොට සිදු කරනු ලබන පිංකම් සඳහා මෙම මල්වලට අමතරව පිච්ච මල්පූජාව ඉතා ජනප්‍රිය පූජාවක් බවට පත්ව ඇත. මේ වන විටත් ලංකාවට අවශ්‍ය පිච්ච මල් සැපයීම සිදුවන්නේ ඉන්දියාවෙනි. උතුරු පළාතෙහි පසෙහි තත්ත්වය හා දේශගුණික තත්ත්වය පිච්ච මල් වගාව සඳහා විශේෂත්වයක් දක්වයි. මේ නිසා ග්‍රාමීය මට්ටමේ කෘෂිකර්මාන්තය සමග පිච්ච මල් වගාව ද සාර්ථකව සිදු කළ හැකි අතර, වසර 5-6ක් වැනි කාලයක් ආදායම් ලබා ගත හැකි වගාවක් ලෙස ද දැක්විය හැකිය.

2 .අවශ්‍ය අමුද්‍රව්‍ය

පිච්ච පැල, කාබනික පොහොර, මල් පිපීමට අවශ්‍ය හෝමෝන, ජලය

3. වෙළඳපොළ

ශ්‍රී මහා බෝධිය, රුවන් වැලි මහ සෑය, සෝමාවති මහා සෑය, කැළණිය සිද්ධස්ථානය, දළදා මාලිගාව ආදී සුවිශේෂී බෞද්ධ සිද්ධස්ථාන ආශ්‍රිතව දෛනිකව විශාල ඉල්ලුමක් පවතී. මේ වන විට ශ්‍රී ලංකාවෙහි පිච්ච මල් අවශ්‍යතාවය සපුරාලීම ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන පිච්ච මල් වලින් සිදු වේ. එමෙන්ම හින්දු ආගම හා හින්දු සංස්කෘතිය පදනම් කරගෙන දමිළ ජනතාව තුළ පිච්ච මල් සඳහා අධික ඉල්ලුමක් පවතී. හින්දු දේවස්ථානයන්හි පූජාවන්ට හා හින්දු මංගල හා අවමංගල උත්සවයන්ට විශාල වශයෙන් පිච්ච මල් භාවිතා කරනු ලබන නිසා පිච්ච මල් සඳහා වෙළඳපොල පිළිබඳ ගැටලුවක් මතු නොවේ.

4. ආයෝජනය

දිනකට පිච්ච මල් කිලෝ ග්‍රෑම් 1 1/2ක නිෂ්පාදන ප්‍රමාණයන් ලබා ගැනීමට හැකි වන ආකාරයේ ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 193,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 6,500.00
	මුළු එකතුව	- **රු. 200,000.00**

මෙම ව්‍යාපාරයෙහි ඉඩම හා ළිඳ යන වත්කම් ගණනය නොකර (ඉඩම හා ළිඳ ව්‍යාපාරය ආරම්භ කරනු ලබන ව්‍යාපාරිකයා සතුව පවතින වත්කම් යැයි උපකල්පනය කරන ඇත.) ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා ස්ථාවර පිරිවැය ලෙස රු. 193,500.00 ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ.

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

පර්චස් 60ක පමණ ඉඩම් ප්‍රමාණයක් පිච්ච මල් වගාව සඳහා අවශ්‍ය වුවද ඉඩමෙහි වටිනාකම ස්ථාවර වත්කම් වලට ඇතුලත් කර නොමැති අතර, ඉඩම සැකසීම සඳහා අවශ්‍ය මුදල පමණක් ඇතුලත් කර ඇත.

අනු අංකය	යන්ත්‍ර හා උපකරණ	ඒකක ගණන	ඒකක මිල (රුපියල්)	වටිනාකම (රුපියල්)
01	පිච්ච මල් පැළ	600	150.00	90,000.00
02	වතුර මෝටර්	01	25,000.00	25,000.00
03	ජල නල පද්ධති	01	-	45,000.00
04	වෙනත් උපකරණ			
	(උදලු, විල් බැරෝ ආදිය...)	-	-	9,500.00
05	ඉඩම සැකසීම	-	-	24,000.00
	එකතුව			193,500.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

මාසයක කාලයක් සඳහා පිච්ච මල් වගාවට අවශ්‍ය කාරක ප්‍රාග්ධනය ගණනය කර ඇත.

අනු අංකය	විස්තරය	වියදම (රුපියල්)
01	අමුද්‍රව්‍ය (පොහොර, හෝර්මෝන, දිලීර නාශක)	6,500.00
02	ශ්‍රම වියදම	15,000.00
03	වෙනත් වියදම්	7,500.00
	එකතුව	29,000.00

පිච්ච මල් වගාවෙහි දෛනිකව පැය 04ක පමණ කාලයක් ශ්‍රමය වැය කිරීමට සිදු වන බැවින් දිනකට රු.500.00ක් ශ්‍රම වියදම ලෙස ගණනය කර ඇත.

5. ශුද්ධ ලාභය

පිච්ච මල්පැල සිටුවා මාස 06කට පසුව මල් පිපීම ආරම්භ වන අතර, පර්චස් 60ක ඉඩම් ප්‍රමාණයක වගා කිරීම තුළින් දිනකට මල් කිලෝ ග්‍රෑම් 1 1/2ක ප්‍රමාණයක් අස්වනු ලෙස ලබා ගත හැකිය. පිච්ච මල් කිලෝ ග්‍රෑම් 1ක අලෙවි මිල රු. 1,500.00 කි. ඒ අනුව,

මාසික විකුණුම් ආදායම කිලෝ ග්‍රෑම් 45 × රු. 1,500.00 = රු. 67,500.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත් වියදම්

මාසික සෘජු පිරිවැය = රු. 6,500.00 + රු. 15,000.00 + රු. 7,500.00

= රු. 29,000.00

වක්‍ර පිරිවැය

මේ යටතේ සඳහන් කර ඇත්තේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දැරිය යුතු වියදම් වේ. (ජලය/විදුලිය/ප්‍රවාහන/අලෙවි/ක්ෂය කිරීම් ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 10,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 67,500.00 - (රු. 29,000.00 + රු. 10,000.00)
= රු. 67,500.00 - රු. 39,000.00
= රු. 28,500.00

ව්‍යාපාරිකයා විසින්ම පිච්ච මල් වගාවට අදාළ කටයුතුවල නියැලේ නම් ඔහුට මසකට රු. 15,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය වශයෙන් රු. 28,500.00ක් උපයා ගත හැකිය.

නයි මිරිස් වගාව

1. හැඳින්වීම

වියළි හා අමු මිරිස් ලෙස සාමාන්‍යයෙන් අප පරිභෝජනය කර නයි මිරිස් කැප්සිකම්ඇනම් (Capsicum annuum) විශේෂයට අයත් වන අතර කොච්චි, නයි මිරිස්, හෝ මිරිස් හා කැවුම් මිරිස් ලෙස හඳුන්වයි. මෙම විශේෂයන්හි පවතින විශේෂත්වය වන්නේ කරල් ඉතා සැර භාවයකින් යුක්ත වීමත්, ඒවාටම ආවේණික වූ සුවඳක් තිබීමත් වේ. ලෝකයේ පවතින සැර අධිකම මිරිස් ලෙස මෙම නයි මිරිස් (Capsicumchinense) දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ තෙත් කලාපය හා අතර මැදි කලාපයේ ගෙවතු ආශ්‍රිතව හමුවේ. මෙම නයි මිරිස් කරලේ ප්‍රමාණය (දිග, පළල), හැඩය, වර්ණය, කරලේ පිහිටීම සැර භාවය හා සුවඳින් මෙන්ම ශාකයේ ස්වරූපයෙන් ද මේවා එකිනෙකට වෙනස් ලක්ෂණ පෙන්වයි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- නයි මිරිස් පැළ
- නිල් කැට, දම් කැට,ඇල්බට් සොලියුෂන්
- වගා මාධ්‍ය පිරවුම් බෑග්
- නයිට්‍රජන් බහුල කොළ පොහොර හෝ කොම්පෝස්ට් පොහොර

3. වෙළඳපොල

වර්තමානය වන විට නයි මිරිස් සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොලෙහි ඉහළ ඉල්ලුමක් පවතින අතර හෝටල් ක්ෂේත්‍රයේ ආහාර රසවත් කිරීම සඳහා යොදා ගනී. එසේම ඇතැම් සෝස් වර්ග සෑදිම සඳහා නයි මිරිස් බහුලව භාවිතා වන බැවින් අපනයනය සඳහා විදේශ වෙළෙඳපොල ද විවෘත ව ඇත. මෙහිදි Scotch bonnet නයි මිරිස් වර්ගය සඳහා අපනයන වෙළඳපොල තුළ වැඩි ඉල්ලුමක් ඇත.

4. ආයෝජනය

අඩි 20 × 10 ක හරිතාගාරයක පැල 75ක වගාවක් සඳහා ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල.

ස්ථාවර ප්‍රාග්ධන වියදම	- රු. 145,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය	- රු. 15,000.00
මුළු එකතුව	- **රු. 160,000.00**

මෙම මුදල ආයෝජනයෙන් අඛණ්ඩව වසර 02ක පමණ කාලයක් අස්වැන්න ලබා ගත හැකිය.

නයි මිරිස් වගාව හරිතාගාර තුළ මෙන්ම එළිමහන් වගාවක් ලෙස ද සිදු කළ හැකි අතර හරිතාගාර තුළ සිදු කිරීමෙන් වැඩි ඵලදාවක් ලබා ගත හැකිය.

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර අඩි 20 × 10ක හරිතාගාරය සඳහා වන ඉඩමේ වටිනාකම අන්තර්ගත කර නැත.

අංකය	විස්තරය	වටිනාකම (රු.)
01	අඩි 20 × 10 හරිතාගාරය සඳහා	95,000.00
02	ජල නළ පද්ධතිය සඳහා	25,000.00
03	1kgක බැගින් වූ මාධ්‍ය පිරවුම් පැක් (Grow Bag)	10,000.00
04	පැළ සිටුවීම හා පොහොර යෙදීම (ශ්‍රමය සඳහා)	5,000.00
05	නයි මිරිස් පැළ 75 ක් සඳහා	1,250.00
06	වගා මළු සඳහා (ඉටි බෑග්)	2,750.00
07	උපකරණ (මුල්ලු,මල් බාල්දිය, තෙල් ඉසිනය ආදිය)	6,000.00
	එකතුව	145,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

අංකය	විස්තරය	මාස 21/2 ක් සඳහා වියදම (රු.)
01	නිල් කැට, දම් කැට, ඇල්බට් සොලියුෂන් යන පොහොර	2,000.00
02	ගෙන ඒමේ කුලී	2,000.00
03	නඩත්තුව සඳහා ශ්‍රමය	10,000.00
04	වෙනත්	1,000.00
	එකතුව	15,000.00

5. මාසික ශුද්ධ ලාභය

- නයි මිරිස් කි.ග්‍රෑ 1ක විකුණුම් මිල රු. 700.00කි.
- මෙම වගාව ආරම්භ කර පළමු අස්වැන්න ලබා ගැනීමට මාස 2 1/2ක කාලයක් ගත වන අතර ඉන් පසු සතියෙන් සතිය අස්වැන්න ලබා ගත හැක.
- ආරම්භ කර මාස 2 1/2කින් පසු පළමු අස්වැන්න ලෙස එක නයි මිරිස් පැළයකින් අවම ග්‍රෑ. 250ක් ද උපරිම ග්‍රෑ. 350ක්ද වන අස්වැන්නක් ලැබේ යැයි සලකා ඇත.
- මෙම වගාව නඩත්තු කිරීම සඳහා දින 2කට වරක් ජලය දැමීම ප්‍රමාණවත් වේ.
- පැළ 5ක් විනාශ වන බව උපකල්පනය කර ඇත.
- මාස 2 1/2ට කාරක ප්‍රාග්ධනය රු. 15,000.00 යි. එම නිසා මාසයකට රු. 6000.00

ඒ අනුව තෙවන මාසයේ සිට ශුද්ධ ලාභය,

මාසික විකුණුම් ආදායම = 70 × 70 කි.ග්‍රෑ. 0.275 × රු. 700.00 × සති 04
= රු. 53,900.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් +සෘජු වෙනත් වියදම්

මාසික සෘජු පිරිවැය = රු.8,00.00 + රු.4,000.00 + රු.1200.00
= රු.6,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරනු ලබන වෙනත් වියදම් වේ. (ජලය, ප්‍රවාහනය, අලෙවි වියදම් සහ වෙනත් වියදම් ආදිය) එය මාසයක් සඳහා රු. 4,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	=	මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	=	රු. 53,900.00 - (රු. 6,000.00 + රු. 4000.00)
	=	රු. 43,900.00

ව්‍යාපාරිකයා විසින්ම වගා කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට ශ්‍රම වැටුප ලෙස රු. 10,000.00ක් හා ශුද්ධ ලාභය ලෙස රු. 43,900.00 ක මුදලක් උපයා ගත හැකිය.

වෙනත්

මෙම නයි මිරිස් වගාව හරිතාගාරයක් නොමැතිව එළිමහන් භූමියක වුව ද වගා කළ හැකි ය. නමුත් වඩාත් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීම සඳහා හරිතාගාරයක් තුළ වගා කිරීම ඉතා සුදුසු වේ.

එළු පාලනය

1. හැඳින්වීම

සත්ව ආහාර පරිභෝජනය මිනිසා තුල ගල් යුගයේ සිට දක්නට ලැබුණු දෙයකි. අතීතයේ මිනිසුන් මස් පරිභෝජනය සතුන් දඩයම් කිරීම තුලින් සිදු කර ගන්නා ලද බැවින්, එම මස් දඩමස් ලෙස හඳුන්වන ලදි. අද කාලයේ වුවද මිනිසා වෙතින් එම කාර්යය ගිලිහී ගොස් නැත. වර්තමානයේ ද දඩමස් සඳහා ඉහළ ඉල්ලුමක් හා ඉහළ මිලක් පවතී. වනාන්තර එළිපෙහෙළි වීම සහ මිනිසා සංස්කෘතිකමය හා ආකල්පමය වශයෙන් වෙනස් වීම තුළ සෑම පුද්ගලයෙක්ම සතුන් මැරීම සිදු නොකරයි. එය ඉතාම පාපකාරී සිද්ධියක් ලෙස සලකන අතර පරිභෝජනය සඳහා අවශ්‍ය මස් වෙළඳසැල් වලින් මිල දී ගැනීමට පෙලඹී ඇත. ඒ අනුව එළු මස් අධික පෝෂණ ගුණයෙන් යුක්ත මස් වර්ගයක් ලෙස සලකන අතර, අධික මිලකින් ද යුක්ත වේ. එළු පාලනය, කිරිගව පාලනය තරම් සංකීර්ණ නොවන අතර අමු ද්‍රව්‍ය සඳහා මිලක් වැය නොකොට නිදැල්ලේ හැර (ඉඩකඩ පවතින ග්‍රාමීය ප්‍රදේශවල) හෝ එළු ගාල තුළ රඳවා අවටින් ලබා ගන්නා කොල අතු ආහාර වශයෙන් ලබා දීම තුලින් ව්‍යාපාරය පවත්වාගෙන යාමේ හැකියාව ඇත. ඒ අනුව ජීවනෝපාය මට්ටමින් ආරම්භ කල හැකි සාර්ථක ව්‍යාපාරයක් ලෙස සැලකිය හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

අවට පරිසරයෙන් ලබා ගන්නා කොළ අතු/ ජලය

3. වෙළඳපොළ

එළු පාලනයේ නියැලි ව්‍යවසායකයින්ගෙන් බහුතරයක් මස් ලෙස අලෙවි නොකරන අතර ජීව බරට සතුන් අලෙවි කරයි. මස් වෙළඳසැල් හිමියන් හෝ සතුන් ජීව බරට මිලදී ගෙන සතුන් මස් බවට පත් කරන වෙනම පිරිසක් සිටී. ඔවුන් මෙම සතුන් ජීව බරට මිලදී ගනු ලබයි. කෙසේ වෙතත් සාමාන්‍යයෙන් ප්‍රධාන ආහාර වේල් වලට පරිභෝජනයට ගන්නා අතර උත්සව අවස්ථාවන් හි දි බයිට් වර්ග ලෙස හා පුද්ගලයන් කිහිප දෙනෙකු හෝ පිරිසක් එක්ව පවත්වන කුඩා සාදයන් හි දී ද බයිට් ලෙස භාවිතා කරයි. කුකුල් මස් මෙන් සමස්ත සමාජයම පරිභෝජනය නොකලද මේ සඳහා කැමැත්ත දක්වන විශාල පිරිසක් සමාජය තුළ සිටින බැවින් වෙලඳපොල පිලිබඳ ගැටළුවක් මතු නොවේ. විශේෂයෙන්ම ක්‍රිස්තියානි ආගම අදහන ජනතාව තුල විශේෂ ඉල්ලුමක් පවති. විශේෂයෙන් දමිළ ජනතාවගේ මංගල උත්සවයන්හි දී දෙවන දිනයේ පමණක් මස් වර්ග භාවිතා කරන අතර, එළු මස් එදිනට යොදා ගන්නා විශේෂිත මස් වර්ගයකි. ඒ අතරම ඔවුන්ගේ අනෙකුත් උපන්දින සංවත්සර නිවෙස් පදිංචි වීම ආදිය උත්සවාකාරයෙන් සිදු කරන බැවින, එවැනි අවස්ථාවලදි පරිභෝජනයට ගන්නා විශේෂිත මස් වර්ගයකි. මෙවැනි උත්සව වලට අමතරව සාමාන්‍ය දිනවලදී ද පරිභෝජනයට ගනි.

4. ආයෝජනය

මව් සතුන් 15 දෙනෙකුගෙන් වසරකට දෙවතාවක් පැටවුන් ලබා ගන්නා ආකාරයේ ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කල යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 444,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 8,250.00
	මුළු එකතුව	- **රු. 452,250.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

තමන් සතු ඉඩමෙහි ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ හැකියාව ඇතැයි යන උපකල්පනය මත පිහිටා ඉඩමෙහි වටිනාකම ඇස්තමේන්තු කර නොමැත.

අනු අංකය	විස්තරය	ඒකක ගණන	ඒකකයක මිල (රුපියල්)	වටිනාකම (රුපියල්)
01	මව් සතුන් (ගැහැණු)	15	16,000.00	240,000.00
02	මව් සතුන් (පිරිමි)	01	24,000.00	24,000.00
03	ගොඩනැගිල්ල (එළු ගාල)	01	150,000.00	150,000.00
04	වතුර මෝටරය			18,000.00
05	වෙනත් (උදලු / සවල් / විල් බැරෝ ආදි)	-	-	12,000.00
	එකතුව			444,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

එළුවන් සඳහා ප්‍රධානතම ආහාර වර්ගය කොළ අතුය.

අනු අංකය	විස්තරය	මාසයක වියදම (රු.)
01	ඖෂධ	500.00
02	ශ්‍රම පිරිවැය	7,500.00
03	වෙනත්	250.00
	එකතුව	8,250.00

5. ශුද්ධ ලාභය

මව් සතුන්ගෙන් ලබා ගන්නා පැටවුන් වසර 1 1/2 ට පසුව ජීව බරට මස් පිණිස අලෙවි කරයි. ඉතා හොඳින් සතුන් නඩත්තු කරන්නේ නම් එක් සතෙකු කිලෝ ග්‍රෑම් 35 ක පමණ බරක් සහිතව වර්ධනය වේ. මව් සතුන් 15 දෙනාගෙන් වසරකට දෙවරක් පැටවුන් ලබා ගැනිමට හැකියාව ඇත. ඒ අනුව වසරකට සතුන් 30 දෙනෙකු ජීව බරට අලෙවි කරන ආකාරයට ගණනය කරන ඇත. ජීව බරට කිලෝ ග්‍රෑම් 1ක් රු. 550.00 ට අලෙවි කිරීමේ හැකියාව ඇත.

මාසික විකුණුම් ආදායම (රු. 550.00 × 35Kg × 30/12)
= රු. 577,500.00 / 12
= රු. 48,125.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත් වියදම්

මාසික සෘජු පිරිවැය = රු. 500.00 + රු. 7,500.00 + රු. 250.00
= රු. 8,250.00

වක්‍ර පිරිවැය

මව් සතෙකු වසරකට දෙවරක් පැටවුන් බිහි කරන බැවින් වසරකට අලෙවි කළ හැකි සතුන් සංඛ්‍යාව 30 ලෙස සලකා ගණනය කිරීම් සිදු කර ඇත

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු. 48,125.00 - (රු. 8,250.00 + රු. 6,000.00)
	= රු. 48,125.00 - රු. 14,250.00
	= රු. 33,875.00

එළු පාලනයේදී මව් සතුන් වසරකට දෙවරක් පැටවුන් බිහි කරයි. අලුතින් පුද්ගලයෙකු මෙම ව්‍යාපාරය ආරම්භ කරන්නේය යන උපකල්පනය මත පිහිටා මෙය සකස් කරන ලද අතර පලමු වසරෙන් පසු මෙම ආදායම 50%න් වර්ධනය වේ.

ව්‍යාපාරිකයා විසින් මෙම ව්‍යාපාරයේ නියැලෙන්නේ නම්, ඔහුට මාසික වැටුප ලෙස රු. 7,500.00 වෙන් කරගත හැකි අතර, ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ලෙස මසකට රු. 33,875.00 ක් උපයා ගත හැකිය.

මිරිදිය මත්ස්‍ය වගාව (තිලාපියා)

1.හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය වන මත්ස්‍ය ධාරිතාවය පරිභෝජන අවශ්‍යතාව සඳහා ප්‍රමාණවත් නොවන අතර මේ වන විට මිරිදිය මත්ස්‍ය වගාව සංවර්ධනය කිරීමේ විශාල අවශ්‍යතාවයක් පවතී. තිලාපියා විවිධ රසයෙන් ආහාරයට ගත හැකි, වැඩි පාරිභෝගික රුචිකත්වයක් ඇති මත්ස්‍ය විශේෂයක් වන බැවින් වාණිජ මිරිදිය මත්ස්‍ය වගාවේදී තිලාපියා සඳහා වැඩි ඉල්ලුමක් පවතී. මෙම විශේෂය ඉතා වේගයෙන් වර්ධනය වන අතර ස්වාභාවික ශාක ප්ලවාංග මත යැපීමේ හැකියාව ඇත. එසේම ශ්‍රී ලංකාවේ ජලාශවල හොඳින් වර්ධනය විය හැකි අතර රෝග සඳහා වඩා ප්‍රතිරෝධී මත්ස්‍ය විශේෂයකි. තිලාපියා වසරකට දෙවරක් නිෂ්පාදනය කළ හැකිය. යාවත්කාලීන තාක්ෂණය හා ශිල්පීය ක්‍රම උපයෝගී කර ගනිමින් තිලාපියා මසුන් නවීන ආකාරයෙන් වගා කිරීමෙන් අපේක්ෂිත ආදායම ඉතා කෙටි කාලයකින් ලබා ගත හැකිය. තිලාපියා වගාව සඳහා දේශිය විදේශිය ඉල්ලුම ඉහළ යමින් පවතින බැවින් රැකියා විරහිත ජනතාවට වැඩි ආදායමක් ලැබිය හැකි ව්‍යාපාරික අවස්ථාවකි.

2. අවශ්‍ය ද්‍රව්‍ය

වර්ග මීටර් 1000 ප්‍රමාණයේ පොකුණක් සඳහා

- ජල පහසුකම්
- මත්ස්‍ය පැටව් (ඇඟිල්ලන්)-මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වලින් පහසු මිලට ලබා ගත හැකිය.
- මත්ස්‍ය ආහාර

3. වෙළඳපොල

මිරිදිය මත්ස්‍ය විශේෂ අතර තිලාපියන් සඳහා වැඩි ඉල්ලුමක් පවතී. ශ්‍රී ලංකාව තුළ සිටින තොග මත්ස්‍ය වෙළඳුන් සම්බන්ධ කරමින් අලෙවිය පහසුවෙන් සිදු කර ගත හැක. මිරිදිය මසුන් ඕනෑම වයසක කෙනෙක්ට ආහාරයට ගත හැකි ප්‍රොටීන් අධික ආහාරයකි. එසේම මුහුදු මත්ස්‍යයන්ට සාපේක්ෂව මිල අඩු බැවින් ඉහළ ආදායම්ලාභීන්ගේ සිට පහළ ආදායම්ලාභීන් දක්වා පරිභෝජනය කරනු ලැබේ. සාමාන්‍ය සිල්ලර මත්ස්‍ය අලෙවිසැලේ සිට සුපිරි වෙළඳසැල් දක්වා අලෙවි කළ හැකිය. වෙළඳපොල තුළ පහළ හා මධ්‍යම ආදායම් කාණ්ඩ අතර වැඩි ඉල්ලුමක් පවතින අතර ඉහළ ගුණාත්මක බවින් යුක්තව නිෂ්පාදනය කළහොත් අපනයන වෙළඳපොල සඳහා ද අවස්ථාව ලබා ගත හැකිය.

4. ආයෝජනය

ආරම්භයේදි පොකුණු සාදා ගැනීමට ප්‍රාග්ධනය අවශ්‍ය වේ. එක් පොකුණකින් අස්වැන්න ලැබීමට මාස 6 ක් ගත වේ.අවුරුද්ද පුරාම ව්‍යාපාරයේ යෙදී ආදායම් ගැනීමට පොකුණු දෙකක්වත් සාදා ගත යුතුය. මඩ පොකුණක් (වර්ග මීටර් 1000) සඳහා ආයෝජනය පහත පරිදි වේ.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 280,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	- රු. 355,200.00
	මුළු එකතුව	- **රු. 635,200.00**

මෙම ප්‍රමාණයේ පොකුණ ක් සඳහා රු. 635,200.00 ක් පමණ අවශ්‍ය වේ

4.1 ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී තමා සතු ඉඩමක් යොදා ගන්නා බව උපකල්පනය කරමින් භූමිය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	පොකුණු, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු)
1	මඩ පොකුණ (වර්ග මීටර්1000)	240,000.00
2	වතුර මෝටරය	30,000.00
3	උපකරණ (බේසම්,දැල්,බට)	10,000.00
	එකතුව	280,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 6 ක් සඳහා)

- වර්ග මීටර 1ක් සදහා මත්ස්‍ය පැටව් 5 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත
- ඇඟිල්ලන් 1000 ක් සඳහා මාලු ආහාර කිලෝග්‍රෑම් 324 අවශ්‍ය වේ.
- මාලු ආහාර කිලෝග්‍රෑම් එකක් රු. 110.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
- ඒ අනුව අවුරුද්දක් තුළ දෙවරක් ඇඟිල්ලන් මිලදී ගන්නා අතර දෙවරක් මත්ස්‍ය අස්වැන්න නෙලීම සිදු වේ.

අංක	විස්තරය	මාස හයක වියදම (රු.)
1	ඇඟිල්ලන් සදහා වියදම (5000)	15,000.00
2	මාලු ආහාර	178,200.00
3	බෙහෙත්	2,000.00
4	ශ්‍රමය (සේවකයන් 1-දිනකට රු.800 මසකට දින 30)	144,000.00
5	විදුලි බිල	12,000.00
6	ප්‍රවාහනය(මත්ස්‍ය පැටව් ගෙන ඒමට)	4,000.00
	එකතුව	355,200.00

මාසික ශුද්ධ ලාභය

(එක් පොකුණකින් මත්ස්‍ය අස්වැන්න ලබා ගැනීම සඳහා මාස 6 ක් ගත වේ.)
තිලාපියෙක්ගේ අස්වැන්න ග්‍රෑම් 350 ක් වන අතර, ඇඟිල්ලන් 5,000 කින් මත්ස්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 1,750 පමණ ලබා ගත හැකි බව ඇස්තමේන්තු කර ඇත. මත්ස්‍ය කිලෝ එකක මිල රු. 380.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව,

මාස හයක විකුණුම් ආදායම = කිලෝග්‍රෑම් 1750 × රු. 380.00 = රු. 665,000.00

මාස හයට මුළු පිරිවැය = සෘජු පිරිවැය +වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම්
මාස හයට සෘජු පිරිවැය = රු. 195,200.00 + රු. 144,000.000 + රු. 16,000.00
= රු. 355,200.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම වේ. (නඩත්තු වියදම් හා ක්ෂය) මාස හයට රු. 17,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(මාස හයට අදාලව) ශුද්ධ ලාභය	= විකුණුම් ආදායම - මුළු පිරිවැය
	= රු. 665,000.00 -(රු. 355,200.00 + රු. 17000.00)
	= රු. 665,000.00 - රු. 372,200.00
	= රු. 292,800.00
මාසික ශුද්ධ ලාභය	= රු. 48,800.00

මේ අනුව ව්‍යවසායකයාට මසකට රු. 24,000.00 ක වැටුපක් ලබාගත හැකි අතර, මාසිකව රු. 48,800.00 ශුද්ධ ලාභයක් ලැබේ.

වාණිජ බුලත් වගාව

1. හැඳින්වීම

ශ්‍රී ලංකාව යනු කෘෂිකාර්මික රටකි. එසේම ග්‍රාමීය ආර්ථිකයේ කොඳු නාරටිය වන්නේද කෘෂිකර්මාන්තයයි. ඒ අනුව ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ යාන්ත්‍රණය කෘෂිකර්මාන්තය සතුවේ. එසේම රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ විශාල කාර්යභාරයක් කෘෂිකර්මාන්තය හරහා සිදුවේ. ඒ අතරට අපනයන කෘෂිකර්මාන්තය විශේෂ වේ. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ සාර්ථකව වගාකළ හැකි එසේම ඉහළ ඉල්ලුමක් පවතින ප්‍රධාන අපනයන භෝගයක් ලෙස බුලත් හඳුන්වාදිය හැකිය.

විශේෂයෙන්ම ගෘහ ආශ්‍රිතව අතුරු භෝගයක් ලෙසට බුලත් වගාව සිදුකළ හැකි අතර ඒ තුළින් ගෙවත්තෙන් ඉහළ ආදායමක් ලබාගත හැකිවේ. නිරෝගී පැළ රෝපණය කර මාස 08ක් පමණ ගතවීමෙන් පසු බුලත් අස්වැන්න නෙළා ගැනීමේ හැකියාවක් පවතින අතර හොඳින් සාත්තු කළ එක් බුලත් වැලකින් අපනයන මට්ටමේ ලොකු බුලත් එක් මසකට කොළ 8ක් පමණ හා කෙටි බුලත් කොළ 15 ක් පමණ අස්වැන්නක් නෙළා ගැනීමට හැකි වේ. රෝග හානියකින් තොරව අවම වසර 10 - 15 ත් අතර කාලයක් අඛණ්ඩව ඵලදාව නෙළාගත හැකිවේ.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

බුලත් පැළ	- ඉහළ ගුණාත්මයෙන් යුතු, නිරෝගී බුලත් දළු
පොහොර	- ගොම පොහොර, එළු පොහොර
බුලත් ඉණි	- බුලත් වැලෙහි ආධාරක ලෙස ඉණි යොදාගත යුතුය.

3. වෙළඳපොල

බුලත් යනු විශාල දේශීය විදේශීය වෙළෙඳ පොලකට හිමිකම් කියනු ලබන අතුරු බෝගයකි. දින 15කට වතාවක් අස්වැන්න නෙළාගත් බුලත් කොළ දේශීය වෙළෙඳපොල තුළ අලෙවි කළ හැකිය. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශයන්හි ඉහළ අලෙවියක් මේ සඳහා හිමිවන අතර වෙළෙඳපොල සඳහා ප්‍රවේශ වීම ද ඉතා පහසුවේ. එසේම මසකට එක්වතාවක් (කළු බුලත්) වන සේ අස්වැන්න නෙළාගත් බුලත් අපනයන වෙළෙඳපොල සඳහා ඉදිරිපත් කළ හැකිය. අපනයනය සඳහා අවශ්‍ය බුලත් මිලදී ගැනීම සඳහා ප්‍රාදේශීය වශයෙන් බුලත් පොලවල් ක්‍රියාත්මක වන අතර, ඒ අනුව අපනයන වෙළෙඳාම මූලික කරගත් බුලත් වගාකරුවන් සඳහා ද ඉක්මනින් වෙළෙඳපොල වෙත ප්‍රවේශවීමට හැකියාව ඇත. ලංකාවේ කළු බුලත් සඳහා විශාල ඉල්ලුමක් පකිස්තානය තුළ පවතින අතර ඒ අනුව ඍජුවම පකිස්තානය සඳහා ලංකාවෙන් බුලත් අපනයනය කරනු ලබයි. මේ අනුව ගුණාත්මයෙන් උසස් බුලත් සඳහා දේශිය මෙන්ම විදේශීයවද ඉහළ ඉල්ලුමක් පවතී.

4. ආයෝජනය

බුලත් දළු රෝපණය කර නිසි සත්කාර සිදුකළ හොත් මාස තුනක් ගතවූ පසු අස්වැන්න නෙළා ගත හැකි වන අතර බුලත් දළු 700 ක් වගාකරනු ලබන ව්‍යාපාරයක් සඳහා ගෙවත්ත හෝ ඉඩමේ ප්‍රමාණය අක්කර භාගයක් වත් තිබිය යුතුය. ඒ අනුව අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල,

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	-	රු. 69,000.00
4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	-	රු. 37,300.00
මුළු එකතුව	-	**රු. 106,300.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් සැලකිල්ලට ගෙන ඇත. බිම් සකස් කිරීම ව්‍යාපාර හිමිකරු විසින් සිදුකරන අතර ආධාරක ලී සහ ලී දඬු ග්‍රාමීය මට්ටමින් ලබාගන්නා බවට උපකල්පනය කර ඇත.

අංක	යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා මවි ශාක	වටිනාකම (රු)
01	වතුර මෝටරය (අඟල් 01)	32,000.00
02	වතුර බට සහ අනෙකුත් ජල සම්පාදන සඳහා අවශ්‍ය උපකරණ	5,000.00
03	අනෙකුත් උපකරණ	4,000.00
04	ගුණාත්මයෙන් උසස් නිරෝගී මවි ශාක (පැළයක් රු 40.00 බැගින් පැල 700)	28,000.00
	මුළු එකතුව	69,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

මාසික පදනම මත කාරක ප්‍රාග්ධනය ඇස්තමේන්තුකර ඇත.

අංකය	විස්තරය	මාසික වියදම
01	අමුද්‍රව්‍ය සඳහා වියදම - පොහොර	7,000.00
02	ශ්‍රම කුලී (දිනකට රු. 1,000.00 බැගින් දින 30ක් සඳහා)	30,000.00
03	වෙනත් වියදම්	300.00
	එකතුව	37,300.00

5. මාසික ශුද්ධ ලාභය

බුලත් දළු 700 ක් වගාකරමින් අපනයනය අභිලාෂයෙන් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් සඳහා මාසික ශුද්ධ ලාභය පහත පරිදි ගණනය කර ඇත. මෙහි ආදායම ගණනය කිරීමේ දී ඒකකයක විකුණුම් මිල වර්තමාන මිල ගණන් යටතේ ගණනය කර ඇත (2021.09.08). එසේම හොඳින් සාත්තු කළ වගාවකට අදාලව එලදාව ඇස්තමේන්තුකර ඇත.

මාසික මුළු විකුණුම්

ලොකු බුලත් (එක් වැලකින් එක් වතාවකට කොල 08ක් බැගින්) = රු. 50,400.00
(පැල 700 **x** එකකින් කොළ 8 **x** එකක විකුණුම් මිල රු. 9.00)

පොඩි බුලත් (එක් වැලකින් එක් වතවකට කොල 15ක් බැගින්) = රු. 21,000.00
(පැල 700 **x** එකකින් කොළ 15 **x** එකක විකුණුම් මිල රු. 2.00) = රු. 71,400.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
මාසික සෘජු පිරිවැය (මාසික කාරක ප්‍රාග්ධනය) = රු. 37,300.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ ජලය, විදුලිය, ප්‍රවාහන, අලෙවි හා ක්ෂය වැනි වියදම් වෙනුවෙන් මාසිකව රු. 10,000.00 ක් පමණ වැයවේ යැයි ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු. 71,400.00 - (රු. 37,300.00 + රු. 10,000.00)
	= රු. 71,400.00 - රු. 47,300.00
	= රු. 24,100.00

බුලත් වගාවට අදාලව අවශ්‍ය ශ්‍රම දායකත්වය ව්‍යාපාර හිමිකරු විසින් සිදුකරයි නම්, මාසිකව රු. 30,000.00 ක වැටුපක් වෙන් කර ගත හැකි අතර, ශුද්ධ ලාභය වශයෙන් රු. 241,00.00 ක් උපයාගත හැක.

වෙනත්

විකුණුම් ආදායම ගණනය කිරීමේ දී අපනයන වෙළෙඳපොල මූලික කරගෙන ඇති බැවින් කඳ කොළ, කොරිකන් අලෙවියෙන් ලැබෙන ආදායම සැලකිල්ලට ගෙන නොමැත.

ඇපල් පේර වගාව

1. හැඳින්වීම

වර්තමානයේ භාවිතාවන පලතුරු අතර ඉතාම රසවත්, පෝෂණ ගුණයෙන් අනූන මෙන්ම ප්‍රචලිත පලතුරු වර්ගයකි පේර. එසේම හිරු එළිය හොඳින් පවතින ජලය සම්පාදනය කළ හැකි ඉඩමක හොඳින් වගා කළ හැකි ලාභදායි වගාවකි. දැනට බහුලව ම වගාව සිදුකරන ප්‍රභේද දෙකකි. ඒවානම් කිලෝ පේර හා ඇපල් පේර යන වර්ග දෙකයි. ඵලයේ ප්‍රමාණය, අලංකාරය, මෘදු බව හා මිහිරි රසය අනුව හොඳ අලෙවියක් ඇත්තේ ඇපල් පේර සඳහා වේ. මන්ද මෙය වගාවට උනන්දු හා කැමැත්තක් දක්වන ඕනෑම අයෙකුට ඉතාම පහසුවෙන් ආරම්භ කළ හැකි ව්‍යාපාර අවස්ථාවකි. මෙහි ඇති සුවිශේෂතාවය වන්නේ පලිබෝධ හානි අවමවීම හා නඩත්තුව පහසුවීමයි. බහුලව ම දැකිය හැකි හානිය වන්නේ පිටි මකුනා හා පලතුරු මැස්සාගේ හානියයි. ඒවා සඳහා යාන්ත්‍රික ක්‍රම හා රසායනික ක්‍රම රාශියක්ම ඇත. ඒ සඳහා ප්‍රදේශයේ කෘෂි උපදේශක මහතාගෙන් උපදෙස් ලබාගත හැකිය.

2. අමුද්‍රව්‍ය

- ජලය - අඛණ්ඩව ලබාගත හැකි ඉතාම හොඳ ජල ප්‍රභවයක අවශ්‍යතාවය
- කොම්පෝස්ට් - තමන්ටම නිපදවාගත හැකිය. එසේ නොමැති නම් වෙළෙඳපොලෙන් මිලට ගත හැක.
- එප්පාවල රොක් පොස්පේට් - වෙළෙඳපොලෙන් මිලට ගත හැක.
- රසායනික ද්‍රව්‍ය - නිර්දේශිත රසායනික වෙළෙඳපොලෙන් මිලට ගත හැක.
- ඵල වසා තබන කඩදාසි කවර - පත්තර කඩදාසි වලින් සකසා ගත හැකිය.

3. වෙළෙඳපොල

වයස, ආදායම, ස්ත්‍රී- පුරුෂ බව, රැකියාව හා සංස්කෘතිය ආදී කිසිවක් මෙහි වෙළෙඳපොල සඳහා සැලකිය යුතු මට්ටමක බලපෑමක් නැත. බොහෝවිට මිල රුපියල් 100.00 සිට 200.00 දක්වා උච්ඡාවචනය වීමක් දක්නට ලැබේ. දෙසැම්බර්, ජනවාරි හා පෙබරවාරි මාසවල ඉහළ මිලක් ද රඹුටන්, අලිගැටපේර, අන්නාසි වැනි විකල්ප පලතුරු බහුල කාලයට පහළ මිලක් ද තීරණය වේ. දඹුල්ල, තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථාන හා මැනිං වෙළෙඳපොල මෙන්ම සුපිරි වෙළෙඳ සැල් සඳහා ද ඉල්ලුම ඇත. ඊට අමතරව ගම්, නගරවල ඇති කුඩා පළතුරු මැසි සඳහා ද ඉල්ලුම පවතී. එසේම විවිධ බීම වර්ග වැනි අගය එකතුකළ නිෂ්පාදන කරන සමාගම් සඳහා ද ගිවිසුම්ගත ක්‍රමයට අලෙවි කිරීමේ හැකියාව පවතී.

4. ආයෝජනය

පිටතින් ශ්‍රමිකයින් භාවිතා නොකරන අතර පවුලේ එක් අයෙකුගේ සෘජු ශ්‍රමය සඳහා මසකට රු. 20,000.00 ක කුලියක් වැයවන බවත්,

සාමාන්‍ය මාසික නිෂ්පාදනය කි. ග්‍රෑ. 400 ක් බවත් / සාමාන්‍ය මාසික මිල රුපියල් 150.00 බවත්,

ඉඩම් හා ගොඩනැගිලි සඳහා වැය නොදරන බවත් ,

අක්කර එකක වගාවක් සිදු කරන බවත් (අඩි 12-12 පරතරයෙන් ගස් 222 සිටුවිය හැකිය) උපකල්පනය කර ඇත.

04.1 ස්ථාවර පිරිවැය

අංක	අයිතමය	වටිනාකම රුපියල්
01	ජලය පොම්ප කරන යන්ත්‍රය	30,000
02	දියර ඉසින යන්ත්‍රය	15,000
03	වතුර සපයන බට	20,000
04	වෙනත් උපකරණ	15,000
05	ඉඩම සැකසීම	30,000
06	රෝපණ පැල සඳහා (පේර පැල)	7,000
	එකතුව	117,000

04.2 ස්ථාවර කාරක ප්‍රග්ධන පිරිවැය

අස්වනු ලැබෙන්නේ පැළ සිටුවා මාස 09 කින් නිසා මුල් මාස 09 සඳහා කාරක ප්‍රාග්ධනය ගණනය කර ඇත. සෘජු ශ්‍රමය රුපියල් 20,000.00 මාසිකව ඇස්තමේන්තු කරන අතර එය අස්වනු ලැබෙන මාසයේ සිට වෙන් කරනු ලබයි.

අංක	අයිතමය	වටිනාකම රුපියල්
01	අමුද්‍රව්‍ය හා ගෙන ඒම	10,000
02	සෘජු ශ්‍රමය	20,000
03	ඇසුරුම්, විදුලිය,ජලය හා වෙනත්	5,000
	එකතුව	35,000

ඒ අනුව මුළු ආයෝජනය = රුපියල් 152,000.00 කි.

05. මාසික ශුද්ධ ලාභය

මාසික අලෙවි ආදායම (මාසික ඒකක කි. ග්‍රෑ. 400 ක් බවත් මිල රුපියල් 150.00 කි)

කි. ග්‍රෑ. 400 × රු. 150.00 = රු. 60,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

රු. 35,000.00 + රු. 7,000.00 = රු. 42,000.00

(සෘජු පිරිවැයෙන් 20 % ක් ලෙස වක්‍ර පිරිවැය ගනන් බලා ඇත)

ඒ අනුව මාසිකව ශුද්ධ ලාභය රුපියල් 18,000.00 කි

ව්‍යාපාරිකයා විසින් ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයට රුපියල් 20,000.00 ක වැටුපක් ආරම්භයේ දී වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය වශයෙන් රුපියල් 18,000.00 ක් ආරම්භයේ දී උපයා ගත හැකිය.

මස් සඳහා ඌරන් ඇති කිරීම

1. හැඳින්වීම

මස් ලෙස සත්ව ආහාර පරිභෝජනය මිනිසා තුළ ගල් යුගයේ සිට දක්නට ලැබුණු දෙයකි. අතීතයේ මිනිසුන් මස් පරිභෝජනය සතුන් දඩයම් කිරීම තුළින් සිදු කර ගන්නා ලද බැවින් එම මස් දඩමස් ලෙස හඳුන්වන ලදි. අද කාලයේ වුවද, මිනිසා තුළින් එම කාර්යය ගිලිහී ගොස් නැත. වර්තමානයේ උවද වැඩි ඉල්ලුමක් හා වැඩි මිලක් දඩමස් සඳහා පවතී. වනාන්තර එළි වීමත් මිනිසා සංස්කෘතිකමය වශයෙන් හා ආකල්පමය වශයෙන් වෙනස් වීම තුළ සෑම පුද්ගලයෙකුම සතුන් මැරීම නොකරයි. එය ඉතාම පාපකාරී සිද්ධියක් ලෙස සලකන අතර පරිභෝජනය සඳහා මස් වෙළඳසැල් තුළින් මිල දී ගැනිමට පෙලඹී ඇත. එහෙත් වර්තමානය වන විට බොහෝ පිරිසක් ඌරු මස් පරිභෝජනයෙන් වැළකී සිටිය ද දමිළ ජනතාව අතර මෙන්ම සිංහල ජනතාවගේ යම් පිරිසක් අතර ද ජනප්‍රිය මස් වර්ගයකි. මෙය ව්‍යාපාරයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශයන්හි ආරම්භ කළ හැකි ව්‍යාපාරික අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

කුඩු, පුන්නක්කු, ඉවතලන එලවළු, පලතුරු හා ආපනශාලා වලින් ඉවත දමන ලද ආහාර ද්‍රව්‍ය.

3. වෙළඳපොළ

ඌරු පාලනයේ නියැලි ව්‍යවසායකයින්ගෙන් බහුතරයක් මස් ලෙස අලෙවි නොකරන අතර ජීව බරට සතුන් අලෙවි කරයි. මස් වෙලඳසැල් හිමියන් හෝ සතුන් ජීව බරට මිලදී ගෙන මස් බවට පත් කරන්නන් ලෙස වෙනමම පිරිසක් සිටි. ඔවුන් මෙම සතුන් ජීව බරට මිලදී ගනු ලබයි. කෙසේ වෙතත් සාමාන්‍යයෙන් ප්‍රධාන ආහාර වේල් වලට පරිභෝජනයට ගන්නා අතර උත්සව අවස්ථාවන් හි දි බයිට් වර්ග ලෙස හා පුද්ගලයන් කිහිප දෙනෙකු හෝ පිරිසක් එක්ව පවත්වන කුඩා සාදයන් හි දි ද බයිට් ලෙස භාවිතා කරයි. කුකුල් මස් මෙන් සමස්ත සමාජයම පරිභෝජනය නොකල ද මේ සඳහා කැමැත්ත දක්වන විශාල පිරිසක් සමාජය තුළ සිටින බැවින් වෙළඳපොල පිළිබද ගැටළුවක් මතු නොවේ. විශේෂයෙන්ම ක්‍රිස්තියානි ආගම අදහන ජනතාව තුළ විශේෂ ඉල්ලුමක් පවති. මස් අලෙවිසැල් / සුපිරි වෙලඳසැල් හරහා අලෙවිය සිදු කළ හැකිය. අතීතයේදි මස් වෙලඳසැල් සංකිර්ණ වෙනම ඉදි වි තිබුණ ද වර්තමාන සමාජයේ ග්‍රාමිය මට්ටම දක්වාම මස් වර්ග/මාළු වර්ග/බිත්තර ආදිය පමණක් අලෙවි කරන වෙළඳසැල් වෙනම බිහිවි ඇති බැවින් වෙළදපොල ගැටළුවක් නොමැත. මෙම මස් සඳහා අගය එකතුකළ නිෂ්පාදන පෙළක් ලෙස වෙළද පොළ තුළ ඉහළ ඉල්ලුමක් ද දක්නට ලැබේ.

4. ආයෝජනය

ගැහැණු මව් සතුන් දෙදෙනෙකු හා පිරිමි එක් සතෙකුගෙන් යුත් ඌරු පාලනය ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 421,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 93,940.00
	මුළු එකතුව	- **රු. 514,940.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ඉඩම හෝ ගොඩනැගිල්ල සඳහා වියදම ඇතුළත් කර නොමැති අතර පදිංචි ස්ථානය තුළ ව්‍යාපාරය ආරම්භ කිරීමට හැකි වේය යන උපකල්පනය මත පිහිටා ස්ථාවර වත්කම් ගණනය කරන ලදි.

අනු අංකය	විස්තරය	ඒකක ගණන	ඒකකයක මිල (රු.)	වටිනාකම (රුපියල්)
01	මවි සතුන් (ගැහැණු)	02	30,000.00	60,000.00
02	මවි සතුන් (පිරිමි)	01	45,000.00	45,000.00
03	කොටු (සතුන්ගේ ලැගුම් හල්)	05	50,000.00	250,000.00
04	වතුර මෝටරය	01	25,000.00	25,000.00
05	ජල සම්පාදනය (ජල නල පද්ධතිය)	01	16,000.00	16,000.00
06	වෙනත් (උදලු / සවල් / විල් බැරෝ ආදි)	-	-	25,000.00
	එකතුව			421,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

මවි සතුන් දෙදෙනෙකුගෙන් හා එක් පිරිමි සතෙකුගෙන් ආරම්භ කළ හැකි ලෙස උපකල්පනය කරන ලදි. ඒ අතරම මෙම මවි සතුන්ගෙන් එක් සතෙකු පැටවුන් 10 දෙනෙකු බිහි කරයි යන (සාමාන්‍යයෙන් එක් මවි සතෙකු පැටවුන් 8-14 ප්‍රමාණයක් බිහි කරනු ඇත.) යන උපකල්පනය මත පිහිටා ගණනය කිරීම් සිදු කර ඇත.

අනු අංකය	විස්තරය	මාසයක වියදම (රු.)
01	මවි සතුන් සඳහා ආහාර වියදම	10,440.00
02	කුඩා සතුන් සඳහා ආහාර වියදම	25,000.00
03	ශ්‍රම වියදම	36,000.00
04	වෙනත්	22,500.00
	එකතුව	93,940.00

මවි සතුන් දෙදෙනාගෙන් වරකට පැටවුන් 10 දෙනෙකු ලබා ගන්නා බැවින් අමතර ආහාර සමග (ඉවතලන එළවළු හා පලතුරු ආපන ශාලා වල අමු ද්‍රව්‍ය) කුඩු හා පුන්නක්කු සඳහා සතුන් 20 දෙනාටම මසකට රු. 25,000.00 ක් පමණ වැය වේ.

5. ශුද්ධ ලාභය

මවි සතුන්ගෙන් ලබා ගන්නා පැටවුන් වසරක කාලයකට පසුව ජීව බරට මස් පිණිස අලෙවි කරයි. ඉතා හොඳින් සතුන් නඩත්තු කරන්නේ නම් එක් සතෙකු 150Kg පමණ බරකින් යුක්ත වේ. ජීව බරට 1Kg ක් රු. 550.00 කට අලෙවි කල හැකි අතර එක් සතෙකු සඳහා රු. 550.00 × 150 Kg = රු. 82,500.00 කට අලෙවි කල හැකිය.

මාසික විකුණුම් ආදායම (රු. 550.00 × 150Kg × 20/12) = රු. 137,500.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත් වියදම්

මාසික සෘජු පිරිවැය = රු. 35,440.00 + රු. 36,000.00 + රු. 22,500.00

= රු. 93,940.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ. (ජල/විදුලිය/ප්‍රවාහන/අලෙවි/ක්ෂය කිරීම් /දෙනුන් රක්ෂණය කිරීමේ ගාස්තු ආදි අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 15,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය

= රු. 137,500.00 - (රු. 93,940.00 + රු. 15,000.00)

= රු. 137,500.00 - රු. 108,940.00

= රු. 28,560.00

ඌරු පාලනයේදි මව් සතුන් වසරකට දෙවරක් පැටවුන් බිහි කරයි. අලුතින් පුද්ගලයෙකු මෙම ව්‍යාපාරය ආරම්භ කරන්නේය යන උපකල්පනය මත පිහිටා මෙය සකස් කරන ලද අතර පලමු වසරෙන් පසු මෙම ආදායම 50%න් වර්ධනය වේ.

ව්‍යාපාරිකයා විසින් මෙම ව්‍යාපාරයේ නියැලෙන්නේ නම් ඔහුගේ මාසික වැටුප ලෙස රු. 36,000.00 ක් වෙන් කර ගත හැකි අතර ශුද්ධ ලාභය වශයෙන් රු. 28,560.00 ක් උපයාගත හැකිය.

ස්ට්‍රොබෙරි වගා ව්‍යාපෘතිය

1. හැඳින්වීම

නුවරඑළිය, වැලිමඩ, බණ්ඩාරවෙල, හපුතලේ, ඌව පරණගම වැනි ශීත දේශගුණයක් සහිත ප්‍රදේශවල සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය ජීවනෝපාය ලෙස පවත්වාගෙන යන ව්‍යවසායකයින්ට කුඩා භූමි ප්‍රමාණයකින් මාසික ව ඉහළ ආදායමක් ලබාගත හැකි ව්‍යාපෘතියකි. ප්‍රාදේශීය සුවිශේෂී ව්‍යාපෘතියකින් වන මෙය රු. 150,000.00 ක පමණ ආයෝජනයකින් මාසික ව රු. 75,000.00 ක පමණ ශුද්ධ ආදායමක් ලබාගත හැකිය.

2. අමුද්‍රව්‍ය

ස්ට්‍රෝබෙරි පැළ සාම්ප්‍රදායික හා නවීන ලෙස වෙන් වන අතර චැන්ඩලර්, කේම්බ්‍රිජ්, වැනි සාම්ප්‍රදායික රෝපණ ද්‍රව්‍ය ද කැමරෝසා, ෆෙස්ටිවා සහ ස්වීච්චාලි වැනි ඉහළ අස්වැන්නක් දෙන රෝපණ ද්‍රව්‍ය ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් පටකරෝපණ අංශ වලින් (සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ආයතනය, 052-2222615) ඇණවුම් කර රු. 100.00 ක් වැනි මුදලකට එක් පැළයක් ලබාගත හැක.

3. වෙළෙඳපොළ

දේශීය ඉල්ලුමට ප්‍රමාණවත් සැපයුමක් නොමැති අතර, ඉහළ ගුණාත්වයෙන් යුතු ස්ට්‍රෝබෙරි කි.ග්‍රෑම් 1 ක් රු.1,500.00 කට අලෙවි කළ හැක. සුපිරි වෙළෙඳසැල්වල හා අනෙකුත් ගැණුම්කරුවන් සඳහා පවතින ඉල්ලුමට ප්‍රමාණවත් තරම් සැපයුමක් නොපවතින බැවින් ඉහත ප්‍රදේශවල ජීවත්වන ඕනෑම අයෙකුට මෙම විභවතාවය සපුරාලීමට වෙළෙඳපොළට පිවිසීමේ හැකියාව ඇත. අලෙවියට යෝග්‍ය නොවන ප්‍රමාණයෙන් කුඩා ගෙඩි මගින් ස්ට්‍රොබෙරි ජෑම් නිෂ්පාදනය කළ හැකි අතර ඒ සඳහා ද ඉහළ ඉල්ලුමක් ඇත.

4. ආයෝජනය

මෙම ව්‍යාපාරය කෘෂිකාර්මික ව්‍යාපාරයක් වන අතර මෙහි මූලික අස්වනු ලබා ගැනීම සඳහා මාස 3 ක කාලයක් ගතවේ. පර්චස් 5ක බිම් ප්‍රමාණයක ස්ට්‍රෝබෙරි පැළ 750ක් වගා කිරීම සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 140,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 3ක් සඳහා)	- රු. 43,350.00
	මුළු එකතුව	- **රු. 183,350.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහි දී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	ඉඩම් පර්චස් (බදු පදනම මත)	20,000.00
02	යන්ත්‍ර	25,000.00
03	උපකරණ	5,000.00
04	වෙනත් ස්ථාවර වත්කම් (රෝපණ ද්‍රව්‍ය)	75,000.00
05	ජලය සපයාගැනීම	15,000.00
	එකතුව	140,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 3ක් සඳහා)

මසකට කි.ග්‍රෑම් 75 ක් නිෂ්පාදනය කරන අතර මාස 3කින් අස්වනු ලබාගත හැකිය.

අංක	විස්තරය	මාස 3ක් සඳහා වියදම (රු.)
01	ගොම පොහොර	12,000.00
02	මල්ච් පොලිතින්	2,000.00
03	දිලීර නාශක	1,250.00
04	කෘමිනාශක	500.00
05	මූලික පොහොර	600.00
06	දෙවන පොහොර	2,000.00
07	ශ්‍රම වියදම්	20,000.00
08	ඇසුරුම්	5,000.00
	එකතුව	43,350.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

රසායන ද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් දේශිය වෙළෙදපොළෙන් මිලදී ගැනීමට සැලසුම්කර ඇති අතර එක් පැළයකින් මසකට ග්‍රෑම් 100ක අස්වැන්නක් ලබාගැනීමට අපේක්ෂා කරන අතර පර්චස් 5 ක ස්ට්‍රෝබෙරි පැළ 750ක් සිටුවිය හැකිය. කිලො 1ක විකුණුම් මිල රු. 1500.00කි.

මාසික විකුණුම් ආදායම

= එක් පැළයකින් ලබාගන්නා ග්‍රෑම් ප්‍රමාණය x පැළ සංඛ්‍යාව x කි.ග්‍රෑමයක මිල
= (100 x 750) / 1 000 x රු. 1,500.00
= 75 kg x රු. 1,500.00
= රු. 112,500.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = යෙදවුම් වියදම + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත්
= රු. 18,350.00 + රු. 20,000.00 + රු. 5,000.00
= රු. 43,350.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ (ජල, විදුලි, ප්‍රවාහන, අලෙවි ආදි අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 11,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	=	මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	=	රු. 112,500.00 - (රු. 43,350.00 + රු. 11,000.00)
	=	රු. 112,500.00 - රු. 54,350.00
	=	රු. 58,150.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 20,000.00 ක ශ්‍රම වැටුපක් හා ශුද්ධ ලාභය ලෙස රු. 58,150.00 ක් උපයාගත හැකිය.



බීජ බෝංචි නිෂ්පාදනය

1. හැඳින්වීම

දේශීය බීජ නිෂ්පාදනය ප්‍රමුඛ කාර්යයක් ලෙස රජය විසින් හඳුනා ගෙන ඇත. මහා පරිමාණයෙන් බෝංචි වගාව සිදු කරන ප්‍රදේශ වලින් බීජ බෝංචි සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර ඉතා වැඩි හා තද වර්ෂාව පවතින ප්‍රදේශ වල හැර බීජ බෝංචි වගාව පහසුවෙන් ආරම්භ කර හැකි මෙන්ම ඉතා ලාභදායි ව්‍යාපාරයක් ලෙස හැඳින්විය හැකියග තවද මෙම ව්‍යාපාරය මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළ රඳවා ගත හැකි වීමද විශේෂත්වයකි.

2. අමුද්‍රව්‍ය

අවශ්‍ය අමුද්‍රව්‍ය ලෙස ගුණාත්මක තත්ත්වයෙන් යුත් බීජ බෝංචි හා මේ සඳහා නිර්දේශිත රසායනික පොහොර භාවිතා කෙරේ. මෙම අමුද්‍රව්‍ය පිළිබඳ අවශ්‍ය සියලුම තොරතුරු ඕනෑම කෘෂිකර්ම පර්යේෂක හෝ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ගෙන් ලබාගත හැක.

3. වෙළඳපොල

නුවරඑළිය, මහනුවර, මාතලේ හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල බහුලව බෝංචි වගාව සිදු කෙරේ. මෙලෙස වාණිජ වගාවක් ලෙස බෝංචි වගාකරන ඉහත ප්‍රදේශ වල වගාකරුවන් සඳහා බීජ බෝංචි සැපයීම මෙම නිෂ්පාදනයේදී සිදු කෙරේ. වාණිජ වගාවන් ලෙස එළවළු වගාකරනු ලබන වගාකරුවන් අතර බෝංචි වගාව සඳහා අද්විතීය රුචිකත්වයක් පවතී. එහෙයින් ඒ සඳහා යොදාගන්නා අමුද්‍රව්‍යක් ලෙස බීජ බෝංචි සඳහා ලාභදායිත්වයෙන් ඉහළ ස්ථාවර වෙළෙඳපොලක් පවතී.

4. ආයෝජනය

අක්කර කාලක භූමි ප්‍රමාණයක (පර්චස් 40) බීජ බෝංචි නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල .

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 108,750. 00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (දින 120 ක් සඳහා)	- රු. 82,300.00
	මුළු එකතුව	- **රු. 191,050.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ප්‍රාදේශීයව පවතින වගා ඉඩම් වල මිල ගණන් වෙනස් විය හැක. තමා සතු ඉඩමක් හෝ බදු පදනම මත ලබා ගන්නා ඉඩමක් මේ සඳහා යොදා ගත හැකිය.

අංක	ස්ථාවර වත්කම	වටිනාකම (රු.)
01	වගා ඉඩම (බදු පදනම මත)	75,000.00
02	බිම් සකස් කිරීමේ යන්ත්‍ර හෝ උපකරණ	3,750.00
03	ජල සම්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ	30,000.00
	එකතුව	108,750.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

මෙම වගාව සඳහා දින 120 ක පමණ කාලයක් ගතවන අතර වසරකට වාර තුනක් නිෂ්පාදය කරනු ලැබේ. මෙහිදි ශ්‍රම පිරිවැයහි ප්‍රාදේශීය වශයෙන් විෂමතා පැවතිය හැක.(දිනක කාන්තා ශ්‍රමය = රු. 1,100.00 දිනක පිරිමි ශ්‍රමය = රු. 1,500.00)

අංක	විස්තරය	එක් නිෂ්පාදන අවස්ථාවක් සඳහා වියදම (රු.)
01	වගාව සඳහා ශ්‍රම වියදම (මාස 04 කට/ වගා කන්න 01 කට) (බිම් සැකසීම, බීජ සිටුවීම, පොහොර හා කෘෂි රසායන යෙදීම, ආදී..) බිම සකස් කිරීම(බිම පෙරලීම, පාත්ති සකස් කිරීම, වැට සැකසීම)	32,175.00
02	රෝපණ ද්‍රව්‍ය හා කෘෂි රසායන සඳහා වියදම (මාස 04 කට/ වගා කන්න 01 කට)	44,500.00
03	ඇසුරුම් හා වෙනත් වියදම් (මාස 04 කට/ වගා කන්න 01 කට)	5,625.00
	එකතුව	82,300.00

5. මාස 4ක ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය වසරක් තුළ අවස්ථා තුනකදී නිෂ්පාදන කටයුතු සිදු කරන අතර එක් වරකට කි.ග්‍රෑ. 125 ක් නිෂ්පාදනය කර කි.ග්‍රෑ. 1 ක විකුණුම් මිල රු. 1,500.00 ලෙස උපකල්පනය කර ඇත

මාස 4 ක විකුණුම් ආදායම (මාස 4 නිෂ්පාදනය 125 කි.ග්‍රෑ / රු.1,500.00) = රු. 187,500.00

(පාරිසරික තත්වයන් මත අස්වනු ප්‍රමාණය වෙනස් විය හැකි අතර බිම් සැකසීමේ සිට පළමු අස්වනු නෙළීම සඳහා දින 80 ක් ගත වී සම්පූර්ණ නිෂ්පාදන ක්‍රියාවලියට දින 120 ක් පමණ ගත වේ)

මාස 4 ක මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජුවෙනත් වියදම

= රු. 44,500.00 + රු 32,175.00 + රු 5,625.00

= රු. 82,300.00

වක්‍ර පිරිවැය මාස 4 ක් සඳහා රු. 3,750.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාස 4ක ශුද්ධ ලාභය	= මාස 4ක විකුණුම් ආදායම - මාස 4ක මුළු පිරිවැය
	= රු. 187,500.00 - (රු. 82,300.00 + රු. 3,750.00)
	= රු. 101,450.00

ඒ අනුව එක් වරකදී (මාස 4කදී) ශුද්ධ ලාභය ලෙස රු. 101,450.00 ද අයිතිකරු වගා කටයුත වල නිරත වන බැවින් ශ්‍රම වැටුප ලෙස රු. 32,175.00 ක් මුදලක් ද උපයා ගත හැකිය.

ඇම්බන් කෙසෙල් වගාව

1. හැඳින්වීම

Musa Sapientum යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන කෙසෙල් ශාකය ඇම්බන් කෙසෙල්, කෝලිකුට්ටු, ඇඹුල් කෙසෙල්, රත් කෙසෙල් හා අළු කෙසෙල් ආදි වශයෙන් ප්‍රභේද ගණනාවකින් යුක්ත වේ. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ හා අතරමැදි කලාපයේ වාණිජ භෝගයක් ලෙස පහසුවෙන් වගා කළ හැකි භෝග යකි. හොඳින් වැඩුණු කෙසෙල් කැනක් කිලෝ 20ත් 40ත් අතර බරකින් යුක්ත වන අතර අවම පරිශ්‍රමයකින් වැඩි ආදායමක් ලබා ගත හැකි වගාවක් ලෙස හැඳින්විය හැක. මේ සමඟ යටි වගාවක් ලෙස වෙනත් භෝග යක් වගා කිරීමට හැකියාවක් ද ඇති හෙයින් අතිරේක ආදායම් උත්පාදනය කිරීමේ හැකියාවක් ද ඇත. වාණිජ වගාවක් ලෙස පවත්වාගෙන යාම සඳහා පඳුරු පාලන ක්‍රමය භාවිතා කරයි. බහු වාර්ෂික ක්‍රමයට මෙය පවත්වාගෙන යා හැකිය.

2. අමුද්‍රව්‍ය

- ගුණාත්මක පටක රෝපිත පැළ
- පොහොර - යූරියා, TSP හා MOP යන පොහොර වර්ග අවශ්‍ය වේ. කාබනික පොහොර පමණක් යෙදීම මගින් ද හොඳ අස්වැන්නක් ලබා ගත හැකිය.

3. වෙළඳපොල

මෙම කෙසෙල් ප්‍රභේදය සඳහා වෙළඳපොල තුළ පාරිභෝගික ඉල්ලුම ඉහළ මට්ටමක පවතින අතර විශේෂයෙන් කෙසෙල් යනු කාබෝහයිඩ්‍රේට්, තන්තු, විටමින් හා ඛණිජ ලවණ බහුල මෙන්ම දිරවීමට පහසු ආහාරයකි. කොළඹ සහ නාගරික ප්‍රදේශවල ඇම්බන් කෙසෙල් සඳහා වැඩි ඉල්ලුමක් පවතී. එපමණක් නොව කායවර්ධන මධ්‍යස්ථාන මගින් මෙම කෙසෙල් වර්ගය ආහාර අතිරේකයක් ලෙස නිර්දේශ කිරීම නිසා තරුණ පරම්පරාව අතර විශේෂයෙන් ජනප්‍රියව පවතී. එසේම සුපිරි වෙළඳසැල් වෙතින් ද ඇම්බන් කෙසෙල් සඳහා වන ඉල්ලුම ඉහළ මට්ටමක පවතී.

4. ආයෝජනය

අක්කර 1 ක භූමි ප්‍රමාණයක පැළ 400ක කෙසෙල් වගාවක් සඳහා ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල. (මෙහිදී ව්‍යවසායකයා යොදා ගන්නා භූමිය හා බිම් සැකසීමට යොදා ගන්නා ක්‍රමවේදය අනුව වැය වන වියදම වෙනස් විය හැකි ය.) මෙම මුදල ආයෝජනය කර අවුරුදු 3ත් 5ත් අතර කාලයක් මාස හතරෙන් හතරට අස්වැන්න ලබා ගත හැකිය.

ස්ථාවර ප්‍රාග්ධන වියදම	- රු. 212,700.00
කාරක ප්‍රාග්ධන පිරිවැය	- රු. 113,000.00
මුළු එකතුව	- **රු. 325,700.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර අක්කරයක වගා බිම්කඩ සඳහා වන ඉඩමේ වටිනාකම අන්තර්ගත කර නැත.

අංකය	විස්තරය	වටිනාකම (රු.)
01	බිම සැකසීම (ශ්‍රමය සඳහා)	15,000.00
02	කාණු දැමීම හා ජල සම්පාදනයට	35,000.00
03	වලවල් කැපීම (ශ්‍රමය සඳහා)	12,000.00
04	පැළ සිටුවීමට පෙර යොදන පොහොර	64,500.00
05	පොහොර යෙදීමට (ශ්‍රමය සඳහා)	2,000.00
06	පැළ සිටුවීම (ශ්‍රමය සඳහා)	12,000.00
07	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	
	(උදළු, මුල්ලු, දියර ඉසින ටැංකිය ඇතුළුව)	24,200.00
08	කෙසෙල් පැළ සඳහා වියදම (පැළ 400 x රු. 120.00)	48,000.00
	එකතුව	212,700.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

පළමු මාස හතරෙන් පසුව දැරීමට සිදුවන වියදම අවම බැවින් මාස 4ක කාල පරාසයක් සඳහා පමණක් කාරක ප්‍රාග්ධනය ගණනය කරන ලදී.

අංකය	විස්තරය	මාස 4 ක් සඳහා වියදම (රු.)
01	ශ්‍රමය	100,000.00
02	පොහොර	9,000.00
03	වෙනත්	4,000.00
	එකතුව	113,000.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම වගාව ආරම්භ කර පළමු අස්වැන්න ලබා ගැනීමට මාස 12 ක කාලයක් ගත වන අතර ඉන් පසු මාස 4න් 4ට අස්වැන්න ලබා ගැනීමට හැකියාව ඇත. කෙසෙල් කැනක බර කි.ග්‍රෑ. 25 ක් (එක් කැනක බර කි.ග්‍රෑ. 20ත් 40ත් අතර වේ) සහ කෙසෙල් කිලෝ 1ක විකුණුම් මිල රු. 100.00 ක් ලෙස සලකා ඇත.

ඒ අනුව දෙවන වසරේ සිට ශුද්ධ ලාභය,

වසරක විකුණුම් ආදායම = (කෙසෙල් කැන් 400 × කි.ග්‍රෑ. 25) × රු. 100.00
= රු. 1,000,000.00

වාර්ෂික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත් වියදම්

වාර්ෂික සෘජු පිරිවැය = රු. 27,000.00 + රු. 425,000.00 + රු. 12,000.00
= රු. 464,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරනු ලබන අනෙකුත් වියදම් වේ. (ජලය, ඉන්ධන, ප්‍රවාහනය, අලෙවි වියදම් හා ක්ෂය වියදම් ආදී) එය මාස 4ක් සඳහා රු.1 2,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

- මේ තුල නිෂ්පාදන අපතය 3%ක් ලෙස සලකා රු. 30000.00 ක් (1,000,000.00 × 3%) වක්‍ර පිරිවැය තුළ අන්තර්ගත කර ඇත.

මුළු වක්‍ර පිරිවැය = රු. 12,000.00 ×3 + රු. 30,000.00 = රු. 66,000.00

වාර්ෂික ශුද්ධ ලාභය	= වාර්ෂික විකුණුම් ආදායම - වාර්ෂික මුළු පිරිවැය
	= රු. 1,000,000.00 - (රු. 464,000.00 + රු. 66,000.00)
	= රු. 470,000.00
මාසික සාමාන්‍ය ශුද්ධ ලාභය	= වාර්ෂික ශුද්ධ ලාභය මාස 12
	= රු. 39,000.00

ව්‍යාපාරිකයා විසින්ම වගා කටයුතු සිදු කරයි නම්, ඔහුට මාසයකට ශ්‍රම වැටුප රු. 25,000.00 හා මාසික සාමාන්‍ය ශුද්ධ ලාභය ලෙස රු. 39,000.00ක මුදලක් උපයා ගත හැකිය.

වෙනත්

පළමු වසරේදී මෙම වගාවෙන් ආදායම් ඉපැයීමට නොහැකි නිසා ඇම්බන් වගාවත් සමඟ යටි වගාවක් ලෙස නයි මිරිස් හෝ කිරි අල වැනි අතිරේක භෝගයක් වගා කිරීම මගින් සාර්ථක අස්වැන්නක් ලබා ගනිමින් පළමු වසරේ සිට ආදායම් උත්පාදනය කර ගත හැකි ය.

වියළි කහ නිෂ්පාදනය

1. හැඳින්වීම

කහ යනු දෛනික ආහාර නිෂ්පාදනයේ අත්‍යවශ්‍ය ආහාරමය ද්‍රව්‍ය විශේෂයකි. එමෙන්ම මෙය විෂබීජ නාශක ගුණයෙන් මෙන්ම ඖෂධීය වටිනාකමෙන් යුක්ත වන අතර ආයුර්වේද රූපලාවන්‍ය ක්ෂේත්‍රයේදී අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය මූලාශ්‍රයක් ලෙස භාවිතා කරයි. මෙම කරුණු සාක්ෂාත් කරගැනීමට විකල්ප නොමැති වීම හේතුවෙන් ඉතා ඉහළ වෙළඳපොලක් කහ නිෂ්පාදනයට හිමි කර ගත හැක. මේ අනුව කහ නිෂ්පාදනය මිනිස් ශ්‍රමය බහුලව යොදා ගනිමින් ගෘහාශ්‍රිතව අවම ඉඩ ප්‍රමාණයකින් හා අවම ප්‍රාග්ධනයකින් ආරම්භ කල හැකි ඉතාමත් වටිනා ව්‍යාපාරික අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- බීජ කහ
- ඩොලමයිට් හා කොම්පෝස්ට් පොහොර
- දිලීර නාශක

3. වෙළඳපොල

දේශීය ලංකා කහ අලවල ගුණාත්මක වටිනාකම ඉතා ඉහළ අගයක් ගනී. බීජ කහ අල, අමු කහ අල, වියලන ලද කහ, කහ කුඩු, ආදී ඕනෑම ආකාරයකින් වෙළඳපොල වටිනාකමක් නිර්මාණය කර ගත හැකි වේ. වියලන ලද කහ නිෂ්පාදන මූලික වශයෙන් දේශීය ආහාර නිෂ්පාදනයේ නියැලෙන්නන්, කුළු බඩු නිෂ්පාදකයින්, ආයුර්වේද රෝහල්, ආයුර්වේද රූපලාවන්‍යාගාර ආදී වූ වෙළඳපොල කාණ්ඩයකට පහසුවෙන් අලෙවි කල හැකිය. එමෙන්ම කහ කුඩු නිෂ්පාදනය සඳහා ආනයනය සීමා වීම තුලින් ඉතා ඉහළ ඉල්ලුමක් වර්තමානයේ දේශීය වෙළඳපොල තුළ නිර්මාණය වී ඇති අතර කහ කුඩු විෂබීජ නාශකයක් ලෙස දමිළ ජනකොටස් අතර වඩාත් ප්‍රචලිත වීම තුලින් ද පුළුල් වෙළඳපොලක් නිර්මාණය වී ඇත. විජලන යන්ත්‍ර භාවිතා කර නිෂ්පාදනය කරන කහ සඳහා වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් පවතී.

4. ආයෝජනය

පර්චස් 10 ක භූමියක මිනිස් ශ්‍රමය උපයෝගී කොට ගෙන කරනු ලබන කහ වගාවක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 118,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස අටක් සඳහා)	= රු. 91,600.00
	මුළු එකතුව	= **රු. 210,100.00**

කුලී පදනම මත විජලන සේවාව ලබා ගත හැකි ප්‍රදේශයක නම්, මූලික අවස්ථාවේදී විජලන යන්ත්‍රය සඳහා ආයෝජනය නොකර ව්‍යාපාරය ආරම්භ කළ හැකි ය.

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර පර්චස් 10ක ඉඩමේ වටිනාකම අන්තර්ගත කර නැත. (තමා සතු ඉඩමක වගා කටයුතු සිදු කරන බව උපකල්පනය කර ඇත.) ශ්‍රමය මූලික කර ගත්, පළල අඩි 4 ක්, දිග අඩි 10ක් හා උස අඟල් 06 කින් යුතු පාත්ති සහිත කහ වගාවක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය

අංක	විස්තරය	වටිනාකම (රු.)
01	වගා බිම් සැකසීමට	5,000.00
02	වගා පාත්ති සැකසීම (මිනිස් ශ්‍රමය භාවිතයෙන්)	2,000.00
03	විජලන යන්ත්‍රය	110,000.00
04	උපකරණ වියදම් (උදැල්ල, මල් බාල්දිය)	1,500.00
	එකතුව	118,500.00

4.2 කාරක ප්‍රාග්ධන වියදම

මාස 08 ක් සඳහා දෛනික වගා නඩත්තු වියදම් ඇතුළත් ඇස්තමේන්තු ගත මුදල

අංක	විස්තරය	විදයම (රු.)
01	බීජ කහ අල (රු. 550 × කි.ග්‍රෑ. 50)	27,500.00
02	වගා ශ්‍රම වියදම	32,000.00
03	කාබනික පොහොර	15,000.00
04	බීජ අල සිටුවීමේ ශ්‍රමය	2,000.00
05	අස්වැන්න නෙලීමේ ශ්‍රම වියදම	2,000.00
06	අස්වැන්න විජලනය සඳහා විදුලිය හා ඉන්ධන	1,000.00
07	දිලීර නාශක	100.00
08	වෙනත් වියදම්	12,000.00
	එකතුව	91,600.00

5. ශුද්ධ ලාභය

වගා කර මාස 08 කින් පසුව අසවැන්න නෙළා ගත හැකි වන අතර වෙළඳපොල මිල ගණන් උච්චාවචනය වන බැවින් පවතින මිල ගණන් සැලකිල්ලට ගෙන ඇත. වියළි කහ කිලෝ 1ක මිල රු 3,000ක් ලෙස සලකා ඇත. වගා කරන ලද බීජ මඟින් අස්වැන්න කි.ග්‍රෑ. 1 ට කි.ග්‍රෑ. 15 ක් ලබා ගත හැකි බවත් අමු කහ විජලනයේ දී 6 ගුණයකින් අඩු වන බවත් උපකල්පනය කර ඇත.

විකුණුම් ආදායම = (නෙළාගත් අස්වැන්න කි.ග්‍රෑ 750/6) × කි.ග්‍රෑ එකක වෙළඳපොල මිල
= කි.ග්‍රෑ 125 × රු. 3,000.00
= **රු. 375,000.00**

මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු ද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම
= රු. 42,600.00 + රු. 38,000.00+ රු. 6,000.00
= රු. 86,600.00

වක්‍ර වියදම් - ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ. (ප්‍රවාහන, අලෙවි හා ක්ෂය ආදී අනෙකුත් වියදම්) මාස 8 ක් සඳහා රු. 12,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාස 8 ක් සඳහා ශුද්ධ ලාභය	= විකුණුම් ආදායම - මුළු පිරිවැය
	= රු. 375,000.00 - (රු. 86,600.00 + රු. 12,000.00)
	= රු. 276,400.00
මාසික දළ සාමාන්‍ය ශුද්ධ ලාභය	= රු. 34,550.00

ව්‍යාපාරිකයා විසින් ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට ශ්‍රම වැටුප ලෙස රු. 4,750.00 ක් හා මාසික සාමාන්‍ය ශුද්ධ ලාභය රු. 34,550.00 උපයාගත හැකිය

වෙනත්

කහ වගාවේ අස්වැන්න නොමැති කාලච්ඡේද වලදී විජලන යන්ත්‍රය කුලී පදනම මත ලබා දීමෙන් අමතර ආදායම් ලබා ගත හැකිය. (එළවලු, පලතුරු ආදී විජලන කටයුතු සඳහා)

කාබනික දියර පොහොර නිෂ්පාදනය

1. හැඳින්වීම

වර්තමාන සමාජයේ සියලුම දෙනා ඔවුන්ගේ ශරීර සෞඛ්‍ය පිළිබඳව සැලකිලිමත් වන යුගයක ජීවත්වෙන අපිද ලබා ගන්නා ආහාර පිළිබඳව වඩා සැලකිලිමත් වෙමු. විශේෂයෙන් බෝ නොවන රෝග සම්බන්ධවද ප්‍රජාවගේ අවධානය යොමුව ඇති අතර, ඒ හේතුවෙන්ම කාබනික නිෂ්පාදන කෙරේ පාරිභෝගිකයා යොමු වෙමින් පවතී. කාබනික ආහාරමය නිෂ්පාදනයන් උදෙසා කාබනික පොහොර අවශ්‍ය වේ. වෙළඳපොළ නිවැරදිව හඳුනා ගනිමින් ඉතා සාර්ථකව සිදු කළ හැකි ව්‍යාපාරයක් ලෙස කාබනික දියර පොහොර නිෂ්පාදනය හඳුන්වා දිය හැකි වේ. එමෙන්ම රට තුල රසායනික පොහොර භාවිතා කිරීම සීමා කර ඇති නිසා කාබනික පොහොර සඳහා වැඩි ඉල්ලුමක් රට තුල නිර්මාණය වෙමින් පවතී.

කාබනික පොහොර, විවිධ ආකාරයට නිෂ්පාදනය කරනු ලබයි. වර්තමාන වෙළඳපොල තුළ කාබනික දියර පොහොර වර්ග කිහිපයක් ඇති අතර, ව්‍යාපාර ලෙස එම වර්ග කීපයම හෝ එක් වර්ගයක් නිෂ්පාදනය කිරීම කල හැකිය. ව්‍යාපාරික වශයෙන් ලාභදායී වනුයේ කාබනික පොහොර වර්ග කීපයක් නිෂ්පාදනය කර වෙළඳපොලට එක්කිරීමට කටයුතු කිරීමයි.

1.	මාළු කටු නිස්සාරය පොහොර	Fish tonic
2.	කොම්පෝස්ට් දියර පොහොර	Compost tea
3.	කොම්පෝස්ට් පණු පොහොර	Vermicompost tonic.

2. අමුද්‍රව්‍ය

වඩා සාර්ථක කාබනික දියර පොහොර නිෂ්පාදනය කිරීම සඳහා පහත අමුද්‍රව්‍ය වර්ග අවශ්‍ය වේ

- **මාළු කටු නිස්සාරය** **Fish tonic**
  ඉවත දමන මාළු හෝ මාළු අපද්‍රව්‍ය
  සීනි හෝ සක්කර
  පිරිසිදු ජලය (ක්ලෝරීන් මිශ්‍ර නොවු)

- **කොම්පෝස්ට් දියර පොහොර** **Compost tea**
  ගුණාත්මයෙන් යුතු කොම්පෝස්ට්
  සීනි හෝ සක්කර හෝ ඉවතලන පලතුරු යුෂ
  පිරිසිදු ජලය (ක්ලෝරීන් මිශ්‍ර නොවු)
  කොම්පොස්ට් බහාලීමට රෙදි කවරයක්
  ආවරණය කිරීමට දැල් සහ ලණු කැබැල්ලක්

- **කොම්පාස්ට් පණු පොහොර** **Vermicompost tonic**
  අමු ගොම
  ගිනිසිරියා (වැටමාර) වල්සූරියකාන්ත කොළ
  මැටල් (කුඩා ගල් කැබලි) ගඩොල් කැබලි, වැලි (ස්වාභාවික පෙනේරයක් සේ පතුළට යෙදීමට)
  පිරිසිදු ජලය (ක්ලෝරීන් මිශ්‍ර නොවු)

3. වෙළඳපොල

කොම්පෝස්ට් සඳහා වර්තමානයේ වඩා හොඳ වෙළඳපොලක් ඇති වෙමින් පවතී. වෙනදාටත් වඩා කාබනික නිෂ්පාදන සඳහා ප්‍රමුඛ ස්ථානයක් සහ අවශ්‍ය සහාය රජය මගින් සලසා දෙනු ලබන පසුබිම තුළ කාබනික කාෂිකාර්මික අමුද්‍රව්‍ය (පොහොර සහ කෘමිනාශක) සඳහා සුවිශේෂී වෙළඳපොළක් නිර්මාණය වෙමින් පවතී. කාබනික පොහොර නිෂ්පාදන මිල දී ගන්නා රජයේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, අවශ්‍ය නම් මෙම නිෂ්පාදන එම අදාළ ආයතන හරහා රාජ්‍ය අංශය සඳහා අලෙවි කිරීමේ හැකියාවද පවතී. කාබනික පොහොර සම්බන්ධයෙන් පෞද්ගලික අංශයෙන්ද ඉල්ලුමක් පවතින අතර වෙළඳපොළේ ක්‍රියාත්මක පොහොර අලෙවිකරණ ආයතන, මල් පැළ සහ පැළ තවාන්කරුවන්, සුපිරි වෙළඳසැල් හරහාද අලෙවි කළ හැකි වේ.

මෙම නිෂ්පාදන සෘජු අලෙවිකරණයන් හරහා ගොවීන්ට විකිණීමට ද අවස්ථාව ඇති අතර, මෙම නිෂ්පාදන සම්බන්ධව ඉතා පුළුල් වෙළඳපොළ අවස්ථාවන් පවතී. ගුණාත්මක නිෂ්පාදනයක් තුළින් වඩා හොඳ තරඟකාරී වෙළඳපොළක් අත්පත් කර ගැනීමට හැකි අතරම අපනයන වෙළඳපොලට පිවිසීමටද කාබනික දියර පොහොර නිෂ්පාදනය යොදා ගත හැකි වේ.

4. ආයෝජනය

මාසිකව කාබනික දියර පොහොර ලීටර 180ක් නිෂ්පාදනය සඳහා කළයුතු අවම ආයෝජනය පහත පරිදි දැක්විය හැකිය.

විස්තරය		මුදල (රු.)
4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	61,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	77,500.00
	මුළු එකතුව	**138,500.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුළත් ඇති අතර ව්‍යාපාර ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	අයිතමය	අවශ්‍ය ගණන	ඒකකයක වටිනාකම (රු.)	මුළු වටිනාකම (රු.)
1	ගොඩනැගිල්ල	1	50,000.00	50,000.00
2	මූඩි සහිත ප්ලාස්ටික් බැරල්	4	2,500.00	10,000.00
3	දියර පෙරීමට ලොකු පෙනේර	2	500.00	1,000.00
	එකතුව			**61,000.00**

4.1 කාරක ප්‍රාග්ධනය

දිනකට පොහොර ලීටර 180ක් නිෂ්පාදනය කරන ආකාරයට සතියකට දින 6ක් වැඩකරන ලෙස සලකා මෙම ඇස්තමේන්තුව සකසා ඇත.

අංකය	අයිතමය	මාසික වියදම (රු.)
1	අමුද්‍රව්‍ය වියදම	16,500.00
2	ඇසුරුම් වියදම	23,000.00
3	ගෙන ඒමේ කුලිය	1,000.00
4	සේවක වැටුප්	36,000.00
5	වෙනත්	1,000.00
	එකතුව	**77,500.00**

5. මාසික ශුද්ධ ලාභය

මාසිකව කාබනික දියර පොහොර ලීටර 180ක් නිෂ්පාදනය කරන්නේ නම්, වර්තමාන මිලගණන් යටතේ මාළු නිස්සාරය දියර පොහොර ලීටරය එකක් රු. 900.00ක මිලකටත්, පණුදියර පොහොර ලීටර් එකක් රු. 800.00ක මිලකටත්, කොම්පෝස්ට් දියර පොහොර ලීටර එකක් රු. 200.00ක මිලකටත් අලෙවි කළ හැකිය. මෙම ව්‍යාපාරයේ සතියකට දින 6 බැගින් මසකට දින 24ක් වැඩකරයි නම් මාසික ශුද්ධ ලාභය පහත පරිදි ගණනය කළ හැකිය.

මාසික විකුණුම් ආදායම = රු. 136,000.00
(මාළු නිස්සාරය - ලීටර් 100 × රු. 900.00 + පණුදියර ලීටර් 50 × රු. 800.00 + කොම්පෝස්ට් දියර ලීටර් 30 × රු. 200.00)

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය + සෘජු ශ්‍රමය + සෘජු වෙනත් වියදම

මාසයක සෘජු පිරිවැය = රු. 16,500.00 + රු. 36,000.00 + රු. 25,000.00
= රු. 77,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ. (ජලය, විදුලිය, ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 23,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ජලය - රු. 500.00 + විදුලිය - රු. 500.00 + ප්‍රවාහන - රු. 2000.00 + අලෙවි - රු. 20,000.00)

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 136,000.00 - (රු. 77,500.00 + රු. 23,000.00)
= රු. 136,000.00 - රු. 100,500.00
= රු. 35,500.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම්, ඔහුට මසකට රු. 36,000.00ක වැටුපක් වෙන් කර ගත හැකි අතර, රු. 35,500.00 ශුද්ධ ලාභයක් උපයා ගත හැකි වේ.

බද්ධ පලතුරු පැළ නිෂ්පාදනය

1. හැඳින්වීම

වර්තමානයේ බොහෝ ප්‍රදේශ අධික නාගරීකරණයට නතුවෙමින් පැවතීම හේතුවෙන් වගාකළ හැකි ඉඩකඩ සීමාසහිත වීම මත ස්වභාවිකව වැවෙන පළතුරු භෝග වගාකිරීමට නොහැකි වීම ප්‍රධාන ගැටලුවක් ලෙස හඳුනා ගෙන ඇත. මේ නිසා බද්ධ පලතුරු වගාව ජනප්‍රිය වගා ක්‍රමයක් බවට පත්ව ඇත. බද්ධ පලතුරු පැළ යනු කුඩා ඉඩ ප්‍රමාණයක වැවෙන ගුණාත්මක පලතුරු පැළ නිෂ්පාදනයකි. ජනප්‍රිය බද්ධ පලතුරු පැළ ලෙස අඹ, දොඩම්, අලිපේර සහ ජමනාරං හඳුනා ගෙන ඇති අතර, කොස් පැළ බද්ධ කිරීම කෙරෙහි ද වර්තමානයේ විශේෂ අවධානය යොමුව ඇත. බද්ධ පැළ ව්‍යාපාරය පහසුවෙන් සොයාගත හැකි අමුද්‍රව්‍ය මත ගෘහාශ්‍රිත කර්මාන්තයක් ලෙස ඇරඹිය හැකි ව්‍යාපාරයකි. මේ සඳහා ව්‍යාපාරය ඇරඹීමට පෙර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, බීජ සහතික කිරීමේ සේවය යටතේ ලියාපදිංචි විය යුතුයි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

අඹ, දොඩම්, අලිපේර, ජමනාරං, කොස් බීජ සහ එම වර්ග වල දෙමුහුන් ශාකවල අතු කැබලි
කළු පොලිතීන් වගා මාධ්‍ය (මතුපිට පස් : කොම්පෝස්ට් = 1:1)
පොහොර (නිල් කැට)
දිලීර නාශක
වගා මළු (අඟල් 7 × 5)

3. වෙළෙඳපොල

බද්ධ පලතුරු පැළ ඉක්මනින් එල දරන බැවින් ද, කුඩා ඉඩ ප්‍රමාණයක පැතිරී වැඩෙන බැවින් ද, බඳුන් ගත ශාකයක් ලෙස වැවිය හැකි බැවින් ද වර්තමානයේ ජනතාව අතර ප්‍රචලිත වී ඇත. තවද නාගරික ජනතාව අතර මෙය ප්‍රචලිත වෙමින් පවතින්නේ rooftop garden තේමාව යටතේය. මේවායේ මිල ගණන් ඒකාකාර ස්වභාවයේ පවතී.

4. ආයෝජනය

දිනකට බද්ධ පලතුරු පැළ 20ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කල යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 5,400.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	- රු. 16,800.00
	මුළු එකතුව	- **රු. 22,200.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අනු අංකය	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
01	යන්ත්‍ර සූත්‍ර උපකරණ	950.00
02	සෙකටියරය	850.00
03	මල් බාල්දිය	750.00
04	දියර ඉසිනය	750.00
05	සවල	300.00
06	උදැල්ල	1,200.00
07	අත් ඉස්කෝප්පය	300.00
08	ප්ලාසටික් බේසම	300.00
	එකතුව	5,400.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට බද්ධ පලතුරු පැල 20 ක් නිෂ්පාදනය කරන අතර, සතියකට දින 06 ක් නිෂ්පාදනය කරනු ලැබේ.

අනු අංකය	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම (රු.)
01	අමුද්‍රව්‍ය සඳහා වියදම	800.00	4,800.00
02	ශ්‍රම වියදම දිනකට	1,000.00	6,000.00
03	වෙනත් වියදම	1,000.00	6,000.00
	එකතුව	2,300.00	16,800.00

05. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මසකට දින 25ක් ව්‍යාපාර කටයුතු සිදු කරන අතර එක් දිනකදී බද්ධ පලතුරු පැළ 20 ක් නිෂ්පාදනය සිදු කරන බවට උපකල්පනය කර ඇත. පැළයක විකුණුම් මිල රු. 250.00 කි.

(සාමාන්‍යයෙන් බද්ධ පැළ අලෙවි කළ හැකි මට්ටමට ගෙන ඒමට මාස 3 ක පමණ කාලයක් ගතවන බව සැලකිය යුතුය. ඒ අනුව මාසයක නිෂ්පාදනය වන පැළ)

මාසික විකුණුම් ආදයම (දින 25 × දිනක නිෂ්පාදනය 20 × රු. 250.00 = රු. 125,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම

දිනක සෘජු පිරිවැය = (රු. 800.00 + රු. 1,000.00 + රු. 1,000.00)

= රු. 2,800.00 × දින 25

= රු. 70,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන වියදම් වේ. (ජලය, ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්) එක් මාසයක් සඳහා රු. 20,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය

= රු. 125,000.00 - (රු. 70,000.00 + රු. 20,000.00)

= රු. 125,000.00 - රු. 90,000.00

= රු. 35,000.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදනය කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට රු. 25,000.00 ක ශ්‍රම වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 35,000.00 ක් උපයාගත හැකියි.

මුං ආශ්‍රිත නිෂ්පාදන

(පැළ මුං, මයික්‍රෝ මුං බීන්ස් සහ මුං මාංශ නිෂ්පාදනය

1. හැඳින්වීම

උසස් ගුණාත්වයෙන් යුත් ශාකමය ප්‍රෝටීන් ප්‍රභවයක්, විටමින් හා ඛණිජ අඩංගු පෝෂ්‍යදායි ආහාරයක් මෙන්ම ළදරු ආහාර නිෂ්පාදනයන්හි සංඝටකයක් ලෙස මුං ශ්‍රී ලංකාවේ වියළි හා අතරමැදි කලාපයන්හි වර්ෂා පෝෂිත උස් බිම්වල, යල කන්නයේ කුඹුරු ඉඩම්වල හා තුන්වන කන්නයේ වගාව (අතරමැදි කන්නයේ) සඳහා වැදගත් වන අතිරේක ආහාර බෝගයකි. තවද ප්‍රරෝහණ වන බීජවල විටමින් හා ඛනිජ ලවණ සුලභතාවය වැඩිය. එසේම අපේ රටේ ඉතාමත් ජනප්‍රිය කෙටි කාලීන රනිල බෝගයකි.

ආයුර්වේදයේදි භාවිතා කරන ඖෂධීය ධාන්‍ය වර්ග අතර මුං ඇටවලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මුං ඇට තම්බා හෝ ව්‍යාංජනයක් ලෙස වගේම මුං ඇට කොටා ගන්නා පිටිවලින් විවිධ කැවිලි වර්ග සාදා ගත හැකි වේ. එම කෑම වර්ග ශරීරයට හිතකර හා ගුණදායක බැවින් මුං ඇට පෝෂණ ගුණයෙන් ඉහළ ධාන්‍ය වර්ගයකි. තවද මුං ඇට පැළ කර ලබා ගන්නා පැළ මුං සහ අඟල් 6ක් පමණ දිගට වැඩුණු ළපටි පත්‍ර දෙකකින් යුත් මයික්‍රෝ මුං බීන්ස් නිෂ්පාදනය ද ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත නිෂ්පාදනයන් වේ. ඒවා නිපදවා ඇසුරුම්කර වෙළෙඳපොළට නිකුත් කිරීමේ ව්‍යාපාරයක් යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් තොරව පහසුවෙන් ආරම්භ කළ හැකි වේ. එසේම මුං ඇට තම්බා බ්ලෙන්ඩ් කර එයට තවත් විවිධ අමුද්‍රව්‍ය එකතු කරමින් කුඩා කැබැලිවලට කපා ගැඹුරු තෙලේ බැදීම මගින් මුං මාංශය සාදාගත හැකි අතර එය මස් සඳහා ආදේශක නිෂ්පාදනයක් ලෙස වෙළඳපොලට ඉදිරිපත් කළ හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

පැළ මුං සහ මයික්‍රෝ මුං බීන්ස් යන නිෂ්පාදන සඳහා පිරිසිදු මුං ඇට ප්‍රධානතම අමුද්‍රව්‍ය වේ. එසේම මුං මාංශය සඳහා පිරිසුදු මුං ඇටවලට අමතරව පහත අමුද්‍රව්‍යද යොදා ගනු ලැබේ.

ඉඟුරු / සුදු ළූණු / ගම්මිරිස් කුඩු / මිරිස් කුඩු / ලුණු කුඩු / තෙල් - පිරිසුදු පොල් තෙල් හෝ එළවළු තෙල් වඩාත් යෝග්‍ය වේ.

3. වෙළඳපොල

පෝෂ්‍යපදාර්ථ වලින් පිරිපුන් මුං බීජ ආශ්‍රිත අගය එකතුකල නිෂ්පාදයන් වන පැළ මුං, මයික්‍රෝ මුං බීන්ස් සහ මුං මාංශය වැනි නිෂ්පාදන සඳහා වර්තමානය වනවිට දේශීය වෙළඳපොළ තුළ ඉහල ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතී. ඒ අනුව ළදරු වයසේ සිට මහළු වයසේ අය දක්වා ඕනෑම වයස් කණ්ඩයක පාරිභෝකයින් ඉලක්ක වෙළඳපොළ ලෙස සැලකිය හැකිය. තවද බෝහෝමයක් රෝගී තත්ත්වයන්ට ඖෂධයක් වන මෙම නිෂ්පාදනය නාගරිකව මෙන්ම ග්‍රාමීයවද ඉහළ මිල ගණන් යටතේ වෙළඳපොළට ඉදිරිපත් කළ හැකිය. විශේෂයෙන්ම මුං මාංශය නිර්මාංශික පාරිභෝගිකයින් සඳහා වෙන් වු විශේෂිත නිෂ්පාදනයක් වේ.

තවද, විශේෂයෙන් ම මෙම නිෂ්පාදන මිල ගණන් අතින් ඉහළ බැවින් ප්‍රධාන වශයෙන් මධ්‍යම හා ඉහළ ආදයම් ලබන පාරිභෝගිකයින් අතර ඉහළ ඉල්ලුමක් පැවතිය හැකිය. එසේම විශේෂයෙන්ම ශරීර සෞඛ්‍යය පිළිබඳව වැඩි ලෙස සැලකිල්ලක් දක්වන ප්‍රජාව අතර මෙම නිෂ්පාදන ඉහළ අලෙවියක් සිදු කර ගත හැකිය. සාමාන්‍ය සිල්ලර වෙළඳ සැලේ සිට සුපිරි වෙළඳ සැල් ජාලය දක්වා අලෙවි කිරීමේ හැකියාව ඇත.

පැළ මුං හා මයික්‍රෝ මුං බීන්ස් යන නිෂ්පාදන වෙළඳපොළ තුළ දින 3කට වඩා තබා ගැනීම අපහසු වුවද මුං මාංශය මාස තුනකට ආසන්න කාලයක් වෙළඳපොල තුළ තබා ගැනීමේ හැකියාවක් පවතී. මෙම නිෂ්පාදන සඳහා ඉහළ ආකර්ෂණයකින් යුක්ත ඇසුරුමක් භාවිතා කිරීම තුළින් පාරිභෝගිකයා තුළ ඉහළ ආකර්ෂණයක් ඇති කර ගැනීමේ හැකියාවක් පවතී.

4. ආයෝජනය

දිනකට පැළ මුං ග්‍රෑම් 100 පැකට් 25ක්, මයික්‍රෝ මුං බීන්ස් ග්‍රෑම් 100 පැකට් 25ක් සහ මුං මාංශය ග්‍රෑම් 200 පැකට් 50ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තතමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	=	රු. 41,800.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	=	රු. 65,340.00
	මුළු එකතුව	=	**රු. 107,140.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	බ්ලෙන්ඩරය (750w)	18,000.00
02	ස්ටීමරය	9,950.00
03	ඉලෙක්ට්‍රික් තරාදිය	5,000.00
04	ප්ලාස්ටික් බේසම්	1,500.00
05	සීලර් යන්ත්‍රය	5,000.00
06	තෙල් තාච්චිය	850.00
07	වෙනත් උපකරණ	1,500.00
	එකතුව	41,800.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට පැළ මුං සහ මයික්‍රෝ මුං බීන්ස් ග්‍රෑම් 100 පැකට් 50ක් බැගින් සහ මුං මාංශය ග්‍රෑම් 200 පැකට් 25 ක් නිෂ්පාදනය කරන අතර සතියකට දින 6ක් නිෂ්පාදන කටයුතු සිදු කරනු ඇතැයි උපකල්පනය කර ඇත. එසේම පැළ මුං හා මයික්‍රෝ මුං බීන්ස් සෑදීමේ දී වතුරේ පෙඟවීම සිදු කරන නිසා එක් මුං කිලෝ එකකින් ග්‍රෑම් 100 පැකට් 25ක් සෑදිය හැකි බව උපකල්පනය කර ඇත.

එසේම මුං මාංශය එක් මුං ඇට කිලෝ එකකින් ග්‍රෑම් 200 පැකට් 6.5 ක් පමණ සෑදිය හැකි බව උපකල්පනය කර ඇත.

තවද මුං ඇට මිල කාලයෙන් කාලයට විවිධ හේතූන් මත වෙනස් විය හැකිය.

අංක	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම(රු.)
01.	අමුද්‍රව්‍ය වියදම	7,990.00	47,940.00
03.	ශ්‍රම වියදම	1,000.00	6,000.00
04.	ඇසුරුම් වියදම්	1,500.00	9,000.00
05.	සෘජු වෙනත් වියදම්	400.00	2,400.00
	එකතුව	-	65,340.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන - මෙම ව්‍යාපාරය මාසයකට දින 24 ක් ව්‍යාපාර කටයුතු සිදු කරන බවට උපකල්පනය කර ඇත.

වර්තමාන වෙළඳපොල මිල ගණන් යටතේ පැළ මුං ග්‍රෑම් 100 පැකට් 01 ක මිල රු. 100.00 ක් ද මයික්‍රෝ මුං බින්ස් ග්‍රෑම් 100 පැකට් 01 ක මිල රු. 120.00 ක් ද මුං මාංශය ග්‍රෑම් 200 පැකට් 01 ක් රු. 240.00 ක් ලෙස වෙළඳපොලට නිකුත් කළ හැකිය.

මාසික විකුණුම් ආදායම (දින 24 × දිනක නිෂ්පාදනය × ඒකක මිල රු.)

පැළ මුං නිෂ්පාදනය	= දින 24 × පැකට් 25 × මිල රු. 100.00)	= රු. 60,000.00
මයික්‍රෝ මුං බීන්ස්	= දින 24 × පැකට් 25 × මිල රු. 140.00)	= රු. 84,000.00
මුං මාංශය	= දින 24 × පැකට් 25 × මිල රු. 340.00)	= රු. 204,000.00
මාසික විකුණුම් ආදායම		= රු. 348,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම

දිනක සෘජු පිරිවැය = රු. 7,990.00 + රු. 1000.00 + රු. 1,900.00
රු. 10,890.00 × දින 24
රු. 261,360.00

වක්‍ර වියදම්-
ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා කරන වියදම් වේ. (ජලය, විදුලි, ප්‍රවාහන, අලෙවිකරණ,ආදි අනෙකුත් වියදම්) එය මාසයක් සදහා රු. 14,500.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	=	මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	=	රු. 348,000.00 - (රු. 261,360.00 + රු. 14,500.00)
	=	රු. 348,000.00 - රු. 275,860.00
	=	රු. 72,140.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට ශ්‍රම වැටුප ලෙස රු. 24,000.00ක මුදලක් හා ශුද්ධ ලාභය ලෙස රු. 72,140.00ක් පමණ උපයාගත හැකි වේ.

තේ පැළ තවාන් පාලනය

1. හැඳින්වීම

ලොව වැඩිම පිරිසකගේ ප්‍රියතම පානය බවට පත්ව ඇති 'තේ ' ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික වැවිලි අතුරින් ප්‍රමුඛ ස්ථානයක් හිමි කරගෙන ඇත. ප්‍රධාන වශයෙන් ලංකාවේ උඩරට නිරිතදිග කලාපය, ඌව ඊසාන දිග කලාපය, පහත රට නිරිත දිග කලාපය තුල තේ වගාව ව්‍යාප්ත වී ඇති අතර මෙම ප්‍රදේශ මූලික කරගෙන කුඩා තේ වතු හිමියන් 399,313 ක් විසින් හෙක්ටයාර් 122,604 ක තේ වගාව පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය හා ඒකාබද්ධව පවත්නා ව්‍යාපාරික අවස්ථාවක් ලෙස තේ රිකිලි පැළ තවාන් පාලනය හඳුනාගත හැකිය. එමෙන්ම වාර්ෂිකව ඉහළ ඉල්ලුමක් පවතින බැවින් යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් තොරව, ගෘහාශ්‍රිතව ආරම්භ කළ හැකි ව්‍යාපාරික අවස්ථාවකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- පස් - වැලි සහිත පස් මේ සඳහා සුදුසු වේ.
- පොලිතීන් පැකට් - තේ රිකිලි සිටුවීම් සඳහා අවශ්‍ය ප්‍රමාණ වලින් පොලිතින් මලු මිලදී ගත හැකිය
- පොහොර - T 65, දියර පොහොර, ZINK
- තේ රිකිලි - නිසි ප්‍රමිතියෙන් යුතු සිටුවීමට ගන්නා තේ රිකිලි

3. වෙළෙඳපොල

ඉහළ ගුණාත්වයෙන් යුතු බඳුන්ගත රිකිලි තේ පැළ සඳහා වර්තමානයේ ඉතා හොඳ වෙළෙඳපොලක් නිර්මාණය වී තිබේ. ශ්‍රී ලංකාවේ වියළි කළාපය හැරුණු කොට අනෙක් සෑම පළාතක්ම ආවරණය වන පරිදි තේ වගාව ව්‍යාප්ත වී ඇති අතර කුඩා තේ වතු හිමියන් විශාල පිරිසක් තේ වගාව සඳහා යොමු වී ඇති බැවින් රිකිලි තේ පැළ සඳහා ඉහළ මිලක් මේ වන විට නිර්මාණය වී තිබේ.

මෙය ප්‍රධානම වශයෙන් වසරකට කන්න දෙකක් යටතේ අලෙවි කරනු ලබයි. එනම් ඊසාන දිග මෝසම් කාලය හා නිරිත දිග මෝසම් වර්ෂා කාලයයි. මෙම කාලයන්හි දී කුඩා තේ වතු හිමියන් ප්‍රධාන වශයෙන් තේ පැළ මිලදී ගනු ලබන්නේ අලුත් වගා කටයුතු හා නැවත වගා කිරීමේ පරමාර්ථයෙනි. දළ වශයෙන් වාර්ෂිකව හෙක්ටයාර 1027 නැවත වගා හා හෙක්ටයාර 435 ක් අලුත් වගා සිදු කෙරේ.

4. ආයෝජනය

වර්ෂයකට රිකිලි තේ පැළ 25,000 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු මුදල (තේ පැළයක් විකුණුම් තත්ත්වයට පත්වීම සඳහා වසරක කාලයක් ගතවේ.)

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 95,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (වර්ෂයක් සඳහා)	= රු. 161,000.00
	මුළු එකතුව	= **රු. 256,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී මූලිකව භූමිය සකස් කර ගැනීමට අදාළ වියදම ඇතුළත් කර ඇති අතර භූමිය සඳහා මුදලක් ඇස්තමේන්තු ගත කර නොමැත. දළ වශයෙන් පර්.20 ක භූමි ප්‍රමාණයක තේ පැල 25,000 ක් නිෂ්පාදනය කළ හැකි බව ඇස්තමේන්තු කර ඇත.

අංක	උපකරණ	වටිනාකම (රු.)
01	මූලික බිම් සකස් කිරීම (පාත්ති)	30,000.00
02	සෙවන දැල්	36,000.00
03	පාත්ති සඳහා ලී දඬු	15,000.00
04	උපකරණ වියදම් (විල්බැරෝ, මල් බාල්දි, උදළු, තාච්චි, සවල්, වතුර බැරල්, මුල්ලු)	14,000.00
	එකතුව	95,000.00

4.2 කාරක ප්‍රාග්ධන වියදම

පැල 25,000 ක නිමැවුමක් ලබා ගැනීමට පැල 28,000 ක් සඳහා අමුද්‍රව්‍ය හා අනෙකුත් වියදම් අදාළ කර ඇත. එක් වර්ෂයක් සඳහා,

අංක	විස්තරය	වියදම (රු.)
01	අමුද්‍රව්‍ය සඳහා වියදම (පස්, පොලිතීන් පැකට්, පොහොර, තේ රිකිලි)	74,000.00
02	ශ්‍රම වියදම	77,000.00
03	වෙනත් වියදම්	10,000.00
	එකතුව	161,000.00

5. මාසික ශුද්ධ ලාභය

තේ රිකිලි පැලයක මිල සාමාන්‍යයෙන් රු.25-30 අතර මිලකට අලෙවි වන අතර පැළයේ ගුණාත්මක භාවය හා ප්‍රදේශය අනුව මිල ගණන් වෙනස් වේ.

මෙහිදී පැළයක මිල රු.25 ලෙස උපකල්පනය කර ඇත.

වසරක විකුණුම් ආදායම = පැළ 25,000 × රු. 25.00
= රු. 625,000.00

වාර්ෂික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම
වාර්ෂික සෘජු පිරිවැය = රු. 74,000.00 + රු. 107,000.00 + රු. 10,000.00
= රු. 191,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරනු ලබන අනෙකුත් වියදම් වේ. (විදුලිය, ජලයල ප්‍රවාහනය, අලෙවි වියදම් හා ක්ෂය වියදම් ආදී) එය වර්ෂයක් සඳහා රු. 50,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

වාර්ෂික ශුද්ධ ලාභය = වාර්ෂික විකුණුම් ආදායම - වාර්ෂික මුළු පිරිවැය
= රු. 625,000.00 - (රු. 191,000.00 + රු. 50,000)
= රු. 384,000.00

මාසික ශුද්ධ ලාභය = වාර්ෂික ශුද්ධ ලාභය / 12
= රු. 384,000.00 /12

ආසන්න වශයෙන් මසකට ශුද්ධ ලාභය = රු. 32,000.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට ශ්‍රම වැටුප ලෙස රු. 8,500.00 ක මුදලක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 32,000.00 ක මුදලක් උපයාගත හැකිය

විසිතුරු මත්ස්‍ය වගාව

1. හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ ඉහළ විභවතාවයක් ඇති විසිතුරු මත්ස්‍ය වගාව කුඩා පරිමාණ ව්‍යාපාරයක සිට මහා පරිමාණ අපනයන ව්‍යාපාරයක් දක්වා දියුණු කළ හැකි වඩාත් ප්‍රචලිත ව්‍යාපාර ක්ෂේත්‍රයකි. ගෝලීය වෙළඳපොල තුළ ද මේ සඳහා පවතින්නේ දිනෙන් දින ඉහළ යන ඉල්ලුමකි. එහෙත් ලංකාව තවමත් විදේශ වෙළඳපොලේ මතස්‍ය සැපයුම සඳහා දායකත්වය දක්වන්නෙ 2% ක් තරම් අඩු අගයකි. මෙය දේශීය වශයෙන් ද ඉහළ ඉල්ලුමක් ඇති අඩු ආයෝජනයකින්, අඩු ඉඩ ප්‍රමාණයකින් ආරම්භ කළ හැකි ව්‍යාපාර අවස්ථාවකි. මසුන් වගා කිරීම සඳහා සිමෙන්ති ටැංකි, වීදුරු ටැංකි හෝ මඩ පොකුණු භාවිතා කළ හැකිය.

2. අවශ්‍ය ද්‍රව්‍ය

මත්ස්‍ය වගාව ආරම්භ කිරීම සඳහා සුදුසු බිමක් තිබීම, ජලයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක බව, අලෝකය යන මූලික සාධක අත්‍යාවශ්‍ය වේ.

සිමෙන්ති ටැංකි තුළ මත්ස්‍ය වගාව සිදු කිරීමේ දී ඔක්සිජන් , කොන්ඩිස්, විසිතුරු මාළු පැටවුන් සහ මාළුන් සඳහා ආහාර අවශ්‍ය වේ.

3. වෙළෙඳපොල

සංචාරක හෝටල්, විනෝදාංශය ලෙස මසුන් බෝ කිරීමට කැමති අය, සුන්දරත්වය ස්වභාවිකත්වය අගයන්නන් ආදී බොහෝ පිරිස් අතරත් ලංකාවේ බොහෝ නිවාස ආශ්‍රිතවත් ඉල්ලුමක් පවතී. විදේශ වෙළඳපොලෙහි ශ්‍රී ලංකාවේ 'ගප්පි' සඳහා ඉහළ ඉල්ලුමක් ඇත. ගෝල්ඩ් ෆිෂ්, කාප්, ගුරාමි, බාර්බ් මොලී වැනි මසුන් දේශීය වශයෙන් අලෙවි වේ. විවිධ වර්ගයේ මසුන් ඇති කිරීම ලාභදායක වන අතර අභිජනනය හා රෝග හඳුනා ගැනීමත් අවශ්‍ය ආහාර සකස් කර ගැනීමේ දැනුමත් ලබා ගත් ව්‍යාපාරිකයෙකුට ඉහළ ලාභ ලැබිය හැකිය.

4. ආයෝජනය

මසකට මත්ස්‍යයින් 3200 ක් වර්ධනය කර අලෙවි කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	-	රු. 325,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	-	රු. 33,000.00
	මුළු එකතුව		**රු. 358,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත මත්ස්‍යයින් 3200 ක් වර්ධනය කිරීම සඳහා සිමෙන්ති ටැංකි (10×10 ටැංකි) 15 ක් අවශ්‍ය වේ. අඩි 10×10 ටැංකියක ධාරිතාව මසුන් 700 කි. මත්ස්‍ය වර්ධනය සඳහා මාස 2 1/2 පමණ කාලයක් ගතවේ. මුල් මත්ස්‍ය කාණ්ඩයෙන් පසු මාසිකව අස්වැන්න අලෙවි කළ හැකිය. පැටවුන්ගේ වර්ධනය අනුව වර්ග කරමින් ටැංකිවලට මාරු කිරීමට සිදු වන බැවින් අවශ්‍යතාවය මෙන් තුන් ගුණයක ටැංකි තිබිය යුතුය. (3200/700 ගත් විට ආසන්න වශයෙන් ටැංකි ගණන 05 කි. එවැනි තුන්ගුණය 15 කි.)

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
1	සිමෙන්ති ටැංකි (10×10 ටැංකි 15 ක්)	300,000.00
2	ජල මෝටර්	10,000.00
3	අනෙකුත් උපකරණ (ඔක්සිජන් ටැංකිය, බේසම් හා දැල් ආම්පන්න)	15,000.00
	එකතුව	325,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

මාසිකව මසුන් 3200 ක් වර්ධනය කර අලෙවි කරන ආයතනයක කාරක ප්‍රාග්ධන පිරිවැය පහත පරිදි වේ.

අංක	විස්තරය	මාසික වියදම (රු.)
1	අමුද්‍රව්‍ය	15,000.00
2	ශ්‍රමය	15,000.00
3	වෙනත්	3,000.00
	එකතුව	33,000.00

මාසික ශුද්ධ ලාභය

මාසික මත්ස්‍ය අස්වැන්නෙන් 5%ක් හානි වීම් ලෙස අඩු කර විකුණුම් ආදායම ගණනය කර ඇත. දැනට පවත්නා මිල ගණන් අනුව ව්‍යාපාරය ක්‍රියාත්මක බව සහ තනි පුද්ගලයෙකු විසින් ව්‍යාපාරයේ සියළු කටයුතු සිදුකරන බව උපකල්පනය කර ඇත.

මාසික විකුණුම් ආදායම

මාසික අලෙවිය මත්ස්‍ය ජෝඩු 1500 x රු50 = රු. 75,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය

සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම = මුළු සෘජු පිරිවැය
රු. 15,000.00 + රු. 15,000.00 + රු. 3,000.00 = රු. 33,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ. විසිතුරු මසුන් සඳහා දැරිය යුතු පිරිවැය ඉතා අඩු නමුත් කැපවීම හා අවධානය ඉතා අවශ්‍ය කරුණකි.

වක්‍ර පිරිවැය = රු. 7,000.00

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 75,000.00 - රු. 40,000.00
= රු. 35,000.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරන බැවින් ඔහුට මසකට ශ්‍රම වැටුප ලෙස රු. 15,000.00 ක මුදලක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 35,000.00ක මුදලක් උපයාගත හැකිය.

කාබනික පොහොර නිෂ්පාදනය

1. හැඳින්වීම

කාබනික පොහොර නිෂ්පාදනය වාණිජ මට්ටමින් ඉතා සාර්ථක ලෙස සිදු කිරීමට හැකි ව්‍යාපාරික අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. කාබනික පොහොර නිෂ්පාදනය අවම මූලික ආයෝජනයකින් ආරම්භ කළ හැකිවේ. වාණිජ මට්ටමින් සිදු කිරීමේදී එක් එක් ප්‍රදේශවලට අවේණික අමුද්‍රව්‍ය යොදා ගත හැකිවේ. කාබනික පොහොර භාවිත කිරීම පසට ද හිතකර වන බැවින් රටක් ලෙස ඒ සඳහා යොමුවීම දීර්ඝ කාලීනව විශාල ධනාත්මක බලපෑමක් සිදු කරනු ලබනු ඇත. වත්මන් රජයේ සෞභාග්‍යයේ දැක්ම යටතේ කාබනික පොහොර නිෂ්පාදනය දිරිමත් කිරීම සහ ඒ සඳහා ක්‍රියාත්මක ආධාර වැඩසටහන් තුළින් නව ව්‍යාපාරයක් ලෙස මේ සඳහා යොමුවීමට වැඩි අවස්ථාවන් පවතී.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

ශාක කොටස් (වියළි කොළ/ගිනිසිරියා/වල් සූරියකාන්ත)
සත්ව කොටස් (ගොම පොහොර/කුකුල් පොහොර)
රොක්ප්‍රොස්පේට්
මුහුන්,
ජලය,

3. වෙළඳපොල

කාබනික කෘෂිකර්මාන්තය සඳහා ගොවීන්ගේ නැඹුරු වීමත්, රසායන පොහොර ගෙන්වීම සීමාවීමත් සමග කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වෙළඳපල අවස්ථාවන් විශාල වශයෙන් නිර්මාණය වී ඇත. එළවළු, පළතුරු, විසිතුරු පැල, අපනයන බෝග, සුලු අපනයන බෝග නිෂ්පාදකයින් මෙන්ම ගෘහස්ථ වගාවන් සිදුකරනු ලබන පිරිස ඉලක්ක පාරිභෝගිකයින් ලෙස හඳුනාගත හැකිය. මෙතෙක් රසායනික පොහොර සඳහා පැවැති වෙළඳපොල කොටස මේ සඳහා ග්‍රහණය කර ගැනීමට හැකිවන බැවින් ඉදිරියේදී විශාල වෙළඳපොල අවස්ථාවක් නිර්මාණය වනු ඇත.

4. ආයෝජනය

මාස 1 1/2 ක කාලයකදී කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 3,000ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 18,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 1 1/2 ක් සඳහා)	= රු. 39,500.00
	මුළු එකතුව	= **රු. 58,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත. මේ සඳහා තමා සතු ඉඩම භාවිත කරන බව සලකා ඇති අතර එය ප්‍රාග්ධන පිරිවැයට ඇතුලත් කර නැත. එමෙන්ම තොග ගබඩා කිරීම සඳහා තම නිවසේ කොටසක් පරිහරණය කරන බැවින් එයද ස්ථාවර ප්‍රාග්ධනය ගණනයේදී සලකා නැත.

අංක	උපකරණ	වටිනාකම රු.
01	කාපට්	8,000.00
02	ජලය ඉසින බට	5,000.00
03	විල් බැරෝව	2,500.00
04	උදැල්ල	1,750.00
05	සවල	500.00
06	වෙනත් උපකරණ	750.00
	මුළු එකතුව	18,500.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 1 1/2)

මාස 1 1/2ක් මුරයක් තුළ කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 3000ක් නිෂ්පාදනය සඳහා

අංකය	විස්තරය	මාස1 1/2ක මුරයක් සදහා වියදම රු.
1	අමුද්‍රව්‍ය	19,500.00
2	ශ්‍රමය	12,000.00
3	ගෙන ඒමේ කුලි	3000.00
4	ඇසුරුම්	3000.00
5	වෙනත් වියදම්	2000.00
	එකතුව	39,500.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මාස1 1/2කට වරක් කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 3000ක් බැගින් නිෂ්පාදනය කර කිලෝවක් රු.25.00 බැගින් අලෙවිකරණ බව උපකල්පනය කර ඇත.

ඒ අනුව,

මාස1 1/2ක විකුණුම් ආදායම (කිලෝ ග්‍රෑම් 3000 x රු. 25.00) = රු. 75,000.00

මාස1 1/2ක මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම +සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම
මාස1 1/2ක සෘජු පිරිවැය = රු. 19,500.00 + රු. 12,000.00 + රු. 9,800.00
= රු. 39,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දරණ වියදම් වේ. (අලෙවි, ක්ෂය ආදි අනෙකුත් වියදම්). එය මුරයක් සඳහා රු. 3,500.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාස1 1/2 ශුද්ධ ලාභය = මාස 1 1/2ක විකුණුම් ආදායම - මාස1 1/2ක මුළු පිරිවැය
= රු. 75.000.00 - (රු. 39,500.00 + රු. 3500.00)
= රු. 75,000.00 - රු. 41,300.00
= රු. 33,700.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාස1 1/2ක් සඳහා ශ්‍රම වැටුප ලෙස රු. 12,000.00 ක් සහ ශුද්ධ ලාභය ලෙස රු. 32,000.00 මුදලක් උපයාගත හැකිය.

හරිතාගාර තුළ තක්කාලි වගාව

1. හැඳින්වීම

නුවරඑළිය, වැලිමඩ, බණ්ඩාරවෙල, හපුතලේ, ඌව පරණගම වැනි ශීත දේශගුණයක් සහිත ප්‍රදේශවල සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය ජීවනෝපාය ලෙස පවත්වාගෙන යන ව්‍යවසායකයින්ට කුඩා භූමි ප්‍රමාණයකින් මාසික ව ඉහළ ආදායමක් ලබාගත හැකි ව්‍යාපෘතියකි. ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂී ව්‍යාපෘතියක් වන මෙය රු. 500,000.00 ක පමණ ආයෝජනයකින් මාසික ව රු. 40,000.00 ක පමණ ශුද්ධ ආදායමක් ලබාගත හැකිය.

2. අමුද්‍රව්‍ය

අවශ්‍ය බීජ වෙළඳපොලෙන් මිලදී ගත හැකිය. වගාව සඳහා ඇල්බට් සොලූෂන් වැනි රසායනික පොහොර වර්ග අත්‍යාවශ්‍ය වන අතර දිලීර නාශක හා කෘමිනාශක ද වෙළඳපොලෙන් ලබාගත හැකිය.

3. වෙළඳපොල

සුපිරි වෙළඳසැල්වල හා සංචාරක හෝටල් සඳහා පවතින ඉල්ලුමට ප්‍රමාණවත් තරම් සැපයුමක් නොපවතින බැවින් ඉහත ප්‍රදේශවල ජීවත්වන ඕනෑම අයෙකුට මෙම විභවතාවය සපුරාලීමට වෙළඳපොළට පිවිසීමේ හැකියාව ඇත. විශේෂයෙන් මාලදිවයිනට විශාල වශයෙන් අපනයනය කරන අතර එමගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලබාගත හැකිය.

4. ආයෝජනය

මෙම ව්‍යාපාරය කෘෂිකාර්මික ව්‍යාපාරයක් වන අතර, මෙහි මූලික අස්වනු ලබා ගැනීම සඳහා මාස 3ක කාලයක් ගතවේ. ඒ සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 445,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 3ක් සඳහා)	- රු. 60,000.00
	මුළු එකතුව	- **රු. 505,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අනු අංක	වත්කම	වටිනාකම (රු.)
01	ඉඩම්	100,000.00
02	ගොඩනැගිලි (වර්ග අඩි 1,000 හරිතාගාරය)	300,000.00
03	යන්ත්‍ර	25,000.00
04	උපකරණ	5,000.00
05	ජලය සපයා ගැනීම	15,000.00
	එකතුව	445,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

මසකට කි.ග්‍රෑම් 300 ක් නිෂ්පාදනය කරන ආකාරයට ගණනය කිරීම් සිදුකර ඇති අතර, මාස 3කින් අස්වනු ලබාගත හැකිය.

අංක	විස්තරය	මාස 3ක් සඳහා වියදම (රු.)
01	බීජ	15,000.00
02	පොහොර	9,000.00
03	දිලීර නාශක / කෘමිනාශක	6,000.00
04	ශ්‍රම වියදම්	30,000.00
	එකතුව	60,000.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

රසායන ද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් දේශීය වෙළඳපොලෙන් මිලදී ගන්නා ආකාරයට සැලසුම්කර ඇත. එක් පැළයකින් මසකට කි.ග්‍රෑම් 1 ක අස්වැන්නක් ලබාගැනීමට අපේක්ෂා කරන අතර, වර්ග අඩි 1,000 ක තක්කාලී පැළ 300ක් සිටුවිය හැකිය.

මාසික විකුණුම් ආදායම

= එක් පැළයකින් ලබාගන්නා කි.ග්‍රෑම් ප්‍රමාණය × පැළ සංඛ්‍යාව × කි.ග්‍රෑමයක මිල
= කි.ග්‍රෑම් 1 × පැළ 300 × රු. 180.00
= රු. 54,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = යෙදවුම් වියදම + සෘජු ශ්‍රම වියදම්
= රු. 7,500.00 + රු. 10,000.00
= රු. 17,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ (ජලය, විදුලිය, ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 3,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 54,000.00 - (රු. 17,500.00 + රු.3,000.00)
= රු. 54,000.00 - රු. 20,500.00
= රු. 33,500.00

ව්‍යාපාරිකයා විසින්ම වගා කටයුතුවල නියැලේ නම් ඔහුට මාසයකට රු. 10,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 33,500.00 ක් උපයාගත හැකිය.

ඇන්තූරියම් පැල වගාව

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විසිතුරු මල් වගාවේ නිරතවන්නන් ඇන්තූරියම් වගාව කෙරෙහි වඩාත් උනන්දුවක් දක්වනු ලබන අතර එය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි සැලකිය යුතු විදේශ විනිමයක් උපයා දීමට ද දායකවේ. මෙය ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීම සඳහා අඩු ශිල්පීය දැනුමක් ද ප්‍රමාණවත් වන අතර නවකයෙකුට වුවද මෙම ව්‍යාපාරයට ලෙහෙසියෙන්ම අවතීර්ණ වීමේ හැකියාව ඇත. මේ අනුව ඇන්තූරියම් වගාව අඩු ආයෝජනයකින් ගෘහාශ්‍රිතව සෙවණ දැල් තුළ ඉතාමත් ගුණාත්මක මට්ටමෙන් ආරම්භ කල හැකි ලාභදායී ව්‍යාපාරයක් ලෙස හඳුන්වාදිය හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

ඇන්තූරියම් පැළ
ප්ලාස්ටික් බඳුන්/ පෝච්චි
වැලි
කැපූ පොල්ලෙලි
ඔස්මොකොට් භූ පොහොර
ක්‍රොප්මාස්ටර් දිලීර නාශක
ඇල්බට් සොලියුෂන් දියර පොහොර

3. වෙළඳපොල

ඇන්තූරියම් යනු ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශීය මට්ටමෙන් ද ඉහළ වෙළඳපොල කොටසක් හිමිකර ගෙන ඇති විසිතුරු මල් කලාවේ ඉහළින්ම සිටින ශාක වර්ගයකි. ශ්‍රී ලංකාවෙන් ජපානය, ඕලන්දය, මාලදිවයින වැනි රටවල් වලට ඇන්තූරියම් අපනයනය කෙරේ. දේශිය වෙළඳපොල තුළ කැපූ මල් අතරින් ඇන්තූරියම් වගාව විසින් හිමිකරගෙන ඇති වෙළඳපොල කොටස ඉතා ඉහළ වන අතර බඳුන් ගත වගාවටත් එලෙසම ඉල්ලුමක් පවතී. ඇන්තූරියම් පැළයක් රු 150.00 සිට රු. 5000.00 දක්වා ඉහළ මිල පරාසයක් තුළ අලෙවි කිරීමේ හැකියාව ඇත. මේ වන විට ඇන්තූරියම් වාණිජ ව්‍යාපාරයක් ලෙස අන්තර්ජාලය හරහා ද ඉතාමත් සාර්ථකව අලෙවි අවස්ථාවන් ලබා ගත හැකි ව්‍යාපාරයකි.

4. ආයෝජනය

මසකට පැළ 300 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	රු. 145,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 3ක් සඳහා)	රු. 225,000.00
මුළු එකතුව	**රු. 370,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංක	යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වෙනත්	වටිනාකම රු.
1	දැල් ගෘහය (15'×25')	140,000.00
2	සවල, උදැල්ල, මුල්ලුව, මල් බාල්දිය හා වතුර බටය හා අනෙකුත් උපකරණ	5,000.00
	එකතුව	145,000.00

4.2 කාරක ප්‍රාග්ධනය (මාස 3කට)

මසකට ඇන්තූරියම් පැළ 300 බැගින් මිලදී ගෙන වගා කරනු ලැබේ.

අංක	විස්තරය	මසකට වියදම රු.	මාස 3ක වියදම රු.
1	ඇන්තූරියම් පැළ (ගෙන ඒමේ කුලී සමග)	45,000.00	53,000.00
2	ප්ලාස්ටික් බදුන්/පෝච්චි	2,100.00	6,300.00
3	වැලි හා පොල්ලෙලි කැබලි	900.00	2,700.00
4	පොහොර හා දිලීර නාශක	3,000.00	9,000.00
5	ශ්‍රමය	20,000.00	60,000.00
6	වෙනත් වියදම්	4,000.00	12,000.00
	එකතුව	75,000.00	225,000.00

5. මාසික ශුද්ධ ලාභය

- මෙම ව්‍යාපාරය මසකට ඇන්තූරියම් පැළ 300ක් බැගින් මිලදී ගෙන මාස 3ක් ගෘහය තුළ නඩත්තු කරන බව උපකල්පනය කර ඇත.
- මාස 3න් පසු පැළයක් රු.350.00 බැගින් අලෙවි කරන බව උපකල්පනය කර ඇත.
- වගාවේදී පැළවලින් 5ක් හානි වන බව උපකල්පනය කර ඇත.
- අලුතින්ම ආරම්භ කරන ව්‍යාපාරයක ලාභ ලැබීම ආරම්භ වන්නේ සිව්වන මාසයේ සිටය.

ඒ අනුව,
මාසික විකුණුම් ආදායම (පැළ 285 x රු. 350.00) = රු. 99,750.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම

මසක සෘජු පිරිවැය = රු. 51,000.00 + රු. 20,000.00 + රු. 500.00
= රු. 71,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා දරණ වියදම් වේ. (ජලය, ගෙන යාමේ වියදම්, දුරකථන, අලෙවි, ක්ෂය හා වෙනත් වියදම්). එය මාසයක් සඳහා රු. 3,500.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 99,750.00 (රු. 71,500.00 + රු. 3,500.00)
= රු. 99,750,00 - රු. 75,000.00
= රු. 24,750.00

ව්‍යාපාරිකයා විසින්ම වගා කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට ශ්‍රම වැටුප ලෙස රු. 20,000.00 සහ ශුද්ධ ලාභය ලෙස රු. 24,750.00 ක මුදලක් උපයාගත හැකිය.

බ්‍රොකොලි වගා කිරීමේ ව්‍යාපෘතිය

1. හැඳින්වීම

නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල පරිසර උෂ්ණත්වය පදනම් කොටගෙන කළ හැකි වගා ව්‍යාපෘතියක් ලෙස බ්‍රොකෝලි වගා ව්‍යාපෘතිය පෙන්වා දිය හැකිය. මේ වන විටද ශ්‍රී ලංකාවේ ජීවත්වන්නන්ගේ ඉතාම අවම පිරිසක් රසවිඳ ඇති චයිනීස් වෙජිටබල් ගණයට අයත් බ්‍රොකෝලි විශේෂය මනා ඖෂධීය ගුණයක් හා පෝෂණ ගුණයක් සහිත එළවළුවක් ලෙස ද හෝටල් ක්ෂේත්‍රයේ චීන සුප ශාස්ත්‍රය සඳහා වැඩි වශයෙන් යොදාගනු ලබන විශේෂයකි. ඒ අනුව තනි පුද්ගල ශ්‍රමය වැය කරමින් කළ හැකි වගා ව්‍යාපෘතියක් වන මේ සඳහා දැරිය යුතු ආයෝජනය ද වෙනත් වගාවන්වලට සාපේක්ෂව අඩු අගයක් ගනී.

2. අමුද්‍රව්‍ය

බ්‍රොකෝලි බීජ සකාටා, ටාකි, ටොකො වැනි වෙළඳනාමයන් ගෙන් වෙළෙඳපොළේ මිලදී ගත හැකිය. එම විශේෂයන් තුළ සකාටා වර්ගය මිලදී ගැනීමේදී එම බ්‍රොකෝලි වල පවතින මනා හැඩය නිසා, වෙළඳපොළේ හොඳ ඉල්ලුමක් ඇත. මේ සඳහා අවශ්‍ය රසායනික පොහොර හා අත්‍යවශ්‍ය දිලීරනාශක හා කෘමිනාශක ද වෙළඳපොළෙන් ලබාගත හැකිය.

3. වෙළඳපොළ

මෙම බෝග විශේෂය ශ්‍රී ලංකාව තුල ජීවත්වන පුද්ගලයන්ගෙන් වැඩි ප්‍රමාණයක් පාරිභෝජනය කර නොමැති වීම හේතුකොටගෙන බහුල ව වගාකිරීම තුළ පාරිභෝජනය වැඩිකොට ලංකාවේ සෙසු ප්‍රදේශ දක්වා ද අලෙවිය වර්ධනය කරගත හැකි වේ. එසේම චීන සුප ශාස්ත්‍රය සහිත සංචාරක හෝටල් ජාල සඳහා අත්‍යවශ්‍ය අමුද්‍රව්‍යක් වීම හේතු කොටගෙන එමගින් ද වෙළඳපොළ අවස්ථා වර්ධනය කරගත හැකි අතර, සුපිරි වෙළඳසැල් සඳහා ද ඉදිරිපත් කළ හැකිය.

4. ආයෝජනය

මෙම ව්‍යාපාරය කෘෂිකාර්මික ව්‍යාපාරයක් වන අතර මෙහි මූලික අස්වැන්න ලබාගැනීමට මාස 3ක කාලයක් ගත වේ. ඒ සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 69,650.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 3ක් සඳහා)	- රු. 41,000.00
	මුළු එකතුව	- **රු. 110,650.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01.	ඉඩම සැකසීම	12,000.00
02.	බෙහෙත් ඉසින ටැංකිය	12,000.00
03.	ජල මෝටරය හා ජල සැපයුම සඳහා	37,000.00
04.	අනෙකුත් උපකරණ	8,650.00
	එකතුව	69,650.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 3ක් සඳහා)

අංක	විස්තරය	මාස 3ක් සඳහා වියදම (රු.)
01	පොහොර	1,500.00
02	දිලීර නාශක	1,000.00
03	කෘමිනාශක	1,000.00
04	බීජ	2,500.00
05	ශ්‍රම වියදම්	30,000.00
06	වෙනත්	5,000.00
	එකතුව	41,000.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

රසායන ද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් දේශිය වෙළඳපොළෙන් මිලදී ගැනිමට සැලසුම්කර ඇති අතර, එක් පැළයකින් මසකට ග්‍රෑම් 600 ක අස්වැන්නක් ලබාගැනීමට අපේක්ෂා කරන අතර පර්චස් 4 ක බ්‍රොකෝලි පැළ 600 ක් සිටුවිය හැකි බව.

විකුණුම් ආදායම

= එක් පැළයකින් ලබාගන්නා කි.ග්‍රෑම් ප්‍රමාණය × පැළ සංඛ්‍යාව × කි.ග්‍රෑම් 1 ක මිල
= (ග්‍රෑම් 600 × පැළ 600) 1,000) × රු. 500.00
= කි. ග්‍රෑම් 360 × රු. 500.00
= රු. 180,000.00

මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත් වියදම්
= රු. 6,000.00 + රු. 30,000.00 + රු. 5,000.00
= රු. 41,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ. (ජලය, විදුලිය,ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු.10,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ශුද්ධ ලාභය (මාස 04ක් සඳහා) = විකුණුම් ආදායම - මුළු පිරිවැය
= රු. 180,000.00 - (රු. 41,000.00 + රු. 10,000.00)
= රු. 180,000.00 - රු. 51,000.00
= රු. 129,000.00

මාසික සාමාන්‍ය ශුද්ධ ලාභය (රු. 129,000.00/4) රු. 32,250.00 කි.

(අස්වැන්න ලබාගැනීමට මාස 3ක කාලයක් ගතවන අතර අස්වැන්න ලබාගන්නා මාසයද ඇතුලුව මාස 4 ක කාලයක් සඳහා ශුද්ධ ලාභය බෙදූ විට එක් මාසයක සාමාන්‍ය ශුද්ධ ලාභය රු. 32,250.00 කි.)

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 10,000.00 වැටුපක් වෙන්කර ගත හැකි අතර, මාසික ශුද්ධ ලාභය ලෙස රු. 32,250.00 ක් උපයා ගත හැකිය.

දේශීය වැල් අල වගාව (රාජ අල වගාව)

01. හැඳින්වීම

අතීතයේ සිටම ශ්‍රී ලාංකිකයන්ගේ ආහාර සුරක්ෂිතතාවයට වැඩි දායකත්වයක් දැක්වූ වැල් අල Dioscorea යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබයි. දේශීය වශයෙන් වැල් අල පවුලේ විශේෂ 09 ක් පමණ දැකිය හැකිය. ඒ අතර කැකුලු අල, රාජ අල, කුකුලල, කටු අල යන අල වර්ග වාණිජ වශයෙන් වගා කිරීම සිදුවේ. මෙම අල වර්ග සිටුවීම අප්‍රේල්, මැයි මාසවල දී සිදු කරන අතර අස්වනු නෙළීම දෙසැම්බර්, ජනවාරි කාලයේ දී සිදුකරනු ලබයි. මෙම වගාව තෙත් හා වියළි කළාප දෙකෙහිම වගා කිරීමට යෝග්‍ය වේ.

02. අවශ්‍ය අමුද්‍රව්‍ය

- වැල් අල බීජ (රාජ අල බීජ)
- පොහොර (යූරියා, Tsp හා Mop යන පොහොර වර්ග නිර්දේශ කර තිබුණ ද කොම්පෝස්ට් පොහොර භාවිතය වඩාත් සුදුසු වේ.)
- දිලීර නාශක

03. වෙළඳපොළ

මෙම දේශීය වැල් අලවල කාබෝහයිඩ්‍රේට්, ඛණිජ ලවණ, විටමින් සහ සුළු වශයෙන් ප්‍රෝටීන්ද පවතින බැවින් ඉහළ පෝෂණ ගුණයක් ඇති අතර ප්‍රතිඔක්සිකාරක ගුණයක් පැවතීම නිසා ඖෂධීය වටිනාකමක් ද ඇත. උදෑසන ආහාරවේලට හා තිරිඟු පිටි වලට ආදේශකයක් ලෙස යොදා ගත හැකි නිසා ඉහළ වෙළඳපොළ ඉල්ලුමක් ලඟා කර ගත හැකි අතර අපනයන විභවතාවක් පවතින බෝගයකි. දේශීය ආහාර අලෙවි කරන ස්ථානවල ද ඉහළ ඉල්ලුමක් පවතීග සාමාන්‍ය වෙළඳසැල් මෙන්ම සුපිරි වෙළඳසැල් ජාල තුළ ද ඉහළ ඉල්ලුමක් පවතී.

04. ආයෝජනය

වෙළඳපොළ ඉහළ ඉල්ලුමක් පවතින රාජ අල වගාව අක්කර 1/4 ක භූමි ප්‍රමාණයක වගා කිරීම සඳහා ඇස්තමේන්තු සකසා ඇත. (මෙහිදී ව්‍යවසායකයා යොදා ගන්නා භූමිය හා ඉඩම් සැකසීමට යොදා ගන්නා ක්‍රමවේදය අනුව වැය වන වියදම් වෙනස් විය හැකිය)

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	=	රු. 50,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	=	රු. 121,000.00
	මුළු එකතුව	=	**රු. 171,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර අක්කර 1/4 ක වගා බිම්කඩ සඳහා වන ඉඩමේ පිරිවැය අන්තර්ගත කර නැත. තමා සතු ඉඩමක් හෝ බදු පදනම මත ඉඩමක් යොදා ගන්නා බව උපකල්පනය කර ඇත.

අංකය	විස්තරය	වටිනාකම (රු.)
01	ඉඩම සැකසීම හා වලවල් කැපීම සඳහා (ශ්‍රමය)	15,000.00
02	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ (උදළු, මුල්ලු, දියර ඉසින ටැංකිය ඇතුළුව)	25,000.00
03	ආධාරක ඉනි සඳහා වියදම (අඩි 6ක් දිග අඟල් 2.5 විෂ්කම්භය ඇති) ප්‍රමාණය 1000	10,000.00
	එකතුව	50,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

අංකය	විස්තරය	වසරක කාලයක් සඳහා වියදම (රු.)
01	ශ්‍රම වියදම (බීජ තවාන් කිරීමට, පොහොර යෙදීම, පැළ සිටුවීමට, ආධාරක සිටුවීමට හා නඩත්තු කටයුතු සඳහා, අස්වැන්න නෙළීමට හා සැකසීම් කටයුතු සඳහා)	20,000.00
02	අල බීජ සඳහා වියදම (1000 x රු. 60.00)	60,000.00
03	පොහොර	35,000.00
04	වෙනත් (බීජ තවාන් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය, දිලීර නාශක හා අනෙකුත්)	6,000.00
	එකතුව	121,000.00

5. මාසික ශුද්ධ ලාභය

අප්‍රේල් හා මැයි යන මාසවල පැළ සිටුවා දෙසැම්බර් හා ජනවාරි මාසවල අස්වැන්න නෙළා ගත හැකිය. ඒ අනුව අක්කර 1/4 ක වගා බිම් ප්‍රමාණයකින් වාර්ෂික අස්වැන්න ලෙස කි.ග්‍රෑ. 3200 ක් ලබා ගැනීමට හැකියාව පවතී. කි.ග්‍රෑ. 1ක් සඳහා වෙළඳපොළ මිල රු. 150.00ක් ලෙස උපකල්පනය කර ඇත. ඒ අනුව,

වසරක විකුණුම් ආදායම = (කි.ග්‍රෑ. 3200 X රු. 150.00)
= රු. 480,000.00

වාර්ෂික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම් +සෘජු වෙනත්
වාර්ෂික සෘජු පිරිවැය = රු. 95,000.00 + රු. 35,000.00 + රු. 6,000.00
= රු. 136,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරනු ලබන අනෙකුත් වියදම් වේ. (ජලය, ඉන්ධන, ප්‍රවාහනය, අලෙවි වියදම් හා ක්ෂය වියදම් ආදී) වසරක් සඳහා රු. 12,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

වාර්ෂික ශුද්ධ ලාභය = වාර්ෂික විකුණුම් ආදායම - වාර්ෂික මුළු පිරිවැය
= රු. 480,000.00 - (රු. 136,000.00 + රු. 12,000.00)
= රු. 332,000.00

දළ සාමාන්‍ය මාසික ශුද්ධ ලාභය = වාර්ෂික ශුද්ධ ලාභය/12
= රු. 27,000.00

ව්‍යාපාරිකයා විසින් ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් සාමාන්‍ය මාසික ශුද්ධ ලාභය ලෙස රු. 27,000.00 ක් ද රු. 3,000.00 ක ශ්‍රම වැටුපක් ද උපයා ගත හැකිය.

මඤ්ඤොක්කා වගාව

1. හැඳින්වීම

මඤ්ඤොක්කා යනු ලොකු කුඩා කා අතරත් ජනප්‍රිය ශක්තිජනක ආහාර බෝගයකි. වර්තමානයේ මඤ්ඤොක්කා භාවිතා කරමින් විවිධ ආහාර වර්ග නිෂ්පාදනය කරයි. එබැවින් මඤ්ඤොක්කා සඳහා වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් පවතී. මඤ්ඤොක්කා නියඟයට ඔරොත්තු දෙන කෘෂ්ධීය බෝගයකි. තෙත් කලාපයේ කන්න බෝගයක් ලෙසත් වියළි කලාපයේ වාර්ෂික බෝගයක් ලෙසත් වගා කරනු ලබයි. සරු හා නිසරු ඕනෑම පාංශු වර්ගයක් තුළ මඤ්ඤොක්කා සාර්ථකව වගා කළ හැකිය. මහ කන්නයේ වැසි සමඟ දිවයින පුරා ද යල කන්නයේ වැසි සමඟ තෙත් හා අතරමැදි තෙත් කලාපයේ මඤ්ඤොක්කා වගාව ආරම්භ වේ. ආර්ථික භෝගයක් ලෙස මඤ්ඤොක්කා වගාව තුළින් වාර්ෂිකව ඉහළ ආදායමක් උපයා ගැනීමට හැකි වේ. පැල සිටුවා මාස 9කට පමණ පසු අස්වැන්න ලබා ගත හැකිය. විවිධ මඤ්ඤොක්කා ප්‍රභේද පැවතියත් පේරාදෙණි ප්‍රභේදයන් වන යු 51, කිරි කවඩි, සුරනිමල, ශානි, ස්වර්ණ යන වර්ග වැඩි වශයෙන් වගා කරනු ලබයි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- මඤ්ඤොක්කා දඬු
- කාබනික පොහොර (නයිට්‍රජන් සාන්ද්‍රණය වැඩි සුපෝෂිත කොම්පෝස්ට්)
- එම් ඕ පී පොහොර

3. වෙළෙඳපොල

මඤ්ඤොක්කා අල සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපොල තුළ ද ඉහළ ඉල්ලුමක් පවතී. මඤ්ඤොක්කා යොදා ගනිමින් නිෂ්පාදනය කරනු ලබන ආහාර වර්ග බහුලවීම නිසා වෙළඳපොලේ මේ සඳහා ඒකාකාරී ඉල්ලුමක් පවතී. මේ සඳහා ස්ථාවර මිලක් නොමැති වුවත් මඤ්ඤොක්කා කිලෝ එකක මිල සාමාන්‍යයෙන් රු. 30.00ත් රු. 70.00ත් අතර පවතී. නිසි කාල සීමාව තුල වගා කිරීම තුළින් ගොවියාට ඉහළ මිලක් ලබාගත හැකිය. විශේෂයෙන්ම දෙසැම්බර් මාසයේ අනෙකුත් මාස වලට සාපේක්ෂව මඤ්ඤොක්කා මිල ඉහළ යයි.

4. ආයෝජනය

මඤ්ඤොක්කා අක්කරයක වගා කිරීම සඳහා අවශ්‍ය ආයෝජනය
(මාස නවයක කාලච්ඡේදයක් සඳහා)

4.1	මුළු ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	රු. 20,500.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	රු. 75,240.00
	මුළු පිරිවැය	**රු. 95,740.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මකද්කොක්කා වගාව සඳහා අවශ්‍ය මූලික උපකරණ ඇතුළත් කර ඇත. මෙහි දී බිම් කුලී සහ බිම් සැකසීමේ වියදම් ප්‍රදේශ අනුව වෙනස් වේ.

අංකය	උපකරණ	වටිනාකම (රු.)
01	බිම් කුලී	6,000.00
02	බිම් සැකසීමේ වියදම්	10,000.00
03	උදලු (02)	3,000.00
04	පිහි (01)	1,500.00
	එකතුව	20,500.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස නවයක් සඳහා)

මකද්කොක්කා වගාවේ දී වලවල් සැකසීම, වල් නෙළීම, පොහොර යෙදීම, අස්වනු නෙළීම යන කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදුකරයි. වල් නෙළීම හා පොහොර යෙදීම් අවස්ථා දෙකක දී සිදුකරන අතර සති දෙකකින් සහ සති අටකින් පොහොර යොදනු ලබයි. එහිදී එම්. ඕ. පී වලට අමතරව නයිට්‍රජන් ප්‍රතිශතයය වැඩි සුපෝෂිත කොම්පෝස්ට් භාවිත කරනු ලැබේ. වගා කටයුතු සඳහා අයිතිකරුට අමතරව එක් සේවකයෙකු සහායට ගන්නා අතර දෙදෙනාගේ දිනක ශ්‍රම වියදම රු. 3000.00ක් ලෙස මෙහිදී සලකා ඇත. මකද්කොක්කා දඬු මීටරයක පරතරයක් සහිතව සිටුවිය යුතු වේ. අක්කරයක භූමි ප්‍රමාණයක මකද්කොක්කා වගා කරන බවට උපකල්පනය කර මෙහි වියදම් ඇස්තමේන්තු සකස් කර ඇත.

අංකය	විස්තරය	වියදම (රු.)
1	අමුද්‍රව්‍ය වියදම්	
	මකද්කොක්කා දඬු 400 x රු. 5.00	2,000.00
	කොම්පෝස්ට් 600 x රු. 25.00	15,000.00
	එම්. ඕ. පී. 64 x රු. 35.00	2,240.00
	(වරකට කොම්පෝස්ට් කිලෝ ග්‍රෑම් 300 ක් සහ එම්. ඕ. පී. කිලෝ ග්‍රෑම් 32 බැගින්)	
		19,240.00
2	ශ්‍රම වියදම (වලවල් සැකසීම හා දඬු සිටුවීම්,වල් නෙළීම පොහොර යෙදීම, අස්වනු නෙළීම)	54,000.00
2	වෙනත් වියදම්	2,000.00
	එකතුව	75,240.00

5. මාසික ශුද්ධ ලාභය

සාමාන්‍යයෙන් අක්කරයක භූමි ප්‍රමාණයක් තුළ මකද්කොක්කා අස්වැන්න කිලෝ ග්‍රෑම් 12000 - 15000ත් අතර ප්‍රමාණයක් ලබාගත හැකිය. මෙහිදී මාස නවයක කාල සීමාව අවසානයේ මකද්කොක්කා කිලෝ ග්‍රෑම් 12000ක අස්වැන්නක් ලබාගත හැකි බවටත් මකද්කොක්කා කිලෝ එකක් වෙළඳපොලේ රු. 40.00ක මුදලකට අලෙවි කරන බවටත් ඇස්තමේන්තු කර ඇත.

ඒ අනුව,

කාලච්ඡේදයේ විකුණුම් ආදායම - (කිලෝ ග්‍රෑම් 12000 x විකුණුම් මිල රු. 40.00)
= රු. 480,000.00

මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 75,240.00 + රු. 10,000.00
= රු. 85,240.00

සෘජු පිරිවැය මාස නවයක් සඳහා = සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් පිරිවැය
= රු. 19,240.00 + රු. 54,000.00 + රු. 2,000.00
= රු. 75,240.00

වක්‍ර පිරිවැය

වගා කටයුතු සිදු කිරීමේදී කාලච්ඡේදය තුළ දරණ අනෙකුත් වියදම් වේ (අලෙවි වියදම්, ප්‍රවාහන වියදම්, සේවක සංග්‍රහ වියදම් හා සෘජු වියදම් ලෙස ගණනය නොකල අනෙකුත් සියළු වියදම්). ඒ අනුව කාලච්ඡේදයේ වක්‍ර වියදම රු. 10000.00ක් ලෙස ඇස්තමේන්තු ගත කර ඇත.

ශුද්ධ ලාභය	=	විකුණුම් ආදායම - මුළු පිරිවැය
	=	රු. 48,0000.00 - රු. 85,240.00
ශුද්ධ ලාභය (මාස 9ක් සඳහා)	=	රු. 394,760.00

මෙහිදී සේවකයා සමඟ අයිතිකරු ද වගා කටයුතු සිදු කරන නිසා කාලච්ඡේදය තුළ ශ්‍රම වැටුප ලෙස රු. 27000.00ක් ලබාගනී. ඊට අමතරව කාලච්ඡේද තුළ මඤ්ඤොක්කා වගාව තුළින් රු. 394,760.00ක ශුද්ධ ලාභයක් ලබාගත හැකි අතර දළ සාමාන්‍ය මාසික ශුද්ධ ලාභය රු. 43,862.00ක් වේ.

ජලජ පැළෑටි

1. හැඳින්වීම

ජලජ පරිසර ආශ්‍රිතව සහ ජලජ පරිසර පද්ධති තුළ වර්ධනය වන ශාක සහ පැළෑටි ජලජ ශාක ලෙස හඳුන්වයි. ජලජ ශාක ආහාරමය වටිනාකමකින් හා වාණිජමය වටිනාකමකින් යුතු වන අතර නිවෙස්වල විසිතුරු අලංකාර පැළ ලෙස පොකුණු තුළ හා වීදුරු මත්ස්‍ය ටැංකි තුළ අලංකරණය සඳහා භාවිතා කරයි. අතීතයේ මෙන් විශාල ගෙවතු හිමි නොමැති මෙම කාලය තුළ ගෙවත්තේ අඩු ඉඩ ප්‍රමාණයක ජලජ පැළෑටි නිෂ්පාදනය ආරම්භ කළ හැකිය. මෙම කර්මාන්තය සඳහා අඩු ශ්‍රමයක් මෙන්ම අඩු කාලයක් වැයවේ. මව් ශාක මඟින් එකවරක් පැළ බෝකරගත් පසුව මූලික අමුද්‍රව්‍ය සඳහා අඩු පිරිවැයක් වැයකරමින් දීර්ඝ කාලයක් මෙම ව්‍යාපාරයේ නියැලිය හැකිය. පලිබෝධ හානිය හා ලෙඩරෝග මැනවින් පාලනය කිරීමෙන් ඉතාහොඳ අස්වැන්නක් ලබා ගත හැකිය. වර්තමානයේ බොහෝ රටවල ව්‍යාපාරයක් ලෙස මෙම ජලජ පැළෑටි වගාව සිදු කෙරේ. ශ්‍රී ලංකාව තුළද විසිතුරු ජලජ පැළෑටි වගාව පහසුවෙන් ආරම්භ කල හැකි අඩු ආයෝජනයක් සහිත හා ලාභදායි ව්‍යාපාරයක් ලෙස ව්‍යාප්ත වෙමින් පවතී.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

මව් ශාක (ඕලු ,නෙලුම්, මානෙල්, කුමුදු හා වෙනත් විසිතුරු ජලජ පැලෑටි වර්ග) ඔස්මොකොට් හා යාරමිලා පොහොර(කාබනික පොහොරද යෝග්‍ය වේ), වගා මාධ්‍යය (ජලය හෝ මඩ), පැළ කරන බඳුන්

3. වෙළඳපොල

වර්තමානයේ ජලජ පැළෑටි සඳහා ඉතා ඉහල ඉල්ලුමක් පවතින අතර, ගෘහ හා ගෙවතු අලංකරණය සඳහා මත්ස්‍ය ටැංකි, පොකුණු, දියඇලි සෑදීමේදී බොහෝවිට යොදාගනී. ගෘහස්ත පාරිභෝගිකයින්ගෙන් ඉහළ ඉල්ලුමක් ඇති අතර, රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකෙහිම නගර නිර්මාණ කටයුතු හා උද්‍යාන අලංකරණ කටයුතු සඳහා යොදා ගනී. සමාජ මාධ්‍ය හරහා පාරිභෝගිකයින්ගේ අවධානය ලබා ගත හැකි නිෂ්පාදනයක් වන අතර පහසු ප්‍රචාරණ ක්‍රම නිසා මල් වගාකරුවන් අතරද ජලජ පැළෑටි සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. වෙනත් මල් හා විසිතුරු පැළ මෙන් නොව අඩු අවධානයකින් වැඩි ආකර්ශණීය පෙනුමක් ගෙවත්තට ලැබෙන නිසා ඉහළ පාරිභෝගික රුචිකත්වයක් මෙම ජලජ පැළෑටි සඳහා පවතී. දේශීය වෙළෙඳ පොළ මෙන්ම අපනයන වෙළෙඳ පොළ අවස්ථාද මෙම ව්‍යාපාරය සඳහා විවරව පවතී.

4. ආයෝජනය

දිනකට ජලජ පැළෑටි 20 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළයුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 44,600.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	- රු. 11,675.00
	මුළු එකතුව	- **රු. 56,275.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර, ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	උපකරණ (මුල්ලුව, පිහි, අඬු, ස්ප්‍රේයර්ස් ආදිය)	5,000.00
02	යකඩ රාක්ක	10,000.00
03	ආවරණ දැල සඳහා	6,000.00
04	මව් ශාක (10ක්), සිමෙන්ති පෝච්චි (10)	23,600.00
	එකතුව	44,600.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට ජලජ පැළෑටි 20 ක් නිෂ්පාදනය කරන අතර සතියකට දින 5 ක් නිෂ්පාදනය කරනු ලැබේ.

අංක	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම (රු.)
01	අමුද්‍රව්‍ය (මාධ්‍යය හා පොහොර)	200.00	1,000.00
02	ගෙනවීමේ කුලී	15.00	75.00
03	ශ්‍රම වියදම	1,000.00	5,000.00
04	ඇසුරුම්	600.00	3,000.00
05	ජලය	20.00	100.00
06	වෙනත් වියදම්	500.00	2,500.00
	එකතුව	2,335.00	11,675.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

- ව්‍යාපාරයේ අයිතිකරු විසින්ම නිෂ්පාදන කටයුතු ඇතුළු සියලුම දෑ සිදුකරන බව.
- මාසය තුළ සෑම දිනකම නිෂ්පාදනය හා අලෙවිය ඒකාකාරිව සිදුවන බව.
- දිනකදී නිපදවන සියලුම පැළ අලෙවි වන බව.

මාසික විකුණුම් ආදායම (දින 20 × දිනක නිෂ්පාදනය පැළ 20 × රු. 200.00) = රු. 80,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම
දිනක සෘජු පිරිවැය = රු. 200.00 + රු. 1,000.00 + රු. 1,135.00
= රු. 2,335.00 × දින 20
= රු. 46,700.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වා ගෙනයාම සඳහා දරණ වියදම් වේ (ජලය, විදුලිය, ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු. 15,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 80,000.00 - (රු. 46,700.00 + රු. 15,000.00)
= රු. 80,000.00 - රු. 61,700.00
= රු. 18,300.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මාසයකට රු. 20,000.00 වැටුපක් වෙන්කර ගත හැකි අතර, මාසික ශුද්ධ ලාභය ලෙස රු. 18,300.00ක් උපයා ගත හැකිය.

හරිතාගාර තුළ ජැපනීස් කියුකම්බර් වගාව

1. හැඳින්වීම

නුවරඑළිය, වැලිමඩ, බණ්ඩාරවෙල, හපුතලේ, ඌව පරණගම වැනි ශීත දේශගුණයක් සහිත ප්‍රදේශවල සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය ජීවනෝපාය ලෙස පවත්වාගෙන යන ව්‍යවසායකයින්ට කුඩා භූමි ප්‍රමාණයකින් මාසික ව ඉහළ ආදායමක් ලබාගත හැකි ව්‍යාපෘතියකි. ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂී ව්‍යාපෘතියක් වන මෙය රු. 400,000.00 ක පමණ ආයෝජනයකින් ආරම්භ කළ හැකි අතර, මේ සඳහා අවශ්‍ය තාක්ෂණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකිය.

2. අමුද්‍රව්‍ය

අවශ්‍ය බීජ වෙළඳපොළෙන් මිලදී ගත හැකිය. බොනාෆීල්ඩ්, සකුරා වැනි බීජ ද මිල අධික එෆ්ඩාල් වැනි ඉහළ අස්වැන්නක් දෙන බීජ ද වෙළඳපොළෙන් ලබාගත හැකිය. වගාව සඳහා ඇල්බට් සොලූෂන් වැනි රසායනික පොහොර වර්ග අත්‍යාවශ්‍ය වන අතර, දිලීර නාශක හා කෘමිනාශක ද වෙළඳපොලෙන් ලබාගත හැකිය.

3. වෙළඳපොල

සුපිරි වෙළඳසැල්වල හා සංචාරක හෝටල් සඳහා පවතින ඉල්ලුමට ප්‍රමාණවත් තරම් සැපයුමක් නොපවතින බැවින් ඉහත ප්‍රදේශවල ජීවත්වන ඕනෑම අයෙකුට මෙම විභවතාවය සපුරාලීමට වෙළඳපොලට පිවිසීමේ හැකියාව ඇත. විශේෂයෙන් මාලදිවයිනට විශාල වශයෙන් මෙය අපනයනය කරන අතර එමඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලබාගත හැකිය.

4. ආයෝජනය

මෙම ව්‍යාපාරය කෘෂිකාර්මික ව්‍යාපාරයක් වන අතර මෙහි මූලික අස්වනු ලබා ගැනීම සඳහා මාසයක කාලයක් ගතවේ. ඒ සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 365,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	- රු. 36,500.00
	මුළු එකතුව	- **රු. 401,500.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංක	වත්කම්	වටිනාකම (රු.)
01	ඉඩම් පර්චස් (බදු පදනම මත)	20,000.00
02	ගොඩනැගිලි (වර්ග අඩි 1,000 හරිතාගාරය)	300,000.00
03	යන්ත්‍ර	25,000.00
04	උපකරණ	5,000.00
05	ජලය සපයා ගැනීම	15,000.00
	එකතුව	365,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)

මසකට කි.ග්‍රෑම් 350 ක් නිෂ්පාදනය කරන අතර මාසයකින් අස්වනු ලබාගත හැකිය.

අංක	විස්තරය	මාසයක් සඳහා වියදම (රු.)
01	ගොම පොහොර	7,500.00
02	මල්ච් පොලිතින්	2,000.00
03	දිලීර නාශක	3,000.00
04	කෘමිනාශක	1,500.00
05	මූලික පොහොර	1,000.00
06	දෙවන පොහොර	4,000.00
07	බීජ පැකට් 01	6,500.00
08	ශ්‍රම වියදම්	10,000.00
09	ඇසුරුම්	1,000.00
	එකතුව	36,500.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

රසායන ද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් දේශීය වෙළඳපොලෙන් මිලදී ගැනීමට සැලසුම්කර ඇති අතර, එක් පැළයකින් මසකට කි. ග්‍රෑම් 1 ක අස්වැන්නක් ලබාගත හැකි වේ. පර්චස් 4 ක පැළ 350 ක් සිටුවිය හැකිය.

මාසික විකුණුම් ආදායම

= එක් පැළයකින් ලබාගන්නා කි.ග්‍රෑම් ප්‍රමාණය × පැළ සංඛ්‍යාව × කි.ග්‍රෑම් 1 ක මිල

= කි.ග්‍රෑම් 1 × පැළ 350 ×රු.150.00

= රු. 52,500.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = යෙදවුම් වියදම + සෘජු ශ්‍රම වියදම් + සෘජු වෙනත්

= රු. 9,500.00 + රු. 10,000.00 + රු. 1,000.00

= රු. 20,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ (ජලය, විදුලිය,ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්). එය මාසයක් සඳහා රු. 5,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	=	මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	=	රු. 52,500.00 - (රු. 20,500.00 + රු. 5,000.00)
	=	රු. 52,500.00 - රු. 25,500.00
	=	රු. 27,000.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 10,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, රු. 27,000.00 ශුද්ධ ලාභයක් උපයාගත හැකිය.

චයිනීස් එළවළු වගාව

1. හැඳින්වීම

අතීතයේ සිටම ශ්‍රී ලාංකික ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය ලෙස සැලකෙන්නේ කෘෂිකර්මාන්තය වන අතර එයිනිදු එළවළු වගා ක්ෂේත්‍රයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. විශේෂයෙන් ඉහළ ඌව කලාපය හා ශීත දේශගුණයක් පවතින නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ජනතාවට උඩරට එළවළු වගාව පිළිබඳ පවතින සුවිශේෂී හැකියාව මත යෙදෙන සාම්ප්‍රදායික කෘෂිකාර්මික රටාව වර්තමානය වන විට නව මාවතකට යොමුව ඇත. එනම් කුඩා භූමි ප්‍රමාණයක් තුළ වැඩි ලාභදායිකත්වයක් සහිත එළවළු වගාව කරා යොමුවීමේ ඉහළ නැඹුරුවක් දක්නට ලැබේ. එයිනිදු ඉහළ ආයෝජනයකින් යුතු ආරක්ෂිත ගෘහ තුළ භෝග වගාවට වඩා, අඩු ආයෝජනයක් සහිතව විවෘත භූමි ප්‍රදේශයන්හි සංචාරක හෝටල් කර්මාන්තය හා සෘජුවම බැඳී පවතින චයිනීස් එළවළු භෝග වගාව කෙරෙහි සම්බන්ධ වීම තුළින් කෙටි කාලයක් තුළ සාපේක්ෂව ඉහළ ආදායමක් ලබා ගැනීමට පෙළඹී ඇත. ඒ අතර චයිනීස් එළවළු වර්ග ලෙස සලකන චයිනීස් කැබේජ්, රෙඩ් කැබේජ්, සැල්දිරි, බ්‍රෝකෝලි, අයිස්බර්ග්, යන බෝගයන් විවෘත පරිසරයක වගා කිරීම වර්තමානය වන විට ඉහළ ආදායමක් ලබා දෙන ව්‍යාපාරික කෘෂිකර්මාන්තයක් බවට පත්ව ඇත.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

එළවළු බීජ පැකට් හෝ ටින්
ගොම / කොම්පෝස්ට් පොහොර
රසායනික පොහොර (යූරියා / TDM)
කෘෂි රසායන / දිලීර නාශක / කෘමි නාශක

3. වෙළඳපොල

චයිනීස් එළවළු වර්ග සඳහා දේශීය වෙළඳපොල තුල මෙන්ම විදේශීය වෙළඳපොල තුළද ඉහළ ඉල්ලුමක් පවතී. විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ විහිදී ඇති සංචාරක හෝටල් බොහොමයක් තම ආහාර වට්ටෝරු තුළ චයිනීස් එළවළු වර්ග සඳහා සුවිශේෂී ස්ථානයක් ලබාදී ඇති බැවින් ඒ තුළ විශාල වෙළඳපොළක් නිර්මාණය වී ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවේ ඇති සියළුම හෝටල් පරිශ්‍රයන්හි ආහාර වට්ටෝරු තුල අවම වශයෙන් එක් චයිනීස් එළවළු වර්ගයක් හෝ අඩංගුව ඇති බැවින් ඒ තුළද වෙළඳපොළ අවස්ථා ගොඩ නැගී ඇත. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සුපිරි වෙළඳ සැල් ජාලය තුළද වෙළඳපොල අවස්ථා නිර්මාණය වී ඇත. එමෙන්ම සංචාරක කර්මාන්තය හා බැඳී ඇති Homestay ස්ථානයන්හි ද චයිනීස් එළවළු ප්‍රභේද සඳහා ඉල්ලුම පවතී. දේශීය වෙළඳපළ පමණක් නොව විවිධ අපනයනකරුවන් මාර්ගයෙන් ශ්‍රී ලාංකික චයිනීස් එළවළු ප්‍රභේද විදේශ වෙළඳපලට යොමු කරන අතර ඒ සඳහා විශාල වෙළඳපොලක් නිර්මාණය වී ඇත.

4. ආයෝජනය

චයිනීස් එළවළු වර්ග බොහොමයක්ම පාහේ සමාන ආයෝජනයකින් ව්‍යාපාරයක් ලෙස ආරම්භ කළ හැකි අතර, මෙහිදී එක් චයිනීස් ප්‍රභේදයක් සඳහා පමණක් ගණනය කිරීම් ඇතුළත් කර ඇත. එමෙන්ම ගණනය කිරීම් සියල්ල එක් කන්නයක් සඳහා සිදු කර ඇති අතර, සෑම චයිනීස් බෝග වර්ගයක්ම මාස 02 - 04 ක් අතර කාලයක් තුල තම වගා කන්නය අවසන් කරනු ලැබේ.

චයිනීස් කැබේජ් ප්‍රභේදය සඳහා (පර්චස් 10 ක භූමියක් තුල පැල 1500 ක් වගා කිරීම සඳහා) අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 80,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය	= රු. 65,000.00
	මුළු එකතුව	= **රු. 145,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය යැයි සලකන යන්ත්‍ර, උපකරණ සඳහා වියදම් ඇතුළත් කර ඇත. ව්‍යාපාරය පවත්වාගෙන යන භූමිය සඳහා මුදල් ඇතුළත් නොකරන ලදි.

අංකය	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	වතුර මෝටරය	35,000.00
02	බෙහෙත් ඉසින යන්ත්‍රය	25,000.00
03	හෝස් බට	5,000.00
04	ප්ලාස්ටික් කූඩ	10,000.00
05	අනෙකුත් උපකරණ	5,000.00
	එකතුව	80,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

අංකය	විස්තරය	කන්නයකට අදාල වියදම (මාස 02 කට)
01	අමුද්‍රව්‍ය සඳහා වියදම (බීජ/පොහොර/ කෘෂි රසායන ඇතුළුව)	10,000.00
02	ශ්‍රම වියදම	50,000.00
03	වෙනත් වියදම්	5,000.00
	එකතුව	65,000.00

05. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

මෙම ව්‍යාපාරය සඳහා එක් කන්නයකට ආදායම්, වියදම් ඇස්තමේන්තු කර ඇත.
(වක්‍ර පිරිවැය ලෙස දුරකථන වියදම්, අලෙවි වියදම් ඇතුළත් කර ඇත)

එක් කන්නයක් තුල සම්පූර්ණ නිෂ්පාදන ප්‍රමාණය = කිලෝ 750
කන්නයක කාලය = මාස 02
ඒකක (1 kg) මිලෙහි සාමාන්‍ය අගය = රු. 250.00

කන්නයක මුළු විකුණුම් ආදායම = කිලෝ 750 × රු. 250
= රු. 187,500.00

කන්නයක සෘජු පිරිවැය = රු. 65,000.00
කන්නයක වක්‍ර පිරිවැය = රු. 15,000.00

කන්නයක ශුද්ධ ලාභය	= කන්නයක විකුණුම් ආදායම - කන්නයක මුළු පිරිවැය
	= කන්නයක විකුණුම් ආදායම - (කන්නයක සෘජු පිරිවැය + කන්නයක වක්‍ර පිරිවැය)
	= රු. 187,500.00 - (රු. 65,000.00 + රු. 15,000.00)
	= රු. 107,500.00
මාසික ශුද්ධ ලාභය	= රු. 107,500/2
	= රු. 53,750.00

මෙහිදී එක් කන්නයක් තුළ පර්චස් 10ක භූමි ප්‍රදේශයක් චයිනීස් කැබේජ් පැළ 1500 ක ප්‍රමාණයක් වගා කළ විට තනි පුද්ගලයෙකුට මාසික ශුද්ධ ලාභය ලෙස රු. 53,750.00 ක් සහ තම වැටුප ලෙස රු. 25,000.00 ක මුදලක් උපයා ගැනීමේ හැකියාව ඇත. වගා භූමි ප්‍රමාණය වැඩි කර ගැනීමෙන් මෙම ලාභදායිත්වය ඉහළ අගයකින් වැඩි කර ගැනීමේ හැකියාව ඇත.

බෝගන්විලා වගාව

1. හැඳින්වීම

හිරු එළිය ප්‍රියකරන වර්ණ ගණනාවකින් යුත් පත්‍ර තරමටම මල් පිපෙන ඉතා අලංකාර ශාකයක් වන බෝග න්විලා සඳහා වර්තමාන වෙළඳපොලෙහි ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. අතු කැබලි මඟින් වුවද බෝ කරගත හැකි ශාකයක් වන බෝගන්විලා වැසි නොමැති කාලයකදී වුවද මල්හට ගැනීමේ අඩුවක් නොමැත. වර්තමානයේ බොහෝ කාන්තාවන් සිය කුටුම්භයට ආර්ථික ශක්තියක් වීමෙහිලා විසිතුරු මල් කර්මාන්තයේ නියැළෙති. සිය පවුල් ජීවිතයට පමණක් සීමා වී සිටින ගෘහණියන්ට තම ඒකාකාරී ජීවන රටාවෙන් මිද මෙම ක්ෂේත්‍රයට යොමු වීම තුළින් මානසික තෘප්තිය සමඟ ආර්ථික වාසිද අත් කරගත හැක.

ඉතා සුළු ආයෝජනයකින් ආරම්භ කළ හැකි වීම හා දැරීමට සිදුවන කාරක ප්‍රාග්ධන පිරිවැය අවම වීම බෝගන්විලා වගා ක්ෂේත්‍රය සඳහා යොමු විමට හේතු වේ.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

බෝගන්විලා දඬු කැබලි
මුල් අද්දවන හෝමෝන
දිලීර නාශක
පොහොර
පොලිතීන් කවර (පොට්)
වගා මාධ්‍ය (මතුපිට පස්, වැලි අවශ්‍ය නම් දහයියා අළු)
ජලය

3. වෙළඳපොළ

තොග හා සිල්ලර මිලට අලෙවි කළ හැකි බෝගන්විලා පැළ සඳහා වර්තමාන වෙළඳපොල තුළ ඉතා ඉහළ ඉල්ලුමක් ඇත.

ගෙවතු හා උද්‍යාන අලංකරණයටද යොදා ගත හැකි බැවින් හෝටල්, නිවාඩු නිකේතන ඇතුළුව රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්ගෙන් බෝගන්විලා පැළ සඳහා විශාල ඉල්ලුමක් පවතී.

4. ආයෝජනය

මසකට බෝගන්විලා පැළ 1200ක් (වගා ගෘහයකට පැළ 600ක් ලෙස වගා ගෘහ 2ක්) කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 16,800.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසයක් සඳහා)	= රු. 16,520.00
	මුළු එකතුව	= **රු. 33,320.00**

4.1 ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මේ සඳහා පර්චස් 5 ක පමණ බිම් ප්‍රමාණයක් ප්‍රමාණවත් වන බව උපකල්පනය කරයි.
වගා ගෘහයේ ප්‍රමාණය වර්ග අඩි 24 (දිග 12× පළල 2× උස 1.5)කි.

අංකය	යන්ත්‍රසූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
01	මව් ශාක (රු. 80.00 x 100)	8,000.00
02	ඉටි රෙදි හා කම්බි (වගා ගෘහය)	2,700.00
03.	මල් බාල්දිය	300.00
04	උදැල්ල	1,000.00
04	විල් බැරෝව	3,000.00
05	වෙනත් උපකරණ	1,000.00
06	වතුර බට හා කරාමය	800.00
	මුළු එකතුව	16,800.00

4.2 කාරක ප්‍රාග්ධනය පිරිවැය මසකට (දින 26 ක් සඳහා)

මසකට (දින 26) බෝගන්විලා පැළ 1200 ක් නිෂ්පාදනය කරනු ලබයි.

අංකය	විස්තරය	මාසික වියදම (රු.)
01	ද්‍රව්‍ය සඳහා අමුද්‍රව්‍ය සඳහා පොලිතීන් ඇසුරුම් (පොට්)	 800.00 720.00
02	ශ්‍රමය සඳහා	13,000.00
03.	වෙනත් වියදම් ගෙන ඒමේ කුලිය හා වෙනත්	 2,000.00
	මාසික සෘජු පිරිවැය	16,520.00

5. මාසික ශුද්ධ ලාභය

මසකට දින 26 ක් ව්‍යාපාර කටයුතු සිදු කරන බව උපකල්පනය කරයි. මසකට බෝගන්විලා පැළ 1200 ක් නිෂ්පාදන කර අලෙවි කිරීමට සැලසුම් කරන්නේ නම් එක පැළයක් රු. 40.00 ක මිලකට අලෙවි කළ හැකිය.

පැළ වලින් 5%ක් හානි වේ යැයි උපකල්පනය කරයි. එම නිසා මසකට විකුණන පැළ ගණන වනුයේ 1140කි.

මාසික විකුණුම් ආදායම = මසක නිෂ්පාදනය × පැළයක මිල
= 1140 × රු. 40.00
= 45,600.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
මාසික සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් පිරිවැය
= රු. 1,520.00 + රු. 13,000.00 + රු. 2,000.00
= රු. 16,520.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා දරන වියදම් ය. (ක්ෂය, ලිපිද්‍රව්‍ය, දුරකතන හා වෙනත්) එය මාසයක් සඳහා රු. 2,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 16,520.00 + රු. 2,000.00
= රු. 18,520.00

මාසික ශුද්ධ ලාභය	=	මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	=	රු. 45,600.00 - රු. 18,520.00
	=	රු. 27,080.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට ශ්‍රම වැටුප ලෙස රු. 13,000.00ක් සහ ශුද්ධ ලාභය ලෙෂ රු. 27,080.00 උපයාගත හැකිය.



බඩ ඉරිඟු වගාව

1. හැඳින්වීම

මෙක්සිකෝ රාජ්‍යයේ උපත ලදැයි සැලකෙන බඩ ඉරිඟු ශාකය ශ්‍රී ලංකාවේ හේන් ගොවිතැනේ දී මෙන්ම ගෙවතු වගාවක් ලෙස ද බහුලව වගා කරනු ලබන බෝගයක් ලෙස හැඳින්විය හැකිය. නමුත් ශ්‍රී ලංකාවේ පාරිභෝගික අවශ්‍යතාවයට ප්‍රමාණවත් නිෂ්පාදනයක් තවමත් රට තුළ වගා කරනු නොලැබේ. 2020 දී මෙ.ටො 80000 පමණ මෙරටට ආනයනය කර ඇත. වසරකට කන්න දෙකක් වගා කළ හැකි අතර ළපටි බඩ ඉරිඟු (Baby Corn) නිපදවන්නේ නම් කන්න තුනක් වගා කල හැකිය. දිවයිනේ වියළි හා අතර මැදි කලාප වල සාර්ථකව බඩ ඉරිඟු වගා කළ හැකිය. අක්කරයක බඩ ඉරිඟු වගාවකින් කිලෝ ග්‍රෑම් 2100 ක පමණ අස්වැන්නක් ලබා ගත හැකි අතර පසේ සාරවත් භාවය අනුව අස්වැන්න වැඩිකර ගත හැකිවේ. ව්‍යාපාරික අදහසක් ලෙස බඩ ඉරිඟු වගාවට යොමු වීම ලාබදායි ආර්ථික කටයුත්තක් ලෙස හැඳින්විය හැකිය.

2. අවශ්‍යය අමුද්‍රව්‍ය

■ බඩ ඉරිඟු බීජ (999, JET, 808, 984)	-	වෙළඳපොලෙන් මිලදී ගත හැකිය.
■ රසායනික පොහොර (යූරියා, TSP, MOP, TMD)	-	වෙළඳපොලෙන් මිලදී ගත හැකිය.
■ කෘෂි රසායන	-	වෙළඳපොලෙන් මිලදී ගත හැකිය.

3. වෙළඳපොල

ශ්‍රී ලංකාවේ බඩ ඉරිඟු වගාව සාම්ප්‍රදායික වගා කටයුත්තක් ලෙස පැවතීම නිසා රටට අවශ්‍ය ඉල්ලුම සැපයීමට මෙතෙක් හැකිවී නොමැත. එසේම ලාංකික බඩ ඉරිඟු පාරිභෝගික අවශ්‍යතාවයෙන් දේශීයව සපුරාලනු ලබන්නේ අමුද්‍රව්‍යක් ලෙස නිපදවන ප්‍රමාණය පමණි. නමුත් ඇතැම් අස්ථාවලදී එය ද සම්පූර්ණ කිරීමට අපහසු වන අවස්ථා ඇත. ඒ අනුව අගය එකතු කළ බඩ ඉරිඟු නිෂ්පාදන ආනයනය කිරීම නිසා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටින් පිටතට ඇදී යයි. විශේෂයෙන් ළපටි බඩ ඉරිඟු (Baby Corn) ඉරිඟු පිටි (Corn Flour) ඉරිඟුවලින් සාදන ලද උදෑසන ආහාර (Corn Flakes) වැනි දේ තවමත් ආනයනය කරනු ලබයි. එබැවින් අගය එකතු කල බඩ ඉරිඟු නිෂ්පාදන සඳහා ලංකාව තුළ ඉහල ඉල්ලුමක් පවතී. විශේෂයෙන් හෝටල් ක්ෂේත්‍රය තුළ මෙම ඉල්ලුම මනාව කැපී පෙනේ.

4. ආයෝජනය

අක්කර 3 ක බඩ ඉරිඟු වගාවකින් වියළි ඇට ලබා ගැනීම සඳහා මාස 5 ක කාලයක් ගත වේ. ඒ සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල (බදු පදනම මත ලබා ගන්නා ඉඩමක් හෝ තමා සතු ඉඩමක් යොදා ගැනේ.)

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 25,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (එක් කන්නයක් සඳහා)	- රු. 239,750.00
	මුළු එකතුව	- **රු 264,750.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

එක් කන්නයක් සඳහා අක්කර 3 ක් වගා කිරීමට ස්ථාවර ප්‍රාග්ධන අයිතමයන් කුලී පදනම මත ලබා ගැනීම තුළින්, ඒ සඳහා වැය වන අධික පිරිවැය අවම කර ගත හැකිය. වගා බිම බදු පදනම සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංකය	යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	උදළු (6)	12,000.00
02	කැති (02)	3,000.00
03	වෙනත් උපකරණ	10,000.00
	එකතුව	25,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (කන්නයක් සඳහා)

අක්කර 3 ක බඩ ඉරිඟු වගා කිරීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය.

අංකය	විස්තරය	අක්කර 3 සඳහා වියදම (රු.)
01	බඩ ඉරිඟු බීජ (5 Kg) (999/JET)	27,000.00
02	පොහොර	27,000.00
03	කෘෂි රසායන	13,000.00
04	ශ්‍රමය (ඉඩම සකස් කිරීම, වගා කටයුතු හා අස්වනු නෙළීම)	106,750.00
05	ට්‍රැක්ටර් කුලී	54,00.000
06	වෙනත් වියදම්	12,000.00
	එකතුව	239,750.00

5. කන්නයක ශුද්ධ ලාභය

අක්කර 3g බඩ ඉරිඟ ඇට අස්වැන්න 6300kg ලෙස හා ඇට 1kg සඳහා විකුණුම් මිළ රු. 80.00 ලෙස උපකල්පනය කර ඇත. පසේ සාරවත් බව අනුව අස්වනු ප්‍රමාණය වෙනස් වේ. ඒ අනුව,

අක්කර 3ක වගාවේ ආදායම
අක්කර 3ට ඇට = 6300kg
ඇට 1kg මිළ = රු. 80.00
= රු. 6,300.00 × 80
කන්නයේ මුළු ආදායම = රු. 504,000.00

කන්නයක මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

- සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම් + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම්
  = රු. 67,000.00 + රු. 106,750.00 + රු. 66,000.00
  කන්නයේ සෘජු පිරිවැය = රු. 239,750.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම්
(ප්‍රවාහන වියදම්/සංග්‍රහ වියදම්)
කන්නයේ වක්‍ර පිරිවැය = රු. 25,000.00

කන්නයක ශුද්ධ ලාභය	=	මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	=	රු. 504,000.00 - (රු. 239,750.00 + රු. 25,000.00)
	=	රු. 239,250.00
මාසික සාමාන්‍ය ශුද්ධ ලාභය	=	රු. 47,850.00

- ඒ අනුව අක්කර 3කින් කන්නයක් සඳහා බඩ ඉරිඟු ඇට නිෂ්පාදනය මගින් රු 239,250ක ආදායමක් ලබා ගත හැකිය. එසේම තම ශ්‍රමය දායක කිරීම මගින් වියදම් අවම කර ගැනීමේ හැකියාව පවතී.

- මීට අමතරව අක්කර 3ක බඩ ඉරිඟු කිරි කරල් (තම්බා අහාරයට ගන්නා) වගාවක් සිදුකරනනේ නම් කිරි කරල් 45000 පමණ අස්වැන්නක් ලබා ගත හැකිය. කිරි කරලක් රු.12ක පමණ මිළකට අලෙවි කිරීමේ හැකියාව ඇත. ඒ අනුව අක්කර 3ක බඩ ඉරිඟු කිරි කරල් වගාවකින් (45,000 × 12) රු. 540000 පමණ ආදායමක් උපයාගත හැකි අතර දින 72 කින් කිරි කරල් අස්වන්න නෙළාගත හැකිය.

උක් වගාව

01. හැඳින්වීම

උක් ශාඛය සීනි නිෂ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස යොදා ගනී. උක් වගාව වසරකට එක් වරක් සිදු කරන අතර එයින් කන්න තුනක් යනතුරු ආදායම් උපයාගත හැකිය. මෙම වගාව සඳහා විශාල වශයෙන් යන්ත්‍රසූත්‍ර යොදා ගැනීමක් දක්නට නොලැබෙන අතර අත්දැකීම්, පළපුරුද්ද හා කැපවීම මත ඉහළ ආදායමක් උපයා ගත හැකි කෘෂිකාර්මික බෝග වගාවකි. එසේම සීනි කර්මාන්ත ශාලා පවතින හිඟුරාන, කන්තලේ හා සෙවනගල ආශ්‍රිතව සිදු කළ හැකි ව්‍යාපාර අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය.

02. අමුද්‍රව්‍ය

- උක් බීජ
- රසායනික කැට පොහොර හෝ කාබනික පොහොර

(මෙම අමුද්‍රව්‍ය සීනි කර්මාන්තශාලාව මගින් සපයා ගත හැකිය.)

03. වෙළෙඳපොළ

උක් වගාවේ ප්‍රධානතම වෙළෙඳපොළ වන්නේ සීනි නිෂ්පාදන කර්මාන්තශාලාවන්ය. මෙහිදී මෙම කර්මාන්තශාලා විසින් වගාකරුවන්ට උක් බීජ, රසායනික පොහොර හෝ කාබනික පොහොර හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදී ඉන් අනතුරුව ගොවීන්ගේ අස්වැන්න ද මිලදී ගැනීම සිදු කරයි. එබැවින් මෙම වගාකරුවන්ට තම අස්වැන්න අලෙවි කර ගැනීමට අමතර වෙහෙසක් දැරිය යුතු නොවේ.

04. ආයෝජනය

අක්කරයක භූමියක උක් වගාව සිදු කිරීම සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල (බදු පදනම මත ලබා ගත් ඉඩමක් හෝ තමා සතු ඉඩමක වගාව සිදු කරන සලකා ඇත.)

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 10,000.00
කාරක ප්‍රාග්ධන පිරිවැය	= රු. 229,000.00
මුළු එකතුව	= **රු. 239,000.00**

05. මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී උක් වගාකරුවන්ට අදාළ සීනි කර්මාන්ත ශාලාව මගින් අවශ්‍ය බිම් සැකසීමේ යන්ත්‍ර සැපයීම සිදු කරන බැවින් මොවුන්ට විශේෂයෙන් යන්ත්‍ර සූත්‍ර උපකරණ මිලදී ගැනීමට අවශ්‍යතාවයක් නොමැත. ඊට අමතරව අවශ්‍ය වන උදැල්ල, කැත්ත වැනි සුළු උපකරණ වලට පමණක් පිරිවැයක් දැරීමට සිදුවේ.

කාරක ප්‍රාග්ධන පිරිවැය (පළමු වගා කන්නය - මාස 4ක් සඳහා)

අංකය	විස්තරය	වටිනාකම රු.
1	උක් බීජ	66,000.00
2	රසායනික පොහොර	15,000.00
3	බිම් සකස් කිරීමේ වියදම (යන්ත්‍ර කුලිය)	15,000.00
4	ශ්‍රම වියදම - බිම සකස් කිරීම	10,000.00
5	අස්වනු නෙලීම	120,000.00
6	වෙනත්	3,000.00
7	මුළු එකතුව	229,000.00

06. පළමු කන්නය සඳහා ශුද්ධ ලාභය

විකුණුම් ආදායම = විකුනුම් ඒකක ගණන × (ටොන්) එකකයක මිල
= 90 × රු. 6,000.00
= රු. 540,000.00

මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
= රු. 226,000.00 + රු. 3,000
= රු. 229,000.00

සෘජු පිරිවැය = සෘජු ද්‍රව්‍ය + සෘජු ශ්‍රමය + සෘජු වෙනත්
= රු. 66,000.00 + රු. 130,000.00 + රු. 30,000.00
= රු. 226,000.00

කන්නයක් (මාස 4ක) සඳහා ශුද්ධ ලාභය

කන්නයක විකුණුම් ආදායම	= රු. 540,000.00
කන්නයක මුළු පිරිවැය	= රු. 229,000.00
කන්නයක ශුද්ධ ලාභය	= රු. 311,000.00

කුරක්කන් වගා කිරීම

01. හැඳින්වීම

කුරක්කන් යනු පෝෂණීය මෙන්ම ඖෂධී ගුණයෙන් යුතු රසවත් ධාන්‍යමය ආහාරයකි. එහි පවතින ඖෂධීයමය ගුණය නිසා වර්තමානයේ කුරක්කන් වගාව කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇත. කුරක්කන් ඇට පිටි කිරීමෙන් පසුව තලප, හැලප, රොටී, බිස්කට්, කේක් ,කැඳ සහ පිට්ටු වැනි රසවත් ආහාර බොහොමයක් සාදා ගත හැකිය.

කුරක්කන් වගාව වියළි හා අතරමැදි කළාප වල සාර්ථක ලෙස වගා කළ හැකි බෝගයකි. කාබනික ද්‍රව්‍ය අඩංගු ජලය හොඳින් බැසයන සාරවත් පසක් කුරක්කන් වගාව සඳහා සුදුසු වේ .මහ කන්නයේදී වර්ෂා ජලයෙන් මෙන්ම යල කන්නයේදී ජල සම්පාදනය යටතේ මෙම බෝගය වගා කළ හැකිය. කුරක්කන් වගාව සිදුකිරීමේදී බිම් සකස් කිරීම, සුදුසු බීජ තෝරා ගැනීම, වගාව ආරම්භ කිරීම, සුදුසු පොහොර යෙදීම, වල් පැල පාලනය, කෘමි හා රෝග පාලනය, ජල සම්පාදනය හා අස්වනු නෙලීම හා ගබඩා කිරීම යන අනිවාර්ය ක්‍රියාවලින් නිවැරදිව සිදුකළ යුතුය. වැඩි අස්වැනන්ක ලබා ගැනීම සඳහා බීජ තවාන් කර පැළ සිටුවීම සිදු කල යුතුය.

කුරක්කන් වගාකර අසවැන්න ලබා ගැනීම සඳහා අවම වශයෙන් දින 90ක කාලයක් ගත වේ.
අස්වැන්න නෙලීමෙන් පසුව කුරක්කන් ඇට හොඳින් වේලා තෙතමනය රහිත මීයන් හා කෘමි සතුන්ගේ උවදුරු වලින් තොර ස්ථානයක ගබඩා කරගත යුතුය.

02. අමුද්‍රව්‍ය

උසස් තත්ත්වයෙන් යුතු සහතික බීජ - එම්. අයි. 301, එම්. අයි. 302 හා රවි යන ප්‍රභේද වගාව සඳහා නිර්දේශ කර ඇත. මෙහි දී රවි යන ප්‍රභේදයෙන් වැඩි අස්වැන්නක් ලබා ගත හැකිය. බීජ තවාන් කර පැළ සිටුවීම මගින් ඵලදාව වැඩිවන නිසා නිර්දේශිත තත්ත්ව හා කාලයන් යටතේ බීජ තවාන් කළ යුතුය.

පස - වගාව සඳහා පස සැකසීම සිදු කළ යුතු අතර, තවාන් සැකසීමේදී ජීවානුහරණය කරන ලද පස් භාවිතා කරයි.
ජලය - මහ කන්නයේ දී වර්ෂාව මගින් ජල අවශ්‍යතාවය සපිරෙන අතර යල කන්නයේ දී වගාවට අමතර ජලය සැපයීම සිදු කළ යුතුය. වියළි කාල වලදී සතියකට වරක් ජල සම්පාදනය සිදුකළ යුතුය.
පොහොර- කාබනික හා රසායනික පොහොර භාවිතය සිදුකළ හැකිය. රසායනික පොහොර භාවිතය අනිවාර්ය නොවේ. කාබනික පොහොර භාවිතය පසට සහ භෝග සඳහා ද වඩා හිතකර තත්ත්වයන් ගෙන දෙයි. කාබනික පොහොර යෙදීමේදී බිම් සකස් කිරීමෙන් පසුව යෙදිය යුතු අතර, අක්කරයක් සඳහා කිලෝ ග්‍රෑම් 1,000 යෙදිය යුතුය.

03. වෙළඳපොල

දේශීය වෙළඳපොල තුල කුරක්කන් සඳහා නාගරික හා ග්‍රාමීය සියලුම වයස් කාණ්ඩයනගෙන් ඉල්ලුමක් පවතින අතර දියවැඩියාව, ස්ථූලතාවය යනා දී බෝනොවන රෝග වලින් පෙළෙන රෝගීන්ගෙන් කුරක්කන් සඳහා සාපේක්ෂව වැඩි ඉල්ලුමක් පවතී. පාරිභෝගික ආදායම් මට්ටම සමග ඉල්ලුමෙහි වෙනසක් සිදු නොවේ. කුරක්කන් යනු අපනයන විභවතාවයක් පවතින භෝගයකි.

තොග සහ සිල්ලර වශයෙන් අලෙවිය සිදුකළ හැකි අතර, කුරක්කන් පිටි නිෂ්පදනය සිදුකරන කුඩා පරිමාණ ව්‍යාපාරිකයින්ට අලෙවි කිරීම සහ සෘජුවම පාරිභෝගිකයාට ලබා දීම සාපේක්ෂව ලාභ සහිත අලෙවි අවස්ථාවන් වේ.

සෑම විටම මිල උච්චාවචනයන් කෙරෙහි අවධානය යොමු කල යුතුය.
වර්තමානයේ කුරක්කන් ඇට කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල් 450.00 - 500.00 අතර මුදලකට අලෙවි වේ.

04. ආයෝජනය

කන්නයක දී කිලෝ ග්‍රෑම් 850 ක අස්වැන්නක් ලබා ගන්නා කුරක්කන් වගාවක අවම වශයෙන් ආයෝජනය කලයුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 100,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය- එක් කන්නයක් සඳහා	= රු. 115,000.00
	මුළු එකතුව	= **රු. 215,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීමට අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත.

අංක	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	වටිනාකම (රු.)
01	වතුර පොම්පය සහ වතුර මෝටරය	40,000.00
02	වල් පැල ඉවත් කිරීමේ යන්ත්‍රය	35,000.00
03	පලිබෝධනාශක ඉසීමේ උපකරණ	15,000.00
04	වෙනත්	10,000.00
	එකතුව	100,000.00

මීට අමතරව මෙහි දී බීජ කරල් වලින් ඉවත් කිරීමේ කියාවලියේ දී යන්ත්‍රයක් (රු. 400,000.00) යොදාගත හැකිය. නමුත් එය අත්‍යවශ්‍ය නොවේ. මෙම ක්‍රියාවලිය මිනිස් ශ්‍රමය භාවිතාකර සිදු කළ හැකි අතර යන්ත්‍රය භාවිතයේ දී ඵලදායිතාවය වැඩි වේ.

එම යන්ත්‍රය භාවිතයට ගන්නේ නම් මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය රු. 500,000.00 දක්වා ඉහල යයි

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය කන්නයක් සඳහා

එක් කන්නයක දී (දින 90) කුරක්කන් කිලෝග්‍රෑම් 800 ක අස්වැන්නක් ලැබෙන අතර වසරකට කන්න 2ක් වගා කරනු ලැබේ.

අංක	විස්තරය	කන්නයක් සඳහා වියදම රු.
1	අමු ද්‍රව්‍ය	25,000.00
2	ශ්‍රම වියදම	70,000.00
3	වෙනත් වියදම්	20,000.00
	එකතුව	115,000.00

05. ශුද්ධ ලාභය

උපකල්පන

- අස්වැන්න සියල්ල අලෙවි වන බව.
- කුරක්කන් වගාව වියළි හෝ අතරමැදි කලාපයේ තමා සතු භූමියක හෝ බදු පදනම මත ලබාගත් භූමියක සිදුකල හැකි බව.
- පස සකස් කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර බාහිරින් කුලී පදනම මත ලබා ගන්නා බව.
- යල හා මහ කන්න දෙකේම වගා කරන බව.
- වගාකර අස්වැන්න ලබා ගැනීම සඳහා අවම වශයෙන් දින 90ක් ගත වන බව.
- අස්වනු නෙලීම මිනිස් ශ්‍රමය භාවිතයෙන් සිදු කරන බව.
- පළිබෝධ උවදුරු පැමිණියහොත් පමණක් පළිබෝධ නාශක භාවිතා කරන බව.
- බීජ තවාන් කර පැළ සිටුවීම මගින් වගාව සිදුකරන බව.
- මිල ගණන් උච්චාවචනයට ලක් විය හැකි බව.

කන්නයක් සඳහා විකුණුම් ආදායම

(කුරක්කන් ඇට වශයෙන් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායම)

විකුණුම් ආදායම = (කන්නයක නිෂ්පාදනය කිලෝග්‍රෑම් 800 × රු.500.00)
විකුණුම් ආදායම = රු. 400,000.00

කන්නයක් සඳහා මුලු පිරිවැය	= සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය	= සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම
කන්නයක් සඳහා සෘජු පිරිවැය	= රු. 25,000.00 + රු. 70,000.00 + රු. 20,000.00
	= රු. 115,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ. (ජලය, විදුලිය, ප්‍රවාහන, අලෙවි හා අනෙකුත්) එය එක් කන්නයක් සඳහා රු. 5,000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

ශුද්ධ ලාභය = එක් කන්නයක විකුණුම් ආදායම – කන්නයක මුලු පිරිවැය
= රු. 400,000.00 - (රු. 115,000.00 + රු. 5,000.00)
= රු. 280,000.00

තනි පුද්ගලයෙකුගේ ශ්‍රමය අවශ්‍ය ක්‍රියාවන් වලදී ව්‍යාපාරිකයා ශ්‍රම දායකත්වය ලබා දෙන්නේ නම් ඔහුට එක් කන්නයක් සඳහා රු. 30,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 280,000.00 ක් උපයා ගත හැකි වේ. (මාසික සාමාන්‍ය ශුද්ධ ලාභය රු. 93,000.00)

වැල් දොඩම් වගාව

1. හැඳින්වීම

වර්තමානයේ ආහාර සුරක්ෂිතතාවයට මුල්තැන දෙමින් කෘතිම ආහාර පාන වර්ග ප්‍රතික්ෂේප කරමින් ස්වභාවික නැවුම් ආහාර පාන වර්ග භාවිත කිරීමේ නැඹුරුවක් දක්නට ලැබේ. එබැවින් සිසිල් බීම වර්ග, කෝඩියල් ජෑම් වර්ග වැනි පලතුරු යුෂ ආශ්‍රිත නිෂ්පාදන සඳහා නැවුම් පළතුරු අමුද්‍රව්‍ය ලෙස භාවිතයට පෙළඹී සිටී. මේනිසා නැවුම් පළතුරු සඳහා ඉහල ඉල්ලුමක් පවතී, මේ අතර වැල් දොඩම් ඉහත නිෂ්පාදන සඳහා භාවිතා කරන අත්‍යාවශ්‍ය මෙන්ම ලාභදායි පළතුරක් බැවින් වැල් දොඩම් සඳහා ද ඉහල ඉල්ලුමක් අපේක්ෂා කල හැකිය. වැල්දොඩම් යනු විටමින් 'සී' සහ ඛණිජ ලවණ බහුල පළතුරකි. නිසි පරිදි පොහොර යොදා නඩත්තු කළ හැකි නම් ඉතා හොඳ ආදායමක් ලැබිය හැකිය. වැල් දොඩම් වර්ග 3 කි.

1. කහ ප්‍රභේදය (පහත රට තෙත්, අතරමැදි හා වියලි කලාපයේත්, මැදරට තෙත් අතරමැදි කලාපයේත් වියලි කලාපයේත් වගාවට සුදුසු වේ.)
2. දම් ප්‍රභේදය (උඩරට අතරමැදි හා උඩරට තෙත් කලාපයන්හි වගාවට සුදුසු වේ.)
3. දෙමුහුම් ප්‍රභේදය (උඩරට ප්‍රදේශයේ වගාවට සුදුසු වේ.)

2. අමුද්‍රව්‍ය

වැල් දොඩම් බීජ
කොම්පොස්ට් පොහොර
ජලය
හුණු / ඩොලමයිට්
යූරියා, රොක් පොස්පේට්, මියුරියේට් වැනි රසායනික පොහොර
ගොම
වැලි
පොලිතින් කවර

3. වෙළඳපොළ

වැල්දොඩම් යුෂ යොදාගෙන විවිධ පළතුරු යුෂ පාන වර්ග, කෝඩියල්, ජෑම්, මුස් වැනි පළතුරු ආශ්‍රිත නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් වැල් දොඩම් අස්වැන්න වෙළඳපොළට ඉදිරිපත් කළ හැකිය. ඊට අමතරව වැල්දොඩම් නැවුම් පළතුරු ලෙස පරිභෝජනයට ගන්නා සාමාන්‍ය පාරිභෝගිකයන් ඉලක්ක කරගෙන දේශීය පළතුරු වෙළඳපොළට ද ඉදිරිපත් කළ හැකිය. නිෂ්පාදනය සඳහා පවතින මිල ගණන් සළකා බැලීමේ දී වැල් දොඩම් කිලෝ එකක් රු. 120.00 කට අලෙවි කළ හැකිය. වැල්දොඩම්වල විශේෂ ගුණාංග ලෙස ගුණදායක සහ රසවත් පළතුරක් වීමත්, නැවුම් බවත්, ඉහත නිෂ්පාදන සඳහා පහසුවෙන් භාවිතා කළ හැකි වීමත්, දැක්විය හැකිය. ඉහත කී නිෂ්පාදන ආයතන වලට සෘජුවම වැල්දොඩම් අලෙවි කිරීම සිදුකළ හැකි අතර, සාමාන්‍ය කුටුම්භ පාරිභෝගිකයන් සඳහා පළතුරු වෙළඳසැල් සහ සුපිරි වෙළඳසැල් හරහා අලෙවි කිරීමේ හැකියාව පවතී.

4. ආයෝජනය

මසකට වැල් දොඩම් කිලෝග්‍රෑම් 900 අස්වැන්නක් ලැබීමට කැමති ව්‍යවසායකයකු ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල පහත දැක්වේග පැළ සිටුවා පළමු මාස 6 න් පසු සතියකට වරක් අස්වනු නෙළීමේ හැකියාව ලැබේ.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	රු. 70,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 6 ක් සඳහා)	රු. 136,800.00
	මුළු එකතුව	**රු. 206,800.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

වැල්දොඩම් වගාව ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් මෙහි ඇතුලත් කර ඇති අතර, ඉඩම සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	ස්ථාවර වත්කම්	වටිනාකම (රු.)
01	කම්බි වැට සැකසීම සඳහා	20,000.00
02	ජල සම්පාදන කටයුතු සඳහා	35,000.00
03	කෘෂි උපකරණ සඳහා	5,000.00
04	වෙනත් ස්ථාවර වියදම් (මව්ශාක)	10,000.00
	එකතුව	70,000.00

කම්බි වැට සැකසීමේදි කණු ආධාරක ලෙස ඇල්බීසියා වැනි ලී දඬු වර්ග භාවිතා කරන ආකාරයට සැලසුම් කර ඇත. (වැඩි ආයෝජනයක් කළ හැකිනම් ඒ සඳහා කම්බි කණු භාවිතා කළ හැකිය.)

අක්කරයක් සඳහා වැල්දොඩම් පැළ 400 ක් අවශ්‍ය වේග වැල් දොඩම් වැලක් හොඳින් නඩත්තු කලවිට එයින් වසර 5 ක කාලයක් පුරාවට අස්වැන්න ලබාගත හැකි නිසා පැළ සඳහා වැය වූ පිරිවැය වෙනත් ස්ථාවර වියදම් යටතේ ඇතුලත් කර ඇත.

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

අක්කරයක වැල්දොඩම් වගාකර මාස 6 ක් ගත වූ පසු මසකට කිලෝ ග්‍රෑම් 900 අස්වැන්නක් ලැබිය හැකි බවත්, මාස 6 න් පසු සතියෙන් සතියට අස්වනු නෙලන බවටත් උපකල්පනය කර ඇත.

අස්වැන්න තොග ගැනුම්කරුවන් වෙත සපයනු ලබන අතර කිලෝ ග්‍රෑම් 1ක මිල රු. 120.00 ක් ලෙස උපකල්පනය කර ඇත.

ඒ අනුව,

මාසික විකුණුම් ආදායම = මාසික නිෂ්පාදනය × කිලෝ ග්‍රෑම් 1ක මිල
= කිලෝ ග්‍රෑම් 900 × රු. 120.00
= රු. 108,000.00

මාසික මුළු පිරිවැය

මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය (මාසික) = සෘජු අමුද්‍රව්‍ය + සෘජු ශ්‍රමය + සෘජු වෙනත්
= රු. 3,000.00 + රු.25,000.00 + රු. 1,000.00
මාසික සෘජු පිරිවැය = රු. 29,000.00

වක්‍ර පිරිවැය

වගාව නඩත්තු කිරීම හා ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ.
එය මාසයක් සඳහා රු. 11,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
= රු. 108,000.00 - (රු. 29,000.00 + රු.11,000.00)
= රු. 108,000.00 - රු. 40,000.00
= රු. 68,000.00

ව්‍යාපාරිකයා විසින්ම වගා කටයුතු සිදු කරයි නම් ඔහුට මසකට රු. 25,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 68,000.00 ක් උපයා ගත හැකි වේ.

කෝමාරිකා වගාව

1. හැඳින්වීම

කෝමාරිකා ශාකය කලකට ඉහතදී මෙරට වගා කරනු ලැබුවේ අලංකරණය උදෙසා වවන ශාකයක් සහ දේශීය ඖෂධීය පැලෑටියක් වශයෙනි. මෙම ශාකයේ ඖෂධීය ප්‍රයෝජනවලට අමතර ප්‍රයෝජන රාශියක් පසුගිය දශක කීපයක් තුළදී සමාජගතවීම හේතුවෙන් කෝමාරිකා වගාව මේ වන විට ආර්ථික වගාවක් බවට පත්වී ඇත. අක්කර භාගයක් පමණ වූ භූමි ප්‍රමාණයක වගා කිරීමෙන් ආර්ථිකමය ලාභයක් ඉපයිය හැකි වගාවක් වේ. මෙහිදී කෝමාරිකා පැළ සහ පිති විකිනීම යන දෙයාකාරයෙන්ම ආදායම් ලැබිය හැකි අතර, පවත්නා වගාවෙන් ලබාගන්නා පැළ මගින් වගාව ව්‍යාප්ත කර ගැනීමේ හැකියාව ද පවතී.

බහු වාර්ශික ඝර්ම කලාපීය දැඩි ශාක ගණයට අයත් වන මෙම ශාකය ශ්‍රී ලංකාවේ වියළි හා අතරමැදි කලාපයේ හොඳින් වැඩෙන ශාකයකි. අධික ශීත තත්ත්වයන්හි දී මෙම ශාකය දුර්වල වර්ධනයක් පෙන්නුම් කරයි. වැලි සහිත පසේ සිට ලෝම පස දක්වා මෙම ශාකය වගා කළ හැකි අතර ජලය හොඳින් බැස යන සැහැල්ලු පස වඩාත් උචිත වේ. කෝමාරිකා ශාකය ආකාර කීපයකින් වගා කළ හැකි අතර, අඟල් 10ක් පමණ වැඩුනු පිති 2-3ක් සහිත පැළ වගාවට වඩාත් සුදුසු වේ. අක්කර භාගයකට පැළ 5,500 ක් පමණ වගා කළ හැකිය. මෙම භෝගය කාබනික පොහොර සඳහා වඩාත් හොඳින් ප්‍රතිචාර දක්වන අතර, මූලික බිම් සැකසීමේදී අක්කර භාගයක් සඳහා කාබනික පොහොර ටොන් 4ක් ද අනතුරුව මාසිකව ද යෙදීම සුදුසු වේ. (පස අනුව වෙනස් වේ.) පැළ සිටවූ වහාම ජල සැපයුම අවශ්‍යය වන අතර හොඳ ජල සම්පාදනයක් මගින් ඉහළ අස්වැන්නක් ලබාගත හැකිය. නමුත් ජලය රැඳෙන තත්ත්වයන් මෙම වගාවට යෝග්‍යය නොවේ. ප්‍රධානතම රෝගී තත්ත්වය වන්නේ කාල පුල්ලි දිලීර රෝගය වන අතර නිර්දේශිත දිලීර නාශක මේ සඳහා වඩාත් යෝග්‍යය වේ. වගාවෙන් මාස 8කට පමණ පසු පළමු අස්වැන්න ලබාගත හැකි අතර, ඝනකම් වූ මාංසල පත්‍ර අස්වනු වේ. සාමාන්‍යයෙන් වසරකට අස්වනු වාර 3ක් පැළයකින් පත්‍ර 3-4ක් පමණ ලබා ගනිමින් සිදු කළ හැකිය. නමුත් වාණිජ වගාවේදී ඇතැම් අය මුල් අස්වනු වාරයේදී පැළයක පත්‍ර 4-5 ඉතිරි වෙන්නට තබා ඉතිරි පත්‍ර සියල්ල ඉවත් කර අනතුරුව මාසිකව පත්‍රය බැගින් අස්වනු නෙලන අවස්ථාද පවතී. අස්වනු නෙලූ පසුව වියලීමෙන් වලක්වා ගැනීමට සහ වාෂ්පශීලී අත්‍යාවශ්‍ය සංඝටක ආරක්ෂා කරගැනීමට වියළි සහ ශීත තත්ත්ව යටතේ ප්‍රවාහනය කිරීම වඩාත් උචිත වේ.

මෙලෙස සිදු කරන වාණිජ වගාව සඳහා දේශියව හා විදේශියව ඉහළ වෙළඳපොල ඉල්ලුමක් පවතින අතර, වගාව සිදු කරන මොහොතේ ම ගැණුම් කරුවන් සම්බන්ධ කරගැනීම පිළිබඳව අවධානය යොමුකරමින් සිදුකලහොත් කාලීනව වඩාත් උචිත ව්‍යාපාර අවස්ථාවක් වේ.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

අඟල් 10ක් පමණ වූ කෝමාරිකා පැළ
කාබනික පොහොර
දිලීර නාශක

3. වෙළඳපොළ

කෝමාරිකා සඳහා ඖෂධීය, රූපලාවන්‍ය, ආහාර, අලංකරණ, ආලේපන හා විලවුන් නිෂ්පාදන ආදී විවිධ ක්ෂේත්‍රයන්ගෙන් ඉහළ ඉල්ලුමක් පවතී. කෝමාරිකා අඩංගු නිෂ්පාදනයන් ළදරුවාගේ සිට වැඩිහිටියා දක්වාම සිදුකළ හැකි අතර, මෙම නිෂ්පාදන සිල්ලර වෙළඳසැලේ සිට සුපිරි වෙළඳසැල් ජාලය දක්වාද, ෆාමසි, ආයුර්වේද බෙහෙත් ශාලා ආදියේ ද පවතී. කෝමාරිකා ආශ්‍රිතව විවිධ නිෂ්පාදනයන් සිදු කරන නිෂ්පාදකයන් කෝමාරිකා වගාකරුවන්ගේ ඉලක්ක පාරිභෝගිකයන් වේ. තවද කෝමාරිකා පිති විදේශීය රටවල් වලට අලෙවි කරන්නන්, දේශීය කර්මාන්තශාලා වලට විශාල වශයෙන් තොග සපයන්නන් ආදී විවිධ පාරිභෝගික කණ්ඩායම් කෝමාරිකා වගාව හා සම්බන්ධව පවතී. කෝමාරිකා පැළ අලෙවි කරමින් වගාව ව්‍යාප්ත කරන විවිධ ආයතනද වගාකරුවන් හා ගිවිසුම්ගත වෙමින් කෝමාරිකා අස්වනු මිලදී ගනී. වගාව ආරම්භ කරන අවස්ථාවේදීම ගැණුම්කරුවන් පිළිබඳව වඩාත් සැලකිලිමත් වෙමින් සම්බන්ධ කරගනිමින් මෙම ව්‍යාපාරයේ නියැලීම අත්‍යාවශ්‍ය වේ.

සාමාන්‍යයෙන් අතරමැදියෙකු හරහා කෝමාරිකා පිති අලෙවි කරන විට වර්තමානයේ කෝමාරිකා පිති කිලෝවක් රු. 30.00 පමණ මිලකට අලෙවි කළ හැකිය. සෘජුවම කර්මාන්තශාලා වලට ලබා දෙන්නේනම් රු. 45 - 50 වැනි මිලකට අලෙවි කළ හැකිය.

4. ආයෝජනය

අක්කර භාගයක සිදුකරන කෝමාරිකා වගාවකින් මාසයකට කෝමාරිකා පිති කිලෝ 2,750 ක් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 225,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 08 සඳහා)	- රු. 88,000.00
	මුළු එකතුව	- **රු. 313,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇති අතර, වගාව සිදු කරන අක්කර භාගයක භූමි ප්‍රමාණයේ වටිනාකම මීට ඇතුලත් කර නැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	කෝමාරිකා පැළ සඳහා (පැල 5,600)	140,000.00
02	උදැල්ල	2,000.00
03	රේක්කය	1,000.00
04	අලවංගුව	2,000.00
05	විසිරි ජල සැපයුම	50,000.00
06	බිම් සැකසීම,වලවල් කැපීම,පැල සිටුවීම ආදී මූලික කටයුතු සඳහා	30,000.00
	එකතුව	225,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 8ක් සඳහා)

අක්කර භාගයක් වූ කෝමාරිකා වගාවෙන් මාසයකට කෝමාරිකා පිති කිලෝ 2,750 ක් පමණ නිෂ්පාදනය කළ හැකි අතර, මාසයකට සම්පූර්ණ දින 5 ක් වගාවේ කටයුතු කරන බව සහ මාස 8කට පසු අස්වනු ලබාගන්නා බව සලකා ඇත.

අංක	විස්තරය	මාසික වියදම (රු.)	මාස 8ක් සඳහා වියදම (රු.)
01	කාබනික පොහොර සහ දිලීර නාශක සඳහා	5,000.00	40,000.00
02	ශ්‍රම වැටුප්	5,000.00	40,000.00
03	වෙනත්	1,000.00	8,000.00
	එකතුව	11,000.00	88,000.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

අක්කර භාගයක වගාවක් බවත්, කෝමාරිකා පිති පමණක් විකුනන බවත් සලකා ඇත. අක්කර භාගයක ට පැළ 5,500ක් ක්ෂේත්‍රයේ සිටවූ පසු පැළ වලින් 2% ක් නැවත සිටවිය යුතු බවත් අනෙක් සියලුම පැල සාර්ථකව පවතින බවත් එකම ආකාරයෙන් අස්වනු ලබා දෙන බවත් උපකල්පනය කර ඇත.

කෝමාරිකා පැලයක ගැණුම් මිල රු. 25.00 ක් බව සලකා ඇත.

අස්වනු නෙලීමේදී පැල සිටුවා මාස 8කට පසු අස්වනු නෙලන බවත් ආරම්භයේදී පැලයක පත්‍ර 4 - 5 ඉතිරි වෙන්නට තබා ඉතිරි පත්‍ර සියල්ල අස්වනු ලෙස ඉවත් කර අනතුරුව මාසිකව පැලයකින් ග්‍රෑම් 500 පත්‍රය බැගින් අස්වනු නෙලන බව සලකා ඇත.

අලෙවියේදී කෝමාරිකා පිති කිලෝවක් රු.30.00 කට අලෙවි කළ හැකි බව.

එක් වරකදී සිටුවන කෝමාරිකා වගාවෙන් වසර 05 ක කාලයක් අස්වනු ලබා ගත හැකි බව.

මාසික නිෂ්පාදනය = (පැලයක නිෂ්පාදනය ග්‍රෑම් 500 × පැල ගණන 5,500) = කිලෝග්‍රෑම් 2,750
මාසික විකුණුම් ආදායම = කිලෝග්‍රෑම් 2,750 × කිලෝග්‍රෑම් එකක මිල රු. 30.00) = රු.82,500.00

මාසික මුළු පිරිවැය	= සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය	= සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම
මාසික සෘජු පිරිවැය	= රු. 10,000.00 + රු. 10,000.00 + රු.1,000.00
	= රු.21,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ (ජලය , විදුලිය, ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්) එය මාසයක් සඳහා රු.8,000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මාසික ශුද්ධ ලාභය	= මාසික විකුණුම් ආදායම - මාසික මුළු පිරිවැය
	= රු.82,500.00 - (රු.21,000.00 + රු.8,000.00)
	= රු.82,500.00 - රු.29,000.00
	= රු. 53,500.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට මාසයකට රු. 10,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, ශුද්ධ ලාභය ලෙස රු. 53,500.00 ක් උපයාගත හැකිය.

සුරතල් මසුන් සඳහා අවශ්‍ය ජීවී නොවන ආහාර නිෂ්පාදනය

1. හැඳින්වීම

දේශීය මෙන්ම විදේශීය ලෙස ආදායම් ලැබීමේ මාර්ගයක් ලෙස විසිතුරු මසුන් බෝ කිරීම හා අලෙවිය දිවයින පුරා ප්‍රචලිතව පවතින ව්‍යාපාරයකි. මෙම ව්‍යාපාරය සිදු කරගෙන යාමේ දී මත්ස්‍යයින්ගේ පෝෂණ අවශ්‍යතා පිළිබඳව විශේෂ අවධානයක් යොමුවේ. ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා යොදා ගත හැකි ජීවී නොවන ආහාර නිෂ්පාදනය මෙහිදී සැලකිල්ලට ගත හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- ධීවර කර්මාන්තයේදී ඉවත දමන මත්ස්‍ය කොටස්.
- විටමින් වර්ග
- සත්ව කොටස්

ඉවත ලන දෑ අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනීම මගින් පරිසරයට සිදුවන හානිය අවම වීමක් ද සිදුවේ.

3. වෙළඳපොල

සුරතල් මසුන් වගා කරන්නන් මෙන්ම සුරතල් මසුන් අලෙවිකරණ මින් මැදුරු සඳහා මත්ස්‍ය ආහාර සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. ඊට අමතරව විනෝදාස්වාදය සඳහා සුරතල් මසුන් රැකබලා ගන්නා නිවැසියන් ද මෙම ආහාර ඉල්ලුම් කරනු ලැබේ.

4. ආයෝජනය

දිනකට 100Kg නිෂ්පාදනය සිදු කරන ව්‍යාපාරයක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 515,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)	= රු. 81,000.00
	මුළු එකතුව	= **රු. 596,000.00**

මසකට දින 20ක් නිෂ්පාදනය සිදු කරන බව උපකල්පනය කරයි.

4.1 ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර ව්‍යාපාරික ස්ථානය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

ආහාර ඇඹරුම් යන්ත්‍රය	= රු. 200,000.00
ආහාර නිෂ්පාදන යන්ත්‍රය	= රු. 300,000.00
සීලරය, තරාදිය හා අනෙකුත් උපකරණ	= රු. 15,000.00
මුළු ආයෝජනය	= රු. 515,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (සතියක් සඳහා)

දිනකට සත්ව ආහාර 100 Kg නිෂ්පාදනය කරන අතර සතියකට දින 5ක් නිෂ්පාදනය කරනු ලැබේ.

අංක	විස්තරය	දිනක වියදම (රු.)	සතියක වියදම (රු.)
1	අමුද්‍රව්‍ය	13,500.00	67,500.00
2	ශ්‍රමය	2500.00	12,500.00
3	වෙනත්	200.00	1,000.00
	එකතුව	16,200.00	81,000.00

5. මාසික ශුද්ධ ලාභය

මෙම ව්‍යාපාරය මාසයකට දින 20 ක් නිෂ්පාදන කටයුතු සිදුකරන අතර එක් දිනකදී මත්ස්‍ය ආහාර කිලෝ 100ක් නිෂ්පාදනය කරන බව උපකල්පනය කෙරේ.

මාසික විකුණුම් ආදායම (දින 20 × දිනක නිෂ්පාදනය 100 × රු. 200.00) = රු. 400,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම
දිනක සෘජු පිරිවැය = රු. 13,500.00 + රු. 2,500.00 + රු. 200.00
= රු. 16,200.00 × දින 20
= රු. 324,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන අනෙකුත් වියදම් (ජලය, විදුලිය, දුරකථන, ප්‍රවාහනය, ප්‍රචාරණය ආදී) එක් මසක් සඳහා ඇස්තමේන්තුගත වියදම රු. 20,000.00 කි.

මාසික ශුද්ධ ලාභය = මාසික විකුණුම් ආදායම - {සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය}
= රු. 400,000.00 - (රු. 324,000 + රු. 20,000.00)
= රු. 56,000.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම්, ඔහුට මාසයකට රු. 56,000.00ක ශුද්ධ ලාභයක් සහ වැටුප ලෙස රු. 50,000.00ක ආදායමක් උපයාගත හැකිය.

අන්නාසි වගාව

1. හැඳින්වීම

බ්‍රෝමීලිසියේ කුලයට අයත් අන්නාසි, අන්නාස් කොමොසස් යන උද්භිත විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබයි. මෙහි මුලාරම්භය බ්‍රසිලයයි. අන්නාසි නැවුම් පළතුරක් ලෙස, ටින්වල අසුරන ලද පළතුරක් ලෙස සහ ජෑම් හා කෝඩියල් ලෙස ද පාරිභෝජනයට ගනු ලබයි. වෙනත් පළතුරු වර්ගවලට වඩා දේශීය හා විදේශීයව පවතින අධික ඉල්ලුම නිසා මෙය වාණිජමය වැදගත්කමක් සහිත බෝගයක් ලෙස හැඳින්විය හැකිය. ප්‍රධාන වශයෙන් වගා කරන අන්නාසි ප්‍රභේද දෙකක් හඳුනාගත හැකිය. එනම් මුරුසි හා කිව් ප්‍රභෙදයි. මුරුසි ප්‍රභේදය හොඳින් ඉදවා පළතුරක් වශයෙන් ද කිව් ප්‍රභේදය ටින්වල ඇසිරීම සඳහා ද බහුල වශයෙන් යොදා ගනු ලබයි. වියළි කලාපවල බහුල වශයෙන් අන්නාසි වගා කරන අතර මෙරට නිෂ්පාදිතයෙන් 70%ක් ගම්පහ හා කුරුණෑගල දිස්ත්‍රික්ක වලින් සපයනු ලබයි.

අන්නාසි ඵලයෙහි හා පත්‍ර යුෂවල පණු නාශක ගුණය පවතින අතර විරේක බෙහෙතක් ලෙස ද, ඉක්කා වැටීම නැවැත්වීම සඳහා ද යොදා ගනු ලබයි. තවද නොමේරූ ගෙඩිවල යුෂවල අඩංගු සංයෝග මගින් බඩ විරේක කිරීම සඳහා අයුර්වේදයේ යොදා ගැනේ. අමු ගෙඩි විනාකිරි සමග ආහාරයට ගැනීමෙන් බඩ පිපීම මග හරවා ගත හැකිය. ඉදුණු ගෙඩිවල යුෂ සෙංගමාලය සහ පාචනය සඳහා ඖෂධයක් ලෙස භාවිතා කරනු ලබයි. අන්නාසි ගෙඩියේ අඩංගු බ්‍රොමිලින් නම් එන්සයිමය නිසා ආහාර දිරවීම පහසු කරවීම ද විශේෂිත ගුණාංගයකි.

බොහෝ රටවල අන්නාසි පත්‍රවලින් ලබා ගන්නා කෙඳි රෙදි පිළි නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අතර ඉදුණු අන්නාසි ගෙඩි යොදා ගනිමින් වයින් හා විනාකිරි ද නිෂ්පාදනය කරනු ලබයි.

අනවශ්‍ය මොරෙයියන් ඉවත් කිරීම, නිසි කලට පොහොර දැමීම, ජල සම්පාදනය කිරීම, රෝග හා පළිබෝධ පාලනය කිරීම ඉතා හොඳින් සිදු කරමින් නඩත්තු කරන අන්නාසි වගාවකින් සාර්ථක ලෙස වසර පහක් පමණ අස්වැන්න ලබාගත හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍යය

අන්නාසි මොරෙයියන් - මුල් මොරෙයියන්, කඳ මොරෙයියන්, නටු මොරෙයියන් හෝ කරඩුව
රසායනික පෙහොර - යූරියා, රොක්පොස්ෆේට් සහා ටියුරියේට් ඔෆ්පොටෑෂ්
කාබනික පෙහොර - කුකුල් පෙහොර, ගොම පෙහොර හා කොම්පෝස්ට්
හෝමෝන වර්ග - කැල්සියම් කාබයිට්, ප්ලාන්ට්පික්ස් සහ එතිලීන්
රෝග පාලනය සඳහා අවශ්‍ය බෙහෙත් - මැන්කොසෙබ්, මෙටලැක්සිල්, බෙනෙටිල් සහ තෙත් කළ හැකි කුඩු, ජලය

3. වෙළෙඳපොල

පළතුරක් මෙන්ම ඖෂධීය ගුණයෙන් හෙබි අන්නාසි සඳහා දේශිය මෙන්ම විදේශිය වශයෙන් ප්‍රසාරණය වු වෙළෙඳපොලක් පැවැතිම සුවිශේෂි කාරණාවකි. දේශිය වශයෙන් අන්නාසි ඉතා කුඩා පළතුරු කඩවල සිට සුපිරි වෙළෙඳසැල් ජාලයන් දක්වා ව්‍යාප්ත වු පුළුල් වෙළෙදපොලක් දක්නට ලැබේ. අන්නාසි ගෙඩි වශයෙන් දේවාල කටයුතු සඳහා, පළතුරු බිම නිෂ්පාදනය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍යක් ලෙස, අගය එකතු කරන ලද නිෂ්පාදන ලෙස ටින්වල අසුරන ලද පළතුරක්(ජෑම්, වටිනි, කෝඩියල්) ලෙස සහ විජලිත අන්නාසි වශයෙන් සාමාන්‍ය වෙළෙඳ සැල් හා සුපිරි වෙළෙඳසැල් තුළ ඉහළ ඉල්ලුමක් දැකගත හැකිය. චීනය හා පිළිපිනය වැනි රටවලින් අන්නාසි කෙඳි වලින් රෙදිපිළි නිෂ්පාදනය සඳහා මෙන්ම විදේශිය වශයෙන් වයින් හා විනාකිරි නිෂ්පාදනය සඳහා ද අන්නාසිවලට ඉහළ වෙළෙඳපොලක් දක්නට ලැබේ. අන්නාසිවල පවතින ඖෂධීය ගුණය පදනම් කරගනිමින් ද අන්නාසි සඳහා දේශීයව හා විදේශීයව වර්ධනය වෙමින් පවතින වෙළෙඳපොලක් ඇති බව දක්නට ලැබේ.

4. ආයෝජනය

වසරකට අන්නාසි ගෙඩි 2000ක් ලබාගත හැකි වාණිජ වගාවක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තතමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 83,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (වසරක් සඳහා)	= රු. 90,000.00
	මුළු එකතුව	= **රු. 173,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	ජල සම්පාදන පද්ධතියක් සැකසීම	80,000.00
02	උදැල්ල	1,500.00
03	වෙනත් උපකරණ	1,500.00
	එකතුව	83,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

(වර්ෂයක් සඳහා අක්කර භාගයක් තුළ පැල 2000 ක් සිටුවීමට)

උපකල්පන - මිනිස් ශ්‍රම ඒකකයක් සඳහා දිනකට රු.1500ක මුදලක් ඇස්තමේන්තු කර ඇත. කාබනික පොහොර යටතේ කුකුල් පෙහොර, ගොම පෙහොර සහ කොම්පෝස්ට් භාවිතා කරන අතර අක්කරයකට ටොන් එකක් අවශ්‍ය බව සලකා ඇත. රසායනික පෙහොර යටතේ යුරියා, ටි.එස්.පි සහ එස්.ඕ.පි යොදා ගන්නා අතර පැළයකට පිළිවෙළින් ග්‍රෑම් 10, 7 සහ 15 යොදා ගනී. හෝමෝන ලෙස කැල්සියම් කාබයිට් (Ca C2), ප්ලාන්ට්පික්ස් (N)සහ එතිලීන් භාවිතා කරනු ලබයි. අන්නාසි වගාවේ පළමු අස්වැන්න නෙළා ගැනිමට වසරක කාලයක් යන බැවින් කාරක ප්‍රාග්ධනය වසරක් සඳහා ඇස්තමේන්තු කර ඇත.

අංක	විස්තරය	ඒකක මිල	වාර්ෂික වියදම (රු.)
01.	පැළ සඳහා වියදම	2,000 X රු.12.00	**24,000.00**
02.	**ශ්‍රම වියදම**		**43,500.00**
	ප්‍රතිකාර කිරීම (තම ශ්‍රමය)	දින 4 × රු.1500.00	6,000.00
	පැළ සිටුවීම (කුලී ශ්‍රමය)	මිනිසුන් 7 × රු.1500.00	10,500.00
	පොහොර යෙදීම (තම ශ්‍රමය)	දින 4 × රු.1500.00	6,000.00
	වල් මර්දනය කිරීම (තම ශ්‍රමය)	දින 4 × රු.1500.00	6,000.00
	අස්වැන්න නෙළීම (කුලී ශ්‍රමය)	මිනිසුන් 10 × රු.1500.00	15,000.00
03.	**සෘජු වෙනත් වියදම්**		**22,500.00**
	මූලික බිම් සැකසීම හා වැට සැකසීම	7,500.00	7,500.00
	කාබනික පොහොර වියදම	4,000.00	4,000.00
	රසායනික පෙහොර වියදම	7,800.00	7,800.00
	හෝමෝන වියදම වියදම	3,200.00	3,200.00
	එකතුව		90,000.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන - අන්නාසි කිලෝ ග්‍රෑම් ඒකක මිල රු.100.00ක් ලෙස සලකා ඇත. තවද එක් අන්නාසි ගසකින් (ගෙඩියකින්) කිලෝග්‍රෑම් 2ක් ලබා ගත හැකි බව සලකා ඇත. නිවැරදි නඩත්තු කිරීම හා රැකවරණය මත අන්නාසි පැළ 2,000න්ම අන්නාසි ගෙඩි 2,000ක් ලබා ගත හැකි බව උපකල්පනය කර ඇත.

වර්ෂයකින් පසු පැළ විකිණීම තුලින් ද අමතර ආදායමක් උපයා ගත හැකිය.

වාර්ෂික විකුණුම් ආදායම (වර්ෂයක නිෂ්පාදනය × ඒකක මිල රු.)
අන්නාසි වාණිජ වගාව = අන්නාසි කිලෝ ප්‍රමාණය × කිලෝ ඒකක මිල)
= 2,000 × කිලෝ 02 × 100.00 = රුපියල් 400,000.00

වාර්ෂික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම
= රු. 24,000.00 + රු. 43,500.00 + රු. 22,500.00
= රු. 90,000.00

වක්‍ර වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා කරන වියදම් වේ. (ජලය, විදුලි, ප්‍රවාහන, අලෙවිකරණ, ආදි අනෙකුත් වියදම්) එය වර්ෂයක් සඳහා රු. 10,000.00ක් ලෙස ද අයිතිකරුට කළමණාකරණ වැටුප් ලෙස වර්ෂයකට රුපියල් 60,000 ක් ද ඇස්තමේන්තු කර ඇත.

වාර්ෂික ශුද්ධ ලාභය = වාර්ෂික විකුණුම් ආදායම - වාර්ෂික මුළු පිරිවැය
= රු. 400,000.00 - (රු. 90,000.00 + රු. 10,000.00 + රු. 60 ,000.00)
= රු. 400,000.00 - රු. 160,000.00
= රු. 240,000.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදුකරයි නම් ඔහුට වගාව සිදු කර පළමු වර්ෂයේ රු. 78,000.00 ක් (තම ශ්‍රමයට රුපියල් 18,000.00 + කළමණාකරණ වැටුප් රුපියල් 60,000.00) වෙන් කර ගත හැකි අතර ශුද්ධ ලාභය ලෙස පළමු වර්ෂයේ රුපියල් 240,000.00 ක් උපයා ගත හැකිය.

මුං වගාව හා මුං බීජ නිෂ්පාදනය

1. හැඳින්වීම

රනිල කුලයට අයත් බෝගයක් වන මුං උසස් ගුණයෙන් යුතු ශාකමය ප්‍රෝටීන් ප්‍රභවයකි. විටමින් හා ඛනිජ ද්‍රව්‍ය වලින් අනූන ඉතා පෝෂ්‍යදායී ආහාරයකි. මෙය ශ්‍රී ලංකාවේ ළදරු ආහාර සඳහා ප්‍රධාන පෝෂක කොටසක් ලෙස ද ඉතා ප්‍රචලිතය. මුං බෝගය වියළි හා අතරමැදි කලාප වල මෙන්ම යල කන්නයේ කුඹුරු ඉඩම් වල සහ අතර මැද කන්නවල අතිරේක බෝගයක් ලෙස වගා කරනු දක්නට ලැබේ. ලෙගියුමිනේසියේ කුලයට අයත් මුං වල උද්භිද විද්‍යාත්මක නාමය විග්නා රේඩියේටා වේ. හොඳින් ජල වහනය සිදු වන වැලි සහිත ලෝම් පසක් මෙන්ම සෙන්ටිග්‍රේට් අංශ 25-30 අතර උෂ්නත්වය හා වියළි තත්ත්වය මෙම බෝගයට ඉතා හිතකර වේ.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

මුං වගාව සඳහා පහත අමුද්‍රව්‍ය අවශ්‍ය වේ.

මුං බීජ / ජලය / දිලීර නාශක / කෘෂි රසායනික ද්‍රව්‍ය / යූරියා පොහොර / හෝමෝන

3. වෙළඳපොල

ප්‍රෝටීන් ගුණයෙන් අනූන වගේ ම විටමින් හා ඛනිජ ලවණ වලින් යුක්ත මුං බෝගය ළදරුවාගේ පටන් බාල, මහලු සියලු දෙනා අතර ප්‍රචලිත බෝගයකි. වර්තමානය වන විට මුං වැනි ධාන්‍යමය ආහාර සඳහා වෙළඳපොල තුළ ඉතා ඉහළ ඉල්ලුමක් ඇති වී ඇත. දැනට මුං, කුරක්කන්, කව්පි, උළු වැනි අතිරේක බෝග ආනයන සීමා කිරීමත්, සමග ම මෙම බෝග සඳහා දේශීය වෙළඳපොල තුළ ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැති වීමද මිල ඉහල යාමට හේතු වී ඇත. එබැවින් මුං වගාව සඳහා බොහෝ දෙනෙකු පෙළඹී ඇත. උදෑසන ප්‍රධාන ආහාර වේල සඳහා, ව්‍යංජනයක් ලෙස හා අතිරේක ආහාරයක් ලෙස ද මුං භාවිතා වේ. බොහෝ විට මුං අලෙවිය සඳහා යහපත් වෙළඳපොලක් පවතින අතර විශාල වශයෙන් මුං වගා කිරීමේදී ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම, ලංකා බිස්කට් සමාගම, මැලිබන් ආයතනය වැනි ආයතන විසින් වගා ප්‍රදේශය වෙත ම ගොස් මිල දී ගැනීම සිදු කරයි.

මුං අස්වැන්න සඳහා වෙළඳපොල තුළ ඉහල මිලක් හිමි වන අතරම මුං වගා කිරීම තුළින් ඉහළ ලාභයක් ලබා ගත හැක. එසේම එය ව්‍යාපාරයක් ලෙස වර්ධනය කිරීමේ දී වෙළඳපොල තුළ මුං ඇට පමණක් නොව මුං බීජ අලෙවිය ද ඉහළ ආදායමක් ලබා ගත හැකි ක්‍රමයකි.

4. ආයෝජනය

කන්නයකට මුං කිලෝ 300 ක් නිෂ්පාදනය කිරීම සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තු ගත මුදල

මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	=	රු. 16,200.00
කාරක ප්‍රාග්ධන පිරිවැය (එක් කන්නයක් සඳහා)	=	රු. 131,500.00
මුළු එකතුව	=	**රු. 147,700.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර වගා භූමිය බද්ධට ගන්නේ නම්, ඒ සඳහා වැය වන තැම්පතු මුදල ඇතුළත් කර නැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	පඩංගු	6,000.00
02	උදලු	3,200.00
03	සොරොන්ඩි	2,500.00
04	අලවංගු	4,500.00
	මුළු එකතුව	16,200.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (කන්නයක් සඳහා)

එක් කන්නයකට මුං කිලෝ 300 ක් නිෂ්පාදනය කරනු ලැබේ.

අංක	විස්තරය	එක් කන්නයක වියදම (රු.)
01	අමුද්‍රව්‍ය (මුං බීජ කිලෝ 10×රු.800 = 8000) (පොහොර සඳහා = 3000)	11,000.00
02	ශ්‍රමය (බිම සැකසීම දින 10 × 2000 = 20000) (රොටරි කිරීම = 6000) (මුං වැපිරීම = 1000) (වල් නෙලීමු දින 15 ×2000 = 30000) (මුං කැඩීම දින 24×1500 = 36000) (මුං තැලීම = 3000) (පොහොර යෙදීම = 30000)	99,000.00
03.	වෙනත් (ජලය රු.6000×3 = 18000) වගා බිම් වෙත යෑම,ඊමට = 2000) (වෙනත් සුළු වැය = 1500)	21,500.00
	මුළු එකතුව	131,550.00

5. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

මෙම වගාව අක්කරයක භූමි ප්‍රමාණයක වගා කර ඇති බව

අක්කර එකකින් එක් කන්නයක අස්වැන්න මුං කිලෝ 300 ක් ලැබෙන බව

(බීජ වපුරා දින 45 කින් එල දරන අතර දින 90 ත් 100 ත් අතර කාලයේ මුං අස්වනු ලබා දීම අවසන් වේ. මෙම කාලය තුළ මුං ඇට මෝරන ආකාරය අනුව වාර තුනක දී අස්වනු නෙලා ආදායම ලබා ගනී. දේශගුණ හා කාලගුණ තත්ත්වයන් යහපත්ව පැවතීම ද වැදගත් වේ.)

ලැබෙන අස්වැන්නෙන් මුං ඇට ලෙස කිලෝ 200 ක් අලෙවි කරන අතර මුං බීජ ලෙස කිලෝ 100 ක් අලෙවි කරන බව (වගා ඉඩම බදු පදනමින් ලබා ගන්නා අතර එක් කන්නයක් සඳහා රු. 10,000.00 ක බද්දක් අය කෙරේ.)

එක් කන්නයක් සඳහා ජලය වාර 03 ක් දමන අතර එක් වාරයක් සඳහා රු. 6,000.00 ක මුදලක් වැය වන බව ද

උපකල්පනය කර ඇත.

ඒ අනුව, එක් කන්නයක විකුණුම් ආදායම
= (රු. 700.00.00 x මුං ඇට කිලෝ 200) + (රු. 800.00 මුං බීජ කිලෝ 100)
= රු. 220,000.00

එක් කන්නයක මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත් වියදම
සෘජු පිරිවැය = රු. 11,000.00 + රු. 99,000.00 + රු.21500.00
= රු. 131,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් වේ (වගා ඉඩමේ බදු කුලී, උපකරණ ක්ෂය, අලෙවි ආදි අනෙකුත් වියදම්). එක් කන්නයක් සඳහා රු. 17,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

එක් කන්නයක ශුද්ධ ලාභය = එක් කන්නයක විකුණුම් ආදායම - එක් කන්නයක මුළු පිරිවැය
= රු. 220,000.00 - රු.148,500.00
= රු. 71,500.00

ව්‍යාපාරිකයා විසින් වල් නෙළීම සහ අස්වනු නෙළීම සිදු කරයි නම්, එක් කන්නයකට රු. 66,000.00 වැටුපක් වෙන් කර ගත හැකි අතර එක් කන්නයක ශුද්ධ ලාභය ලෙස රුපියල් 71,500.00 ක් උපයා ගත හැකිය.

ඇස්ට්‍රමේරියා කැපූ මල් වගාව

1. හැඳින්වීම

ඇස්ට්‍රමේරියා කැපූ මල් ව්‍යාපෘතිය ශීත දේශගුණයක් පවතින නුවරඑළිය පදනම් කර ගෙන සිදුකළ හැකි ව්‍යාපාරික අවස්ථාවකි. රු. 120,000.00ක් පමණ ආයෝජනයකින් ආරම්භ කළ හැකි මෙම ව්‍යාපාරය නුවරඑළිය ශීත දේශගුණයට ආවේනික බැවින්, එම දේශගුණික කලාපය තුළ සිටින ව්‍යාපාර ඇරඹීමට අපේක්ෂිත ව්‍යවසායකයින් හට තම ඉඩමේ හෝ බදු පදනමට ලබාගත් පර්චස් 20ක් වැනි ප්‍රමාණයකින්, රු. 50,000.00 ක් පමණ මාසික ව ශුද්ධ ලාභයක් ලබා ගත හැකි වන සේ, ආරම්භ කළ හැකිය. අඩු ආයෝජනයක් සිදු කර විශාල ලාභයක් ලබාගැනීමට හැකිවීම මෙහි කැපී පෙනෙන ලක්ෂණයකි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

ඇස්ට්‍රමේරියා පැළ (මිලදී ගැනීමේ දී හොඳින් අල බැස ඇති හා කොළ 8ක් 10ක ප්‍රමාණයක් හොඳින් වැඩුණු පැළ අලෙවි සැල් වලින් මිලදී ගත හැකිය.)

වර්ධන පොහොර, ගොම පොහොර

3. වෙළෙඳපොළ

ඇස්ට්‍රමේරියා මල් විශේෂය විවිධ වර්ණවලින් පවතින බැවින් මංගල, අවමංගල හා විවිධ උත්සව අවස්ථා වලදී සැරසිලි සිදුකිරීම සඳහා ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම පාහේ වැඩි වශයෙන් යොදා ගන්නා මල් විශේෂයක් ලෙස හඳුන්වා දිය හැකිය. ශ්‍රී ලංකාව පුරා විසිරි ඇති මල් සැකසුම්කරුවන්, අවමංගල්‍ය සේවා. විවිධ උත්සව අවස්ථා සංවිධාන කරුවන්, පෞද්ගලික ව උත්සව සංවිධානය කරන්නන් සඳහා සැපයිය හැකිය. මෙහිදී ප්‍රවාහන මාධ්‍ය ලෙස දුම්රිය, මඟී බස් රථ, වෙනත් බඩු ගෙනයන ලොරි යොදා ගත හැකිය. එසේ ම නුවරඑළිය අවට ජීවත්වන මල් තොග රැගෙන යන ගැණුම්කරුවන්ට මෙම මල් සැපයීම ද තවත් වෙළෙඳපොළ අවස්ථාවකි.

4. ආයෝජනය

පර්චස් 20 ක භූමි ප්‍රමාණයක වගාව ආරම්භ කිරීම සඳහා ආයෝජනය කල යුතු ඇස්තමේන්තු ගත මුදල. මෙම ව්‍යාපාරය

4.1	මූලික ප්‍රාග්ධන පිරිවැය	- රු. 232,650.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස හයක් සඳහා)	- රු. 31,450.00
	මුළු එකතුව	**- රු. 264,100.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය අයිතම පමණක් ඇතුලත් කර ඇත. තමා සතු ඉඩමක් හෝ බදු පදනම මත ලබා ගන්නා ඉඩමක වගා කටයුතු සිදුකරන බව සලකා ඇත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
1	ඉඩම සැකසීම	27,000.00
2	වෙනත් ස්ථාවර වත්කම් (රෝපණ ද්‍රව්‍ය)	150,000.00
3	බෙහෙත් ඉසින ටැංකිය	10,000.00
4	ජල මෝටරය හා ජල සැපයුම සඳහා	37,000.00
5	අනෙකුත් උපකරණ	8,650.00
	එකතුව	232,650.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස හයක් සඳහා)

පර්චස් 20 ක භූමි ප්‍රමාණයක මල් වගාව සිදු කරන මෙම වගාව මනා ලෙස නඩත්තු කිරීම මඟින් වසර පහක් පුරා මල් කැපීම සිදු කළ හැකිය. මෙහි මුල් අස්වනු ලබා ගැනීම සඳහා මාස හයක කාලයක් ගතවේ. එබැවින් මාස හයක කාළයක් සඳහා කාරක ප්‍රාග්ධනය ගණනය කොට ඇත.

අංක	විස්තරය		මාස හයක් සඳහා
1	ගොම ලොරි භාගයක් සඳහා පණු බෙහෙත් පැකට් 1 වර්ධන පොහොර	යෙදවුම්	4,500.00 1,000.00 1,750.00
2	ශ්‍රම වියදම		21,200.00
3	සෘජු වෙනත්		3,000.00
	එකතුව		31,450.00

5. මාසික ශුද්ධ ලාභය

මූලිකව සකස් කරන ලද භූමියේ සිටුවනු ලබන පැළ මනා ලෙස නඩත්තු කරනු ලැබුවහොත් වසර පහක කාලයක් අස්වැන්න ලබා ගත හැකිය. මලක විකුණුම් මිල රු. 10.00 ක් වන අතර දිනකට මල් 300ක ප්‍රමාණයක් ලබාගත හැකිය. ඒ අනුව,

මාසික විකුණුම් ආදායම = මසකට දින × දිනක කපන ලද මල් ප්‍රමාණය × මලක මිල
= 25 × 300 රු. 10.00
= රු.75,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
සෘජු පිරිවැය = යෙදවුම් වියදම + සෘජු ශ්‍රමය වියදම + සෘජු වෙනත්
= රු. 7,250.00 + රු. 21,200.00 + රු. 3,000.00
= රු. 31,450.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙනයාම සඳහා දරණ වියදම් වේ. (මල් කැපීමේ වියදම (දිනකට රු. 500.00 බැගින් දින 25ක් සඳහා) විදුලි, ප්‍රවාහන, අලෙවි ඇසුරුම් ආදි අනෙකුත් වියදම්). එය මාසයක සඳහා රු. 20,500.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ශුද්ධ ලාභය = විකුණුම් ආදායම - මුළු පිරිවැය
= රු. 75,000.00 - (රු. 31,450.00 + රු. 20,500.00)
= රු. 75,000.00 - රු. 51,950.00
= රු. 23,050.00

ව්‍යාපාරිකයා විසින් ම මල් කැපීමේ කටයුතු සිදුකරයි නම්, ඔහුට මාසයකට රු. 12,500.00 ශ්‍රම වැටුපක් සහ රු. 23,050.00ක ශුද්ධ ලාභයක් උපයාගත හැකිය.

තුඹ කරවිල වගාව

1. හැඳින්වීම

තුඹ කරවිල මිල අධික හා පෝෂණ ගුණයෙන් ඉහළ ඖෂධීය වටිනාකමක් ඇති එළවලුවක් ලෙස ප්‍රචලිතය. දේශීය මෙන්ම විදේශීය වෙළඳපොල සඳහා ද වැඩි වාණිජමය වටිනාකමක් ඇත. වියළි කලාපයේ හොඳින් වැඩෙන බෝගයක් වන අතර, තෙත් කලාපයේ දී පැළ අතර පරතරය වැඩි කර වගා කිරීමෙන් අපේක්ෂිත අස්වැන්න ලබා ගත හැකිය. අතු, බීජ හා මුල් මඟින් පැළ බෝ කරගත හැකිය. මාර්තු, මැයි හා දෙසැම්බර් මාසවල වගාව ආරම්භ කළ හැකි අතර, මාස තුනකින් පසු අස්වැන්න නෙලා ගැනීම කළ හැකිය. මෙම ශාකයේ ගැහැණු ශාක හා පිරිමි ශාක වෙන වෙනම පවතින බැවින් වගා කිරීමේ දී ගැහැණු හා පිරිමි ශාක අතර අනුපාතය 10 : 1 ක් ලෙස පවත්වා ගත යුතුය. සාර්ථක අස්වැන්නක් සඳහා පරාගනය කෘත්‍රිමව අවශ්‍යය. පරාගනයෙන් දින 12-14 කට පසු ගෙඩි හට ගනී. බිම් සකැසීමේ සිට වගා පාලන කටයුතු කෘෂිකර්ම නිර්දේශයට අනුව කළ යුතුය. නියඟයට ඔරොත්තු දෙන බෝගයක් වන අතර, වගාව තුළ වල් මර්දනය ද අත්‍යවශ්‍ය වේ. මෙම බෝගය සඳහා කෘමි උවදුරු සහ ලෙඩ රෝග අඩු බැවින් පහසුවෙන් නඩත්තු කිරීමෙන් වැඩි අස්වැන්නක් ලබා ගත හැකිය.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

අක්කර කාලක බිම් ප්‍රමාණයක් සඳහා

- හොඳින් ජලවහනය වන කාබනික පස
- ජල පහසුකම්
- පොහොර- කෘෂිකර්ම නිර්දේශ අනුව පොහොර යෙදිය යුතුය
- කෘෂි රසායන ද්‍රව්‍ය- කෘෂිකර්ම නිර්දේශ අනුව පොහොර යෙදිය යුතුය
- ලි කණු සහ ලණු- වැල් වලට ආධාරක ලෙස

3. වෙළඳපොල

පාරිභෝගිකයාගේ වයස, ආදායම, ස්ත්‍රී පුරුෂ භාවය හා සංස්කෘතිය මේ සඳහා බල නොපායි. වෙළඳපොලෙහි නියමිත මිලක් නොමැති අතර කිලෝ එකක් රු. 400.00 සිට 600.00 දක්වා විචලනය වේ. මිල අධික වුවද දුර්ලබ හා පෝෂණ ගුණයෙන් වැඩි බැවින් පාරිභෝගිකයා මිලදී ගැනීමට පෙළඹී ඇත. ගම්බද ප්‍රදේශවල තරමක් පහසුවෙන් සොයා ගත හැකි අතර නගරබදව ඉල්ලුමට සරිලන සැපයුමක් නැත. දේශීය වෙළඳපොලෙහි ද තුඹ කරවිල අලෙවිය සඳහා අවස්ථාව තිබෙන අතර, වර්තමානයේ දී විදේශීය වෙළඳපොල සඳහා ද යොමු විය හැකිය.

4.ආයෝජනය

අක්කර කාලක භූමි ප්‍රමාණයක් සඳහා ආයෝජනය පහත පරිදිය. මෙහිදී තමා සතු ඉඩමක් යොදා ගන්නා බව උපකල්පනය කරමින් භූමිය සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	- රු. 78,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාස 03 ක් සඳහා)	- රු. 87,000.00
	මුළු එකතුව	**- රු. 165,000.00**

වගාව ආරම්භ කිරීම සඳහා රු. 165,000.00 ක් පමණ අවශ්‍ය වේ

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

අංකය	අයිතමය	වටිනාකම රු.
1	බිම් සැකසීම	15,000.00
2	වතුර බට	20,000.00
3	දියර ඉසින යන්ත්‍ර	12,000.00
4	වෙනත් උපකරණ	10,000.00
5	පැළ සඳහා	15,000.00
6	ලී කණු සහ ලණු	6,000.00
	එකතුව	78,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසය 03 ක් සඳහා)

අංකය	අයිතමය	වටිනාකම රු.
1	පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය	9,000.00
2	අමුද්‍රව්‍ය ගෙන ඒම	1,500.00
3	ශ්‍රමය	72,000.00
4	විදුලිය, ජලය සහ වෙනත්	4,500.00
	එකතුව	87,000.00

5. මාසික ශුද්ධ ලාභය

(අස්වැන්න ලබා ගැනීම සඳහා මාස 3 ක් ගත වන අතර, වසරක් පුරා ආදායම් ලබා ගත හැකිය.) මසකට අස්වැන්න කිලෝග්‍රෑම් 150 ක් බවත් කිලෝග්‍රෑම් 01 ක මිල රු. 400.00 ක් බවත් ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව,

මාසික විකුණුම් ආදායම = කිලෝග්‍රෑම් 150 × රු. 400.00 = රු. 60,000.00

(වසරක විකුණුම් ආදායම ගණනය කිරීමේදී මාස 03 කට පසු අස්වනු ලැබෙන බව ද, අස්වනු නෙලීම ආරම්භ කර මාස 06 ක් මසකට කිලෝග්‍රෑම් 150 බැගින්ද, ඉතිරි මාස 03 මසකට කිලෝග්‍රෑම් 120 බැගින්ද අස්වනු ලැබෙන ආකාරයට ගණනය කර ඇත.)

වසරක විකුණුම් ආදායම = මුල් මාස 06, කිලෝග්‍රෑම් 150×මාස 06 × රු.400.00 = රු.360,000.00
ඉතිරි මාස 03, කිලෝග්‍රෑම් 120×මාස 03 × රු.400.00 = රු.144,000.00

ඒ අනුව
වසරක විකුණුම් ආදායම = රු. 504,000.00

වසරක පිරිවැය = වසරක සෘජු පිරිවැය + වසරක වක්‍ර පිරිවැය
වසරක සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම්
වසරක සෘජු පිරිවැය = රු. 18,000.00 + රු. 162,000.00 + රු. 19,500.00
වසරක සෘජු පිරිවැය = රු. 199,500.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම වේ. (නඩත්තු වියදම් හා ක්ෂය) මාසයක් සඳහා රු. 2,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ශුද්ධ ලාභය	= විකුණුම් ආදායම - මුළු පිරිවැය
	= රු. 504,000.00 - (රු.199,500.00 + රු. 18,000.00)
	= රු. 504,000.00 - රු. 217,500.00
	= රු. 286,500.00
ශුද්ධ ලාභය	= රු. 286,500.00

ඒ අනුව මාසික සාමාන්‍ය ශුද්ධ ලාභය = රු. 286,500.00/09 = රු.31,800.00

(අස්වනු ලැබෙනුයේ මාස 03 කට පසුව නිසා සාමාන්‍ය ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා මාස 09 න් බෙදා ඇත.)

ව්‍යාපාරිකයා විසින්ම ව්‍යාපාරයේ කටයුතු සිදුකරයි නම් ඔහුට අස්වැන්න නෙලීම ආරම්භ කිරීමෙන් පසු මාසයකට රු. 10,000.00 ක වැටුපක් වෙන්කර ගත හැකි අතර, රු. 31,800.00 ශුද්ධ ලාභයක් උපයාගත හැකිය.

ගම්මිරිස් වගාව

1. හැඳින්වීම

කුළුබඩුවල රජු යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන ගම්මිරිස් ඉතාමත් ඉහළ වාණිජමය වටිනාකමක් ඇති භෝගයක් වේ. එම නිසා එක් යුගයක ගම්මිරිස් භෝගය 'කළු රත්තරන්' ලෙස ද හඳුන්වනු ලැබීය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් ගම්මිරිස් වගා කරනු ලබන්නේ පහතරට හා මැදරට තෙත් සහ අතරමැදි කෘෂි දේශගුණික කලාපවලය. ඒ අනුව කුරුණෑගල, මාතලේ, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුර, මොණරාගල යන දිස්ත්‍රික්ක ගම්මිරිස් වගා කරන ප්‍රධාන දිස්ත්‍රික්ක ලෙසින් දැක්විය හැකිය. ගම්මිරිස් ප්‍රභේදයන් රාශියක් පවතින අතර අනුව සුදුසු ගම්මිරිස් ප්‍රභේදය තෝරාගැනීම ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට හේතු වනු ඇත. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෑතක දී ඩිංගිරාල, කොහු කුඹුරේරාල සහ බූටෑවේරාල නමින් නව දෙමුහුන් වර්ග තුනක් හඳුන්වා දී ඇත.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

- ගම්මිරිස් පැළ
- කොම්පෝස්ට් පොහොර
- ඩොලමයිට්

3. වෙළඳපොල

කුළුබඩු වර්ගයක් ලෙසින් සහ ඖෂධයක් ලෙසින් ගම්මිරිස් සදහා දේශීය විදේශීය වෙළඳපොල තුළ ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. ලෝකයේ වාර්ෂික ගම්මිරිස් ඉල්ලුම මෙට්‍රික් ටොන් 250,000 - 300,000 ක් පමණ වන අතර එම ප්‍රමාණය ලෝක කුළුබඩු නිෂ්පාදනයෙන් 1/3ක් පමණ වේ. ශ්‍රී ලංකාව ලෝක ගම්මිරිස් නිෂ්පාදනයෙන් 6% පමණ ප්‍රමාණයක් වෙළඳපොළට එක් කළ ද ලෝකයේ ගම්මිරිස් වල ගුණාත්මක බව මනින සාධක මත ගුණාත්මක බවින් ඉහළම ගම්මිරිස් නිෂ්පාදනය සිදුවන්නේ ශ්‍රී ලංකාවේ බව පිළිගෙන ඇත.

4. ආයෝජනය

පර්චස් 25ක බිමක මිනිස් ශ්‍රමය උපයෝගී කරගනු ලබන ගම්මිරිස් වගාවක් සඳහා අවම වශයෙන් ආයෝජනය කළ යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	=	රු. 20,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (වසරක් සඳහා)	=	රු. 15,000.00
	මුළු එකතුව	=	**රු. 35,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

මෙහිදී ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය අයිතම පමණක් ඇතුළත් කර ඇති අතර පර්චස් 25ක බිම් කොටස සඳහා වන ඉඩමේ පිරිවැය අන්තර්ගත කර නැතග මිනිස් ශ්‍රමය යොදා ගනිමින් වගා බිම් සකස් කරගැනීම් සහ අනෙක් උපකරණ මිලදී ගැනීම සඳහා වියදම ඇස්තමේන්තු කර ඇත.

අංක	විස්තරය	වටිනාකම (රු.)
01	වගා බිමසකස් කර ගැනීම වගා බිම් සැකසීම (දින 3× රු.1000.00)	3,000.00
02	වලවල් සැකසීම, ලකුණු කිරීම් සහ කැපීම (දින 6× රු.1000.00)	6,000.00
03	පොහොර යෙදීම හා වලවල් වැසීම	4,000.00
04	ආධාරක සිටුවීම	2,000.00
05	ගම්මිරිස් පැල (පැ.100× රු.35.00)	3,500.00
06	උපකරණ (උදැල්ල, මල් බාල්දිය)	1,500.00
	එකතුව	20,000.00

4.2 කාරක ප්‍රාග්ධන වියදම

වසර 01ක කාලයක් සඳහා වගාව නඩත්තු කිරීමේ වියදම පහත පරිදි ඇස්තමේන්තු කර ඇත.

අංක	විස්තරය	වටිනාකම (රු.)
01	කාබනික පොහොර යෙදීම මාස 03 කට වරක් (ශ්‍රම වියදම සමඟ)	7,000.00
02	කප්පාදු කිරීම සහ වල් මර්ධනය මාස 03 කට වරක් (දිනකට රු. 1000.00 × දින 04)	4,000.00
03	අස්වැන්න නෙලීමේ ශ්‍රම වියදම	1,000.00
04	වෙනත් වියදම්	2,000.00
	එකතුව	14,000.00

5. ශුද්ධ ලාභය

පැළ සිටවූ වසරේ දී වසරකට එක් වරක් පමණක් අස්වැන්න නෙළීමට හැකිවේ. දෙවන වර්ෂයේ සිට වසරකට දෙවරක් අස්වනු නෙළා ගත හැකිය. වසරකට අස්වැන්න කි.ග්‍රෑ. 1,200 පමණ වන අතර වෙළඳපොල මිල ගණන් උච්ඡාවචනය වන බැවින් වර්තමාන මිල ගණන් සැලකිල්ලට ගෙන ඇත. නිසි නඩත්තුවක් සහිතව පවත්වාගෙන යන ගම්මිරිස් වගාවකින් වසර 25 ක් පමණ අස්වැන්න නෙළා ගත හැකියග එමනිසා වගාවට දරන ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය වසර 4ක දී ලාභයෙන් අඩු කර ඇත.

වාර්ෂික විකුණුම් ආදායම = නෙළාගත හැකි අස්වැන්න × කි.ග්‍රෑ. 01ක වෙළඳපොල තොග මිල
= කි.ග්‍රෑ. 1,200.00 × රු. 250.00
= රු. 300,000.00

වාර්ෂික මුළු පිරිවැය = ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය + විචල්‍ය පිරිවැය
= රු. 5,000.00 + රු.14,000.00
= රු. 19,000.00

වාර්ෂික ශුද්ධ ලාභය	= වාර්ෂික විකුණුම් ආදායම - වාර්ෂික මුළු පිරිවැය
	= රු. 300,000.00 - රු. 19,000.00
	= රු. 281,000.00
මාසික ශුද්ධ ලාභය	= වාර්ෂික ශුද්ධ ලාභය / 12
ආසන්න වශයෙන් මසකට ආදායම	= රු. 23,400.00

ව්‍යාපාරිකයා විසින්ම නිෂ්පාදන කටයුතු සිදු කරයි නම් පළමු වසරේ රු.24,000.00ක වැටුපක් වෙන් කර ගත හැකි අතර ශුද්ධ ලාභය ලෙස පළමු වසරේ රුපියල් 23,400 ක් උපයා ගත හැකිය. දෙවන වර්ෂයේ සිට වසරකට දෙවරක් අස්වනු නෙළා ගත හැකි බැවින් ලාභය දෙගුණ වේ. ගම්මිරිස් වගාවට සුදුසු ප්‍රදේශයක ඉඩමක් පවතී නම්, මෙය දිගුකාලීන ආයෝජන අවස්ථාවක් වන අතර මෙම පුද්ගලයාට ගම්මිරිස් අස්වැන්නේ අගය එකතුකරන ලද නිපැයුම් හෝ වෙනත් ව්‍යාපාර අවස්ථාවකද නිරත විය හැකිය.

වෙනත්

නිසි නඩත්තුවක් සහිතව පවත්වාගෙන යන ගම්මිරිස් වගා බිමක පලිබෝධ හානිය අවම වේ. වගාව සඳහා සුදුසු ඉඩමක් පවතී නම් ඉතා අවම ආයෝජනයකින් ආරම්භ කළ හැකි ව්‍යාපාරික අවස්ථාවක් වේ.

අර්තාපල් වගාව

1. හැඳින්වීම

අර්තාපල් යනු ශ්‍රී ලංකාව තුල ව්‍යංජනයක් ලෙස මෙන්ම විවිධ ආහාර සකස් කිරීම සඳහා මෙන්ම අලංකරණ කටයුතු සඳහා යොදාගනු ලබන අල වර්ගයකි. කඳුකර ප්‍රදේශයන්ට පමණක් සීමා වූ මෙම භෝගය වර්තමානය වනවිට කල්පිටිය, යාපනය වැනි ප්‍රදේශවල පවා ජනප්‍රිය භෝගයක් බවට පත්ව ඇත. උඩරට තෙත් හා අන්තර් කලාපවල යල සහ මහ කන්නවලත් පුත්තලම හා යාපනය වැනි දිස්ත්‍රික්කවල යල කන්නයේදී වගා කරනු ලබන අර්තාපල් භෝගය සඳහා සුදුසුම දේශගුණික කලාප ලෙස සැලකෙන්නේ මුහුදු මට්ටමේ සිට අඩි 1500කට වඩා උසින් යුතු ප්‍රදේශ වේ. එමෙන්ම දහවල් උෂ්ණත්වය 24°c කට වඩා අඩුව පැවතීමත්, රාත්‍රී කාලයේ දහවලට වඩා 10°c කින් පමණ උෂ්ණත්වය අඩුම පැවතීමත් අර්තාපල් එලදාව ඉතා හොඳින් ලබා ගැනීමට සුදුසු තත්ත්වයකි. ශ්‍රී ලංකාව තුල වගා කිරීම සඳහා නිර්දේශ කර ඇති අර්තාපල් ප්‍රභේද ලෙස ඩිසයරි, හිල්ස්ටාර්, රාජා, ලයිරා, ග්‍රැනෝරා, ඉස්නා, සන්වේ, කොන්ඩෝර් යනාදිය හඳුන්වා දිය හැකි අතර මෙම සෑම ප්‍රභේදයක්ම මාස 03-03 1/2 අතර කාලයකදී එක් කන්නයක් අවසන් කරනු ලබයි.

2. අවශ්‍ය අමුද්‍රව්‍ය

අර්තාපල් බීජ -: ගුණාත්මක බවෙන් යුතු බීජ අර්තාපල් සීතා එළියෙන් මිලදී ගැනීමට හැකි අතර, අර්තාපල් බීජ ව්‍යාපාරය කරන ගොවීන්ගෙන්ද මිලට ගත හැක.
අළුහුණු-: සකස් කර ගත් වගා බිම සඳහා අළුහුණු ඉසීම සිදු කරයි.
අල පොහොර/කුකුල් පොහොර-: අර්තාපල් බීජ සිටුවීමට පෙර හා පසුව වගා නඩතක්තුවේ දී යොදයි.
දිලීර නාශක, විටමින් වර්ග හා පණු බෙහෙත්-: මේ සඳහා සුදුසු කෘෂි රසායන වෙළඳපොලෙන් මිලදී ගත හැක. (වගා නඩත්තුවේ දී ඇති වන රෝග සඳහා යෙදිය යුතුය.)
ත්‍රීඩියම් පොහොර-: අර්තාපල් බීජ පැළ වී පස් යොදන විට ත්‍රීඩියම් පොහොර එක් කරයි.

3. වෙළඳපොල

අර්තාපල් භෝගය සඳහා ඉහළ වෙළඳපොළ ඉල්ලුමක් නිර්මාණය වී පවතී. ශ්‍රී ලාංකික පරිභෝජන රටාව තුළ අනිවාර්යය ආහාර වර්ගයක් බවට අර්තාපල් පත්ව ඇත්තේ එහි ඇති ඉහළ පෝෂණ ගුණය නිසාවෙනි. අඩු ආදායම්ලාභී, මැදි ආදායම්ලාභී හා ඉහල ආදායම්ලාභී සෑම පාරිභෝගික කණ්ඩායමක්ම අර්තාපල් මිලදී ගැනීමට යොමුව ඇති නිසා වසර මුළුල්ලේ ම අර්තාපල් භෝගය සඳහා ඒකාකාරී ඉල්ලුමක් නිර්මාණය වී තිබේ. එමෙන්ම සියලුම වෙළඳසැල්වල, සතිපොළවල, එළවළු වෙළඳපොලවල, සුපිරි වෙළෙඳපොලවල හා පදික වේදිකා යන ඕනෑම වෙළඳපොල ස්ථානයන්හි දී අර්තාපල් අලෙවිය සඳහා වෙළඳපොල අවස්ථා නිර්මාණය වී තිබේ. දේශීය නිෂ්පාදකයින් ශ්‍රී ලාංකික පාරිභෝගික ඉල්ලුමට සරිලන ආකාරයේ සැපයුමක් නිර්මාණය නොකිරීම හේතුවෙන් ඇතැම්විට අර්තාපල් ආනයනය කිරීම මඟින් වෙළෙඳපොල තුළ අඛණ්ඩ සැපයීමක් සිදු කිරීමට ද රජය මගින් කටයුතු කරනු ලැබේ. අර්තාපල් සෘජු පරිභෝජනයට අමතරව, Potato Chipps වැනි අගය එකතු කළ නිෂ්පාදන කර්මාන්තය සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වන බැවින් ඉහළ වෙළඳපොල ඉල්ලුමක් ඇති ව්‍යාපාරික අවස්ථාවක් ලෙස සඳහන් කල හැකිය.

4. ආයෝජනය

පර්චස් 80ක භූමි ප්‍රමාණයක් ඇති පුද්ගලයෙකු අර්තාපල් බීජ හොන්ඩර 8ක් (400kg) වගා කිරීම තුළින් අර්තාපල් හොන්ඩර 64 (3200kg) ක අස්වැන්නක් ලබා ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් ආයෝජනය කල යුතු ඇස්තමේන්තුගත මුදල

4.1	මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය	= රු. 49,000.00
4.2	කාරක ප්‍රාග්ධන පිරිවැය (මාසය 03ක් සඳහා)	= රු. 216,000.00
	මුළු එකතුව	= **රු. 265,000.00**

4.1 මූලික ස්ථාවර ප්‍රාග්ධන පිරිවැය

ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලික අයිතම පමණක් අඩංගු කර ඇති අතර, වගාව සඳහා අවශ්‍ය බිම් කොටස සඳහා මුදලක් ඇස්තමේන්තු කර නොමැත.

අංක	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	වටිනාකම (රු.)
01	බෙහෙත් ඉසින යන්ත්‍රය	25,000.00
02	වතුර මෝටරය	15,000.00
03	වතුර බට	6,000.00
04	උදලු, රේක්ක ආදී උපකරණ	3,000.00
	එකතුව	49,000.00

4.2 කාරක ප්‍රාග්ධන පිරිවැය

අංකය	විස්තරය	මාස 03ක් සඳහා වියදම (රු.) (කන්නය)
01	අමුද්‍රව්‍ය සඳහා වියදම	133,000.00
02	ශ්‍රම වියදම	75,000.00
03	වෙනත් වියදම් (ගෙන ඒමේ කුලී/ජලය/විදුලිය)	8,000.00
	එකතුව	216,000.00

මෙහිදී,

අර්තාපල් බීජ සිටුවා මාස 03කින් පමණ අර්තාපල් අස්වැන්න ලබා ගත හැකි අතර කෘෂිකර්මාන්තයේ දී පවසන ආකාරයට අර්තාපල් බීජ හොන්ඩර 01 (50kg) කින් හොන්ඩර 08 (400kg) ක පමණ අස්වැන්නක් ලබාගත හැකි වේ.

මේ නිසා අප වගා කිරීමට සැලසුම් කරන අර්තාපල් බීජ හොන්ඩර 08 (400kg) න් අර්තාපල් හොන්ඩර 64 (3200kg) ක අස්වැන්නක් ලබා ගත හැකි බවට උපකල්පනය කර ඇත.

ඉහත සියලු අගයන් පවතින කාලගුණික, දේශගුණික විපර්යාසයන් මත ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වීමට හැකියාව ඇත.

05. මාසික ශුද්ධ ලාභය

උපකල්පන

මෙම අර්තාපල් වගා කරන ව්‍යාපාරයෙහි දිනපතා සේවයේ යෙදීම අත්‍යවශ්‍ය නොවන අතර වගාව ආරම්භයේ දී හා නඩත්තු කටයුතු අවශ්‍ය දිනයන්හි එම කටයුතුවල නිරත වීම ප්‍රමාණවත් වේ.

- කෘෂිකාර්මික නිෂ්පාදනයක් වන අර්තාපල් යනු වෙළඳපොලෙහි මිල උච්චාවචනයන්ට ලක් වන භෝගයක් වන අතර 1kg ක මිල රු. 70.00 පමණ සිට රු. 250.00 පමණ දක්වා මිලයන් අතර කාලෙන් කාලෙට වෙනස් වේ.
- මෙම තත්ත්වයන් අනුව මෙහිදී සාමාන්‍ය අර්තාපල් 1kg ක මිල රු. 120.00 ලෙස උපකල්පනය කරනු ලැබේ.

කන්නයේ විකුණුම් ආදායම = අර්තාපල් 3200නට × රු. 120.00
= රු. 384,000.00

මාසික මුළු පිරිවැය = සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය

සෘජු පිරිවැය

- කන්නය අවසානයේ සෘජු පිරිවැය = සෘජු අමුද්‍රව්‍ය වියදම + සෘජු ශ්‍රම වියදම + සෘජු වෙනත් වියදම
= රු. 133,000.00 + රු. 75,000.00 + රු. 8,00.000
= රු. 216,000.00

වක්‍ර පිරිවැය

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ සෘජුව ගණනය කළ නොහැකි වියදම් වේ. (උදා- ප්‍රවාහන, අලෙවි ආදී අනෙකුත් වියදම්) එය කන්නය සඳහා රු. 18,000.00 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

කන්නය අවසානයේ ශුද්ධ ලාභය = කන්නයේ විකුණුම් ආදායම - කන්නයේ මුළු පිරිවැය
= රු. 384,000.00 - (රු. 216,000.00 + රු. 18,000.00)
= රු. 384,000.00 - රු. 234,000.00
= රු. 150,000.00

එම නිසා, මාසික ශුද්ධ ලාභය = රු. 150,000.00 / මාස 03
= රු. 50,000.00

ව්‍යාපාරිකයා විසින්ම ව්‍යාපාර කටයුතු වල නිරත වීම සිදුකරයි නම්, ඔහුට මසකට රු. 50,000.00 ක ශුද්ධ ලාභයක් සහ වැටුප ලෙස රු. 25,000.00 ක ආදායමක් උපයාගත හැකිය.

අර්තාපල් වගාවේ දී සාමාන්‍යයෙන් පළමු කන්නයේ දී ඉහළ ලාභයක් ලබා ගත නොහැකි වුවත් ඊළඟ කන්නවලදී පෙර කන්නයේ අර්තාපල් වලින් කොටසක් බීජ සඳහා තබා ගනිමින් අර්තාපල් බීජ පිටතින් ලබා ගැනීමට යන වියදම ආවරණය කර ගැනීම නිසා වැඩි ලාභයක් උපයා ගැනීමේ අවස්ථාව උදා වේ.

සහාය සපයන ආයතන

01 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ලිපිනය: 80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල
දුරකථන අංකය: 011-2034300
ඊ මේල්: info@agrimin.gov.lk
වෙබ් ලිපිනය: www.doa.gov.lk

සපයන සේවාවන්:

- කෘෂි උපදේශන සේවාවන් ලබාදීම
- කෘෂි තාක්ෂණික තොරතුරු ව්‍යාප්ත කිරීම
- කෘෂි SMS සේවාව මගින් කෘෂි තොරතුරු පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබාදීමට කටයුතු කිරීම
- වී මිල දී ගැනීමේ හා වෙළඳපල වැඩසටහන් කාර්යක්ෂම කළමනාකරණය
- තෝරාගත් භෝගවල නිෂ්පාදනය ඉහළ නැංවීම
- කඩිනම් ආහාර නිෂ්පාදන වැඩසටහන කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම

02 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ලිපිනය: අංක 1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, ගැටඹේ, පේරාදෙණිය.
දුරකථන අංකය: 0812 388651, 081 2386018, 081 2386019
ඊ මේල්: helpdesk@dea.gov.lk
වෙබ් ලිපිනය: http://www.dea.gov.lk

සපයන සේවාවන්:

- අපනයන කෘෂි භෝග අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම සහ ඒවාට මූල්‍ය ආධාර ලබා දීම
- පාර්ශවකරුවන්ට තාක්ෂණික උපදෙස් ලබා දීම සහ මග පෙන්වීම
- සේවාස්ථ පුහුණු වැඩසටහන් දියත් කිරීම
- කුළුබඩු නිෂ්පාදකයින් සහ ගැනුම්කරුවන් සම්බන්ධ කෙරෙන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම
- ප්‍රමිතිකරණ ක්‍රියාවලි ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම
- කුළුබඩු වෙළෙඳාම ආශ්‍රිත නව ව්‍යවසායකයින් සඳහා උපදේශකත්වය සැපයීම
- බහු වාර්ගික, අපනයන කෘෂි බෝග, සංවර්ධනයට හා එම බෝගවල නිෂ්පාදනය, නිෂ්පාදනවල තත්වය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කිරීම

03 සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ලිපිනය: ගැටඹේ, පේරාදෙණිය
දුරකථන අංකය: 081-2388462, 081-2388189, 081-2388337, 081-2388120
වෙබ් ලිපිනය: http://www.daph.gov.lk

සපයන සේවාවන්:

- සත්ත්ව සෞඛ්‍ය, සත්ව අභිජනන, පශු පර්යේෂණ, මානව සම්පත් සංවර්ධනය, පශු සම්පත් සැලසුම් හා ආර්ථික යන තාක්ෂණික අංශ මේ යටතේ ක්‍රියාත්මක වේ.
- සත්ත්ව අභිජනන ව්‍යාපෘති දියත් කිරීම
- ව්‍යවසායකයින්ට අවශ්‍ය සත්ත්ව තාක්ෂණ විශේෂඥ සේවය සැපයීම
- ස්වයං රැකියා ව්‍යාපෘති දියත් කිරීම

04 ජාතික පසු අස්වනු කලමනාකරණ ආයතනය

ලිපිනය: නො.28, බත්තරමුල්ල පාර, ඇතුල් කෝට්ටේ
දුරකථන අංකය: 0112866846 / 0112887899
ඊ මේල්: service@agrimin.gov.lk / info@agrimin.gov.lk
වෙබ් ලිපිනය: http://www.agrimin.gov.lk

සපයන සේවාවන්:

- එළවළු, පලතුරු, වී බීජ නිෂ්පාදනය කිරීම
- ස්වාරක්ෂක බීජ තොග පවත්වා ගැනීම
- පුහුණු වැඩසටහන් පැවැත්වීම
- වී ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර බෝග, පලතුරු සහ එළවළු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අන්තර් පළාත් ඒකක 06 මගින් ප්‍රධාන ජල සම්පාදන ක්‍රම යටතේ සෘජු ව්‍යාප්ති වැඩසටහන් මෙහෙය වීම
- පළාත් සහ මහවැලි ප්‍රදේශ සමඟ එක්ව සිදු කරන සහයෝගිතා ව්‍යාප්ති වැඩසටහන්
- ව්‍යාප්ති නිලධාරීන්, ගොවීන්, ව්‍යවසායකයන් සහ වෙනත් පුද්ගලයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- හඬු මට්ටමෙන් යුත් කෘෂිකාර්මික නිෂ්පාදනය සහ තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා මෙහෙය වීම
- තරුණ ගොවි සමාජ කටයුතු මෙහෙය වීම
- මී මැසි සංවර්ධන කටයුතු මෙහෙය වීම
- කෘෂි ව්‍යාපාර උපදේශන, ක්ෂුද්‍ර ජල සම්පාදන සහ ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ වැඩසටහන් මෙහෙය වීම
- කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් මෙහෙය වීම
- හෙළ බොජුන් අලෙවි සැල් පිහිටුවමින් සහ ඒවා පවත්වාගෙන යමින් මහජනතාව අතර දේශීය ආහාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම
- උද්‍යාන බෝග සංවර්ධන සහ පුහුණු වැඩසටහන් දියත් කිරීම

05 පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

ලිපිනය: නො.80/5, බිම් මහල, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
දුරකථන අංකය: 0112883779 / 0112883789 / 0112883791
ඊ මේල්: secretary@livestock.gov.lk
වෙබ් ලිපිනය: https://livestock.gov.lk

සපයන සේවාවන්:

- ග්‍රාමීය ජනතාව ආර්ථිකව නඟා සිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලාධාර සම්පාදනය කිරීම
- ග්‍රාමීය යටිතල පහසුකම් හා කුඩා ව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයකින් සමන්විත සත්ත්ව ගහනයක් ඇතිකරලීම සහ ආහාරයන්හි සෞඛ්‍යාරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම හා සහය ලබා දීම
- නිරෝගිමත් සත්ත්ව ගහනයක් ඇතිකරලීම සඳහා ගුණාත්මක සත්ව ආහාර ප්‍රචලිත කිරීම සහ සත්ත්ව රෝග වළක්වාලන හා මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම
- පශු සම්පත් මගින් ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් ලබා ගැනීම සඳහා ඉහළ ගුණත්වයකින් යුත් සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම
- දේශීය සත්ත්ව ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම
- පශු සම්පත් නිෂ්පාදන අලෙවිකරණය, සැකසීම සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම සඳහා විධිමත් අලෙවි ජාලයන් ඇති කිරීම සඳහා අදාළ පාර්ශවයන් දිරි ගැන්වීම
- දේශීය කිරි ගොවීන් ශක්තිමත් කරමින් දියර කිරි නිෂ්පාදනයේ ඉලක්කගත වර්ධනය සාක්ෂාත් කර ගැනීමට දිරි දීම
- පූර්ණ බලැති ජාතික කෘෂිකර්ම අලෙවිකරණ අධිකාරිය ස්ථාපිත කිරීම තුළින් ප්‍රාදේශීය හා ගම් මට්ටමින් කෘෂි

නිෂ්පාදන මිලට ගැනීම හා ගබඩා කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණය සම්බන්ධීකරණය කිරීම

- තොග වෙළෙඳුන් හා පාරිභෝගිකයින්, කෘෂි නිෂ්පාදකයින් සමඟ සම්බන්ධ කිරීම තුළින් දේශීය කෘෂි නිෂ්පාදන මිල තිරසාර මට්ටමක පවත්වා ගැනීමේ අරමුණින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම

06 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ලිපිනය: නව ලේකම් කාර්යාලය, මාළිගාවත්ත පාර, කොළඹ 10
දුරකථන අංකය: 0112 320 140
වෙබ් ලිපිනය: https://www.fisheriesdept.gov.lk

සපයන සේවාවන්:

- ප්‍රජා සංවර්ධන වැඩසටහන් හරහා ධීවර ජනතාවගේ සමාජ ආර්ථික අංශයන් නඟා සිටුවීම
- ජලජීවී වගාව සහ මිරිදිය නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර ප්‍රජාවට අවශ්‍ය උපකරණ ලබාදීම සඳහා කටයුතු කිරීම
- පරිසර හිතකාමී ධීවර ආම්පන්න හා ක්‍රම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම
- ධීවර කාර්මිකයින්ට අස්වනු නෙලීමේ නවීන තාක්ෂණය ලබාදීම

07 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

ලිපිනය: නො. 55/75, වොක්ස් හෝල් පටුමග, කොළඹ 02
දුරකථන අංකය: 011 2395561
ඊ මේල්: rubbdev@gmail.com
වෙබ් ලිපිනය: www.rubberdev.gov.lk

සපයන සේවාවන්:

- ප්‍රාදේශීය කාර්යාල මගින් රබර් ඉඩම් සහ එහි හිමිකරුවන් ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබාදීම
- අවශ්‍ය පොහොර, පැල හා සහනාධාර මුදල් ලබාදීම
- රබර් නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තශාලා නවීකරණය කිරීමට සහනාධාර ලබාදීම
- රබර් වගාකරුවන්ට උපදේශක සේවාවන් සැපයීම සහ ඔවුන්ට අවශ්‍ය කෘෂි යෙදවුම් ප්‍රවාහනය කරදීම
- රබර් වෙළඳාම, රබර් ආශ්‍රිත නිෂ්පාදන හා රබර් අපනයන සඳහා බලපත්‍ර ලබාදීම
- වෙළඳපොල පිලිබඳව කුඩා රබර් හිමියන් දැනුවත් කිරීම

08 විදාතා සම්පත් මධ්‍යස්ථානය

ලිපිනය: ලෝක වෙළඳ මධ්‍යස්ථානය, 7 වන මහල, බටහිර කුළුණ, කොළඹ 01
දුරකථන අංකය: 071 6858161
ඊ මේල්: info@mostr.gov.lk

සපයන සේවාවන්:

- ග්‍රාමීය ව්‍යවසායකයින්ට අවශ්‍ය නවීන තාක්ෂණික පුහුණු වැඩසටහන් කිරීම
- නවෝත්පාදන සඳහා අවශ්‍ය දැනුම ලබාදීම
- නවෝත්පාදන සිදුකරන්නන් සඳහා පැවතිය යුතු ප්‍රමිතීන් සොයා බැලීම
- පාරම්පරික සහ පාරම්පරික නොවන ග්‍රාමීය කර්මාන්තකරුවන්ට වෙළඳපොල ජයගැනීම සඳහා අවස්ථා ලබාදීම
- කර්මාන්තකරුවන්ට තම කර්මාන්තය සිදු කරන ස්ථානය වැඩිදියුණු කරගැනීමට හා ප්‍රමිති සහතික ලබාදීමට උපකාර කිරීම
- විද්‍යා නව්‍යකරණ සහ තාක්ෂණවේද ජනප්‍රියකරණය කිරීමට කටයුතු කිරීම

09 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ලිපිනය: 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල
දුරකථන අංකය: 011-2871672 / 011-2872202 / 0012-873802 / 0112-873801
ඊ මේල්: mseadmin@sltnet.lk
වෙබ් ලිපිනය: http://stateminsamurdhi.gov.lk

සපයන සේවාවන්:

- අඩු ආදායම්ලාභීන් ස්වයං රැකියා ගැන්වීම සඳහා කටයුතු කිරීම
- ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම
- ප්‍රාදේශීය මට්ටමෙන් සිටින සමෘද්ධිලාභීන් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට අඩුපොලී යටතේ ණය සහනාධාර ලබාදීම
- ප්‍රජාමුල සංවිධාන වැඩසටහන
- තොරතුරු තාක්ෂණ වැඩසටහන
- පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන
- මාධ්‍ය වැඩසටහන

- ප්‍රජාමූල බැංකු වැඩසටහන
- සමාජ සුභසාධන වැඩසටහන
- සමාජ ආරක්ෂණ වැඩසටහන
- අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම

10 පර්යේෂණ හා නව නිපැයුම් අංශය

ලිපිනය: නො. 3 වන මහළ, සෙත්සිරිපාය පළමු අදියර, බත්තරමුල්ල
දුරකථන අංකය: 011-2392149, 2392150, 2327554
ඊ මේල්: info@mostr.gov.lk

සපයන සේවාවන්:

- ප්‍රමිති සහ ප්‍රතීතනය
- තාක්ෂණ පැවරුම් සහ වාණිජ්‍යකරණය
- ඉල්ලුම අනුව මෙහෙයවනු ලබන පර්යේෂණ ව්‍යාප්ත කිරීම සඳහා ක්‍රියාමාර්ග යොදා ගැනීම
- විද්‍යා නව්‍යකරණ සහ තාක්ෂණවේද ජනප්‍රියකරණය
- වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අන්තර්ජාතික වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල සිදුවන පර්යේෂණයන්හි නව සොයා ගැනීම්වලට අනුගතවන පරිදි දේශීය පර්යේෂණ සොයාගැනීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- පර්යේෂණ හා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම තුළින් පර්යේෂණ සැලසුම් කිරීම හා මෙහෙයවීම
- තොරතුරු, නැනෝ හා ජෛව තාක්ෂණයද ඇතුලුව නව පර්යේෂණ හා සොයාගැනීම්වලින් ලබාගන්නා ප්‍රතිඵල හා දැනුම ව්‍යාපාරික ප්‍රජාවද ඇතුලුව අදාළ පාර්ශවයන් වෙත ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- ප්‍රමිතීන් පැනවීම සම්බන්ධ කටයුතු සිදු කිරීම
- වෙනත් අමාත්‍යාංශ විෂය පථය යටතේ ගැනෙන පර්යේෂණ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ සඳහා තාක්ෂණික සහාය ලබාදීම
- නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

11 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

ලිපිනය: නො. 73/1, ගාලු පාර, කොළඹ 03
දුරකථන අංකය: 011-2392149, 2392150, 2327554
ඊ මේල්: secretarymid@gmail.com
වෙබ් ලිපිනය: www.industry.gov.lk

සපයන සේවාවන්:

- වෙළඳ සහ තීරුබදු පිළිබඳ කාර්යය
- කර්මාන්ත හා පාරිසරික කටයුතු
- කර්මාන්ත ලියාපදිංචිය
- උපදේශන සභාවේ ක්‍රියාකාරීත්වය
- කර්මාන්ත සඳහා සහායක වැඩසටහන් පැවැත්වීම
- ඵලදායිතාව වර්ධනය
- පර්යේෂණ සහ සංවර්ධනය

12 කාර්මික තාක්ෂණ ආයතනය

ලිපිනය: නො.363, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
දුරකථන අංකය: 0112883779 / 0112883789 / 0112883791
ඊ මේල්: info@lankainformation.lk
වෙබ් ලිපිනය: www.iti.lk

සපයන සේවාවන්:

- හඬු මගින් පැමිණෙන්නන්හට මෙන්ම කර්මාන්ත අංශයේ නියුතු හා උපාධි මට්ටමේ අධ්‍යාපනයක් අත්පත් කරගැනීමට බලාපොරොත්තු වන්නන් හට උපාධි මට්ටමේ අධ්‍යාපනයක් ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම
- රාජ්‍ය අංශයේ නියෝජිත ආයතන සඳහා මෙන්ම ප්‍රාදේශීය වශයෙන් අවශ්‍ය පුහුණු ලබාදීම
- පුද්ගල අවශ්‍යතාවය මත වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා ලබා දීම
- විවිධ ආහාර වර්ග සකස් කිරීම ඇතුළු නව නිපැයුම් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම හා නවීන උපක්‍රම හඳුන්වා දීම

13 කාර්මික සංවර්ධන මණ්ඩලය

ලිපිනය: 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව
දුරකථන අංකය: 011-2605323, 2605326-7, 2605394, 2624846-7
ඊ මේල්: info@idb.gov.lk
වෙබ් ලිපිනය: http://www.idb.gov.lk

සපයන සේවාවන්:

- ව්‍යාපාරික අවස්ථාව හඳුනාගැනීම, හඳුනාගත් අවස්ථාව මත පදනම්ව ව්‍යාපාරය ආරම්භ කිරීම සහ එම ව්‍යාපාරය මෙහෙයවීම සහ පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම
- සේවායෝජනීයත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම
- අපනයන අභිනත කර්මාන්තකරණය - වෙළඳ, ආර්ථික, අපනයන ආදියෙන් අනතුරුව ව්‍යාපාරික ඵලදායිතාව උපරිම තත්ත්වයට පත් කිරීම සඳහා තාක්ෂණය භාවිතා කිරීමට ව්‍යවසායකයින් පෙළඹවීම
- අගය එකතුකළ නිෂ්පාදන සමගින් ලාභ හා තෘප්තිය ඉහළ නැංවීමට කටයුතු කිරීම
- ව්‍යවසායකයින්ගේ අවශ්‍යතාවය මත අදාල කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික වැඩසටහන්, තොරතුරු තාක්ෂණ වැඩමුළු, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම
- කර්මාන්ත තොරතුරු හා උපදේශන සේවා සැපයීම
- ව්‍යවසායකත්ව සංවර්ධන සේවා සැපයීම සහ කර්මාන්තකරුවන්ට සංවර්ධිත බිම් කොටස් ලබාදීම
- ව්‍යාප්ති සේවා සැපයීම
- ඉංජිනේරු සේවා සැපයීම
- වෙළඳ ප්‍රවර්ධන සේවා සහ අබලි අමුද්‍රව්‍ය සැපයීම

14 ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ලිපිනය: නො. 42, නවම් මාවත, කොළඹ 02
දුරකථන අංකය: 0112300705 / 0112300707
ඊ මේල්: edb@edb.gov.lk
වෙබ් ලිපිනය: https://www.srilankabusiness.com/si/edb

සපයන සේවාවන්:

- ශ්‍රී ලාංකික සමාගම්වලට ජාත්‍යන්තර ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම සඳහා අවස්ථාවන් සහ සහාය ලබා දීම
- ශ්‍රී ලාංකාවේ අපනයන වෙළඳාම සහ රැකියා අපේක්ෂා ඉහළ නැංවීමට කටයුතු කිරීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා උපදේශන සේවා ලබා දීමට කටයුතු කිරීම
- අපනයනකරුවන් සඳහා නිර්මාණය කර ඇති අධ්‍යාපනික සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම
- ශ්‍රී ලාංකේය හා ලෝක වෙළඳපොළේ ඇති විවිධ භාණ්ඩ හා සේවාවන් පිළිබඳ මණ්ඩලය සතුව පවතින දැනුම ව්‍යවසායකයින් වෙත ලබාදීම
- අපනයනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා අපනයන සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳව රජයට උපදෙස් ලබා දීම
- අපනයන ක්ෂේත්‍රයේ කාර්ය සාධනය නියාමනය කිරීම
- ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය කිරීමට නිෂ්පාදන, නිර්මාණ, වෙළඳපොල සහ වෙනත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම
- අපනයන සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය ලෙස අපනයනයට සම්බන්ධ සියලු පාර්ශ්වකරුවන් සමග එක්ව අපනයන සංවර්ධන ක්‍රියාකාරකම් වලට පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම
- අපනයන ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම විෂයන් පිළිබඳව උපදේශන සේවා සහ තොරතුරු සැපයීම

15 ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

ලිපිනය: කාර්මික ජනපදය, රජ මාවත, ජා ඇල, ඒකල
දුරකථන අංකය: 011-2236284 / 011-2236384 / 011-2234267
ඊ මේල්: techno@nerdc.lk
වෙබ් ලිපිනය: http://nerdc.lk

සපයන සේවාවන්:

- නව සොයාගැනීම් හා නිර්මාණ කුසලතාවයන්ට ධෛර්යය දීම
- නව නිර්මාණ සංවර්ධනය කිරීම සඳහා ආධාර දීම
- දේශීය තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධි විධාන සැලැස්වීම
- රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැලැස්වීම
- උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත්වලින් එනම් ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත්වලින් උපරිම උපයෝජනය අත්කර ගැනීමට අනුබල දීම

- කාර්මික වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිත කරන්නන් විසින් ඉල්ලුම්කරනු ලැබූවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛණ්ඩ උපදේශක සේවාවන් සැපයීම
- මෙරට ඉංජිනේරු සහ කාර්මික සැලසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම
- ජනතාව දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම

16 තල් සංවර්ධන මණ්ඩලය

ලිපිනය: අංක 41, ඩබ්ලිව්.ඒ.සිල්වා මාවත, කොළඹ 06
දුරකථන අංකය: 021 222 2034
ඊ මේල්: slpdbho@yahoo.com
වෙබ් ලිපිනය: http://pdb.gov.lk

සපයන සේවාවන්:

- තල් ආශ්‍රිත සංවර්ධනය සහ ප්‍රජාව නගා සිටුවීම සඳහා මනා සංවිධානමය පදනමක් සැපයීම
- ශ්‍රී ලංකාවේ තල් ආශ්‍රිත කර්මාන්තයේ ක්ෂුද්‍ර ව්‍යාපාර, අතරමැදි කර්මාන්ත හා අධිතාක්ෂණ කර්මාන්ත මට්ටම්වල තිරසාර සංවර්ධනය සඳහා මනා විද්‍යාත්මක පදනමක් සැපයීමට කටයුතු කිරීම
- අධි තාක්ෂණ සංවර්ධනය වෙත මග පාදමින්, මූලික උපායමාර්ගික හා ව්‍යවහාරික පර්යේෂණ හරහා තල් සම්පත් සඳහා උචිත භෝග සංරක්ෂණ, පිරිසැකසුම් හා නිෂ්පාදන සංවර්ධන තාක්ෂණවේදයන් සංවර්ධනය කිරීම
- සමෝධානිත සංවර්ධන ප්‍රයත්නයන් දායාද කරනු පිණිස දියුණු තල් ආශ්‍රිත භෝග හා පශු සම්පත් නිෂ්පාදන පද්ධති හා ක්‍රම සංවර්ධනය කිරීම
- තල් සංවර්ධන මණ්ඩලය විසින් සංවර්ධනය කරන ලද, යැපෙන්නන්ට හා කර්මාන්තකරුවන්ට උචිත තාක්ෂණවේදයන් සඵලදායී ලෙස ලබා දීම
- තල් ජාන සම්පත් සඳහා ජාතික සුරක්ෂිතාගාරයක් ලෙස සේවය සැලසීම සහ දියුණු රෝපණ ද්‍රව්‍ය නිපදවීම
- ප්‍රායෝගික ව්‍යවහාරයන් සහිත ජනප්‍රිය අනුවර්තනද සමගින් තල් පිළිබඳ තාක්ෂණික තොරතුරු රැස් කිරීම හා ප්‍රචලිත කිරීම
- නිෂ්පාදන පද්ධති කළමනාකරණය කිරීම පිළිබඳ විවිධ විකල්ප තේරීම් බිහි කළ හැකි වන පරිද්දෙන් තල් ආශ්‍රිත ආයතනික සංවර්ධනය සහ උපකාර ප්‍රශස්තතම තත්ත්වයට ගෙන ඒම

17 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ලිපිනය: නො 561,. ඇල්විටිගල මාවත,. නාරාහේන්පිට
දුරකථන අංකය: 0772 624 242 / 0112 369 792
ඊ මේල්: chairman.neda@gov.lk
වෙබ් ලිපිනය: https://www.neda.gov.lk

සපයන සේවාවන්:

- ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා තාක්ෂණික සහාය හා නිෂ්පාදන සංවර්ධනයට අවශ්‍ය සහාය ලබා දීම
- ආහාර ඇසුරුම්කරණය හා නිෂ්පාදනය, භෞතික ඉඩ අවකාශය, ආහාර සැකසුම් සඳහා තාක්ෂණික සහාය, ව්‍යාපාර කළමනාකරණ සේවා සහ මූල්‍ය සම්බන්ධතා සඳහා සම්පූර්ණ විසඳුමක් වශයෙන් කුඩා ව්‍යාපාර සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
- ව්‍යවසායකත්ව සංවර්ධනය හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දැනුම ලබාදීමේ වැඩමුළු සංවිධානය කිරීම
- කලාපීය ආර්ථික සංවර්ධන වැඩසටහන මගින් දේශීය පෞද්ගලික හා රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් අතර, දිරිගැන්වීම්, අවස්ථා සහ හවුල්කාරිත්වයන් ඇති කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- වෙළඳපොළ තොරතුරු බෙදාහැරීමට සහ වෙළඳපොළ සබඳතා ගොඩනැගීමට කටයුතු කිරීම සහ අවශ්‍යතාවන්ට අනුව හඳුනාගත් වෙළඳපොළවල් සමග සබඳතා ගොඩනගා දීමට කටයුතු කිරීම
- ව්‍යවසායකත්වය, අලෙවිකරණය, තාක්ෂණික හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- මූල්‍යාධාර සැපයීම සහ වෙනත් ව්‍යවසාය සංවර්ධන සේවා සහ පසු විපරම් සේවා සිදු කිරීම
- ගැණුම්කරුවන්ගේ අවශ්‍යතා සහ නිෂ්පාදන, බහුවිධ කළමනාකරණ, අලෙවිකරණ, ඇසුරුම්කරණ, තාක්ෂණය, තත්ත්ව සහතිකය සහ මූල්‍ය ප්‍රවේශය වැනි දෑ අතර පරතරයක් ඇති වටෙකදී ඔවුන් නිෂ්පාදකයින් හා සම්බන්ධ කිරීමට හා ගැණුම්කරුගේ අවශ්‍යතා අනුව නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු කිරීම

18.කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය - තරුණ හා ක්‍රීඩා අමාත්‍යංශය

ලිපිනය - අංක 420, බෞද්ධාලෝක මාවත, කොළඹ - 07
දුරකථන අංකය- 0112669240/0112662002
වෙබ් ලිපිනය - www.sed.gov.lk

සපයන සේවාවන්-

තරුණ හා ක්‍රීඩා අමාතයංශය යටතේ ක්‍රියාත්මක වන කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙතින් ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්නා ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා පහත සේවාවන් නොමිලයේ සපයනු ලැබේ. මෙම සේවාවන් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිළධාරීන් හරහා ලබා ගත හැකිය.

- වෙළඳපොල ඉල්ලුමක් ඇති ව්‍යාපාරික අවස්ථා හඳුන්වා දීම.
- ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාදීම.
- ව්‍යාපාර ලියාපදිංචිය සහ බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය සහය සැපයීම.
- භාණ්ඩයේ ලේබලය , ඇසුරුම හා බාර්කෝඩ් ලබා ගැනීම සඳහා නිසි ආයතන වෙත යොමු කිරීම.
- භාණ්ඩවල ගුණාත්වය වර්ධනය කර ගැනීමට අවශ්‍ය නිසි තාක්ෂණය ලබා ගැනීම සඳහා යොමු කිරීම.
- ව්‍යාපාර සඳහා අවශ්‍ය වන ණය පහසුකම් ලබා ගැනීමට මූල්‍ය ආයතන වෙත යොමු කිරීම.
- ව්‍යාපාරය ලාභදායී ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබාදීම.
- ව්‍යාපාරය දියුණු කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
- ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය අලෙවිපොල හා ප්‍රදර්ශන සඳහා යොමු කිරීම.
- ගුණාත්මක නිපැයුම් සඳහා ගැණුම්කාර ආයතන සම්බනධීකරණය

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ දිස්ත්‍රික් කාර්යාල

කොළඹ	- 011 236 9764	අනුරාධපුරය	- 025 222 1909
ගම්පහ	- 033 222 2284	පොළොන්නරුව	- 027 222 4716
කළුතර	- 034 222 9792	බදුල්ල	- 055 223 1167
ගාල්ල	- 091 224 2308	මොණරාගල	- 055 227 6808
මාතර	- 041 222 7950	අම්පාර	- 063 222 2259
හම්බන්තොට	- 047 225 6128	මඩකලපුව	- 065 205 7309
මහනුවර	- 081 222 9181	ත්‍රිකුණාමලය	- 026 205 0930
මාතලේ	- 066 223 2375	යාපනය	- 021 221 3861
නුවර එළිය	- 052 223 4741	මුලතිව්	- 021 229 1327
කුරුණෑගල	- 037 222 6755	වව්නියාව	- 024 222 8037
පුත්තලම	- 032 226 6696	මන්නාරම	- 023 222 3475
රත්නපුරය	- 045 223 0703	කිලිනොච්චි	- 021 228 4037
කෑගල්ල	- 035 223 0812		

දිවියට
සවිය